# 5

# විදේශීය අංශයේ ප්‍රවණතා සහ ප්‍රතිපත්ති

## 5.1 සමස්ත නිරීක්ෂණ

2019 වසරේ දී දේශීය ආර්ථිකයේ පැවති අවදානම් සහගත තත්ත්වයන් ඉහළ ගොස් තිබිය දී වුව ද, ශ්‍රී ලංකාවේ විදේශීය අංශය ශක්තිමත්ව පැවතුණි. වෙළඳ හිඟය සැලකිය යුතු ලෙස අඩු වීම සහ සේවා ගිණුම වෙත වූ ඉහළ ලැබීම් හේතුවෙන් 2019 වසරේ පළමු කාර්තුවේ දී ජංගම ගිණුමේ අතිරික්තයක් වාර්තා විය. කෙසේ වුවත්, විශේෂයෙන්ම සංචාරක ක්ෂේත්‍රය මත බලපෑම් ඇති කරන ලද පාස්කු ඉරු දින සිදු වූ ප්‍රහාරවලින් අනතුරුව ඇති වූ ප්‍රවණතා ජංගම ගිණුම කෙරෙහි අහිතකර බලපෑම් ඇති කළේය. විශේෂයෙන් වසරේ අවසාන කාලපරිච්ඡේදයේ දී වෙළඳ හිඟය ක්‍රමයෙන් පුළුල් වීම සහ සංචාරක ඉපැයීම් හා විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ අඩු වීම හේතුවෙන් 2019 වසරේ දෙවන කාර්තුවේ සිට ජංගම ගිණුමේ හිඟයන් වාර්තා විය. කෙසේ නමුත්, සමස්ත වසර තුළ ජංගම ගිණුමේ හිඟය, 2018 වසරේ වාර්තා වූ හිඟයට වඩා සැලකිය යුතු අඩු මට්ටමක පැවතුණි. 2019 වසරේ දී වෙළඳ හිඟය සමස්තයක් ලෙස අඩු වීම සඳහා මූලික වශයෙන් රත්‍රන් හා රථවාහන ආනයනය අඩු කිරීම සඳහා ගනු ලැබූ ප්‍රතිපත්ති තීරණ හමුවේ, වෙළඳ භාණ්ඩ ආනයන වියදම පහත වැටීම හේතු විය. 2019 වසරේ පළමු භාගයේ දී වෙළඳ භාණ්ඩ අපනයනවල සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණ ද, වසරේ දෙවන භාගයේ දී එම ප්‍රවණතාව වෙනස් වීම හේතුවෙන් 2019 වසරේ සමස්ත අපනයන වර්ධනය මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. 2019 වසරේ අපනයන වර්ධනය සඳහා රෙදිපිළි හා ඇඟලුම් අපනයනවල ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. පාස්කු ඉරු දින ප්‍රහාරවලින් අනතුරුව සංචාරක ඉපැයීම් හා ගුවන් මගී සේවා අඩු වීම හේතුවෙන් ප්‍රවාහන ඉපැයීම් සැලකිය යුතු ලෙස අඩු වීම, සේවා ගිණුමේ අතිරික්තය මත අහිතකර බලපෑමක් ඇති කළේය. වසර තුළ දී, ප්‍රතිආයෝජිත ඉපැයුම් සහ සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි ලාභාංශ ගෙවීම් ඉහළ යෑමත් සමඟ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය සුළු වශයෙන් පුළුල් වූ අතර, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් අඩු වීමත් සමඟ ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්තය අඩු විය.

වසර තුළ දී වූ සැලකිය යුතු ලැබීම් සමඟ ගෙවුම් තුලනයේ මූල්‍ය ගිණුම ශක්තිමත් විය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතු තුළින් වූ එ.ජ. ඩොලර් බිලියන 4.4ක් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදලේ) විස්තීර්ණ ණය පහසුකමෙහි වාරික දෙකක ලැබීම් 2019 වසරේ දී මූල්‍ය ගිණුම වෙත වූ ප්‍රධාන ලැබීම් විය. කෙසේ වුවද, විදේශීය සෘජු ආයෝජන අඩු වීම සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි හා කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන ශුද්ධ ගෙවීම් වාර්තා වීම හේතුවෙන් මූල්‍ය ගිණුම වෙත වූ අනෙකුත් ප්‍රවාහ මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. 2019 වසරේ දී රජය විසින් එ.ජ. ඩොලර් බිලියන 1.5ක වටිනාකමින් යුතු කල් පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ආපසු ගෙවීම, විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම්හි වාරික ආපසු ගෙවීම් හා කල් පිරුණු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආපසු ගෙවීම් ඇතුළු විශාල ප්‍රමාණයක ණය ආපසු ගෙවීම් සිදු කරන ලදී. මෙම ණය සේවාකරණ මධ්‍යයේ වුවද, දළ නිල සංචිත 2018 වසර අවසානයේ දී පැවති එ.ජ. ඩොලර් බිලියන 6.9 සිට 2019 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 7.6ක් දක්වා වර්ධනය විය. සංචිතවලට අදාළ වගකීම්වලට සාපේක්ෂව දළ නිල සංචිත ඉහළ යෑම ගෙවුම් තුලනයේ සමස්ත ශේෂය මගින් ද පිළිබිඹු වූ අතර, එය 2019 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 377ක අතිරික්තයක් වාර්තා කළේය.

*ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වසර තුළ දී, විනිමය අනුපාතිකය නම්‍යශීලීව තීරණය වීමට අඛණ්ඩව ඉඩ හරින ලදී. 2018 වසරේ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව සැලකිය යුතු අවප්‍රමාණයක් වාර්තා කළ ශ්‍රී ලංකා රුපියල 2019 වසර තුළ දී සියයට 0.6කින් සුළු වශයෙන් අතිප්‍රමාණය විය. විනිමය අනුපාතිකය සාපේක්ෂ වශයෙන් ස්ථාවරව පැවතීම සඳහා ප්‍රධාන වශයෙන් වෙළඳ හිඟයේ අඩු වීම හේතු විය. දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ පැවති හිතකර තත්ත්වයන් ශුද්ධ පදනම මත විදේශ විනිමය මිලදී ගැනීමටත්, එමගින් දළ නිල සංචිත ඉහළ නංවා ගැනීමටත් ශ්‍රී ලංකා මහ බැංකුවට අවකාශ සලසන ලදී. පාස්කු ඉරු දින ප්‍රහාරවලින් අනතුරුව සහ දේශීය සහ විදේශීය අවිනිශ්චිතතා හේතුවෙන් රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් වූ විදේශීය ආයෝජන ගෙවීම් යම් ප්‍රමාණයකින් ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස ඇතැම් අවස්ථාවල දී දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ විචලනයක් දක්නට ලැබුණි.*

*2020 වසරේ දී විදේශීය අංශය සැලකිය යුතු පීඩනයකට ලක් විය හැක. කොවිඩ්-19 (COVID-19) වසංගත තත්ත්වය පැතිරීම හේතුවෙන් 2020 මාර්තු මස අග භාගයේ දී අපනයනාභිමුඛ නිෂ්පාදන ඇතුළු දේශීය ආර්ථික කටයුතු තාවකාලිකව ඇනහිටීම, ගෝලීය සංචාරක කටයුතු සඳහා සීමා පැනවීමත් සමඟ සංචාරක කර්මාන්තය සම්පූර්ණයෙන් ඇනහිටීම, බොහෝ රටවල් වසා දැමීම හේතුවෙන් ගෝලීය සැපයුම් දාම සහ භාණ්ඩ වෙළඳාම කෙරෙහි බලපෑම් ඇති වීම සහ විදේශීය ආයෝජකයින් විසින් නැගී එන ආර්ථිකයන් වෙතින් සිය ආයෝජන ඉවත් කර ගැනීම හේතුවෙන් 2020 වසරේ පළමු කාර්තුව තුළ දී, ශ්‍රී ලංකාවේ විදේශීය අංශය දැනටමත් බලපෑමට ලක් වී ඇත. කොවිඩ්-19 වසංගතයේ ව්‍යාප්තිය තුළින් ඇති වූ සැලකිය යුතු අවිනිශ්චිත තත්ත්වය දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත ද බලපෑ අතර, එය 2020 මාර්තු මාසයේ දී ශ්‍රී ලංකා රුපියල තියුණු ලෙස අවප්‍රමාණය වීමට හේතු විය. මහ බැංකුව සහ රජය විසින් විදේශ විනිමය වෙළඳපොළ මත ඇති වන පීඩනය අවම කිරීම සඳහා තෝරාගත් මෝටර් රථ සහ අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය මාස තුනක කාලයක් සඳහා තාවකාලිකව අත්හිටුවීම ඇතුළුව කඩිනම් ක්‍රියාමාර්ග හඳුන්වා දෙන ලදී. සැලකිය යුතු ණය සේවාකරණ අභියෝග මධ්‍යයේ දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ සමපේක්ෂණ අස්ථාවරතා ඇති වීමේ හැකියාව ද සමඟ 2020 වසරේ ගෙවුම් තුලනයෙහි ජංගම ගිණුමේ හා මූල්‍ය ගිණුමේ ක්‍රියාකාරිත්වය, සමස්තයක් ලෙස කොවිඩ්-19 වසංගතයේ බලපෑම තවදුරටත් ව්‍යාප්ත වන ආකාරය මත තීරණය වනු ඇත. මැදි හා දිගු කාලීනව ජංගම ගිණුමේ හිඟය තිරසාර මට්ටමක පවත්වා ගැනීම*

### 5.1 සංඛ්‍යා සටහන
### ගෙවුම් තුලනයෙහි විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම


| ශීර්ෂය | එ.ජ. ඩොලර් මිලියන | | රුපියල් මිලියන | |
|---|---|---|---|---|
| | 2018 (අ) | 2019 (ආ) | 2018 (අ) | 2019 (ආ) |
| **ජංගම ගිණුම (ශුද්ධ)** | **-2,799** | **-1,808** | **-451,975** | **-320,969** |
| **වෙළඳ ගිණුම** | **-10,343** | **-7,997** | **-1,673,111** | **-1,430,232** |
| අපනයන | 11,890 | 11,940 | 1,933,533 | 2,134,796 |
| ආනයන | 22,233 | 19,937 | 3,606,644 | 3,565,028 |
| **සේවා (ශුද්ධ)** | **3,766** | **2,849** | **611,233** | **510,822** |
| ලැබීම් | 8,374 | 7,474 | 1,358,881 | 1,337,540 |
| ගෙවීම් | 4,608 | 4,625 | 747,648 | 826,718 |
| **ප්‍රාථමික ආදායම් (ශුද්ධ)** | **-2,385** | **-2,426** | **-389,601** | **-432,250** |
| ලැබීම් | 249 | 252 | 40,204 | 44,989 |
| ගෙවීම් | 2,633 | 2,678 | 429,805 | 477,239 |
| **ද්විතීයික ආදායම් (ශුද්ධ)** | **6,163** | **5,766** | **999,504** | **1,030,690** |
| ද්විතීයික ආදායම්: ලැබීම් | 7,023 | 6,726 | 1,139,324 | 1,202,334 |
| සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 7,015 | 6,717 | 1,138,124 | 1,200,766 |
| රජයේ සංක්‍රාම | 8 | 9 | 1,201 | 1,568 |
| ද්විතීයික ආදායම්: ගෙවීම් | 860 | 960 | 139,821 | 171,644 |
| **ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **14** | **23** | **2,265** | **4,095** |
| ප්‍රාග්ධන ගිණුම: ලැබීම් | 42 | 51 | 6,702 | 9,054 |
| ප්‍රාග්ධන ගිණුම: ගෙවීම් | 27 | 28 | 4,437 | 4,959 |
| **ජංගම සහ ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **-2,785** | **-1,785** | **-449,710** | **-316,875** |
| **මූල්‍ය ගිණුම (ශුද්ධ)** | **-3,378** | **-2,432** | **-548,398** | **-436,783** |
| **සෘජු ආයෝජන: වත්කම්** | **68** | **77** | **11,021** | **13,830** |
| **සෘජු ආයෝජන: වගකීම්** | **1,614** | **758** | **260,831** | **135,538** |
| **විවිධ ආයෝජන: වත්කම්** | **...** | **-** | **6** | **-** |
| ණය සුරැකුම්පත් | ... | - | 6 | - |
| **විවිධ ආයෝජන: වගකීම්** | **129** | **2,303** | **-2,281** | **406,997** |
| හිමිකම් | -4 | -15 | -3,728 | -2,964 |
| ණය සුරැකුම්පත් | 134 | 2,317 | 1,446 | 409,960 |
| **මූල්‍ය ව්‍යුත්පන්න** | **-** | **-** | **-** | **-** |
| **අනෙකුත් ආයෝජන: වත්කම්** | **372** | **100** | **64,683** | **17,823** |
| මුදල් සහ තැන්පතු | 80 | -93 | 14,605 | -16,796 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | 177 | -4 | 28,647 | -680 |
| අනෙකුත් ලැබිය යුතු ගිණුම් | 116 | 196 | 21,430 | 35,299 |
| **අනෙකුත් ආයෝජන: වගකීම්** | **1,073** | **-114** | **184,204** | **-18,653** |
| මුදල් සහ තැන්පතු | -632 | 167 | -107,198 | 31,079 |
| ණය | 1,620 | -277 | 278,136 | -49,269 |
| මහ බැංකුව | 252 | 327 | 39,999 | 58,277 |
| තැන්පතු භාරගන්නා ආයතන | 697 | -281 | 120,016 | -50,904 |
| රජය | 557 | -97 | 96,909 | -15,917 |
| අනෙකුත් අංශ | 114 | -226 | 21,212 | -40,725 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | 247 | -28 | 36,401 | -5,577 |
| අනෙකුත් ගෙවිය යුතු ගිණුම් | -162 | 24 | -23,135 | 5,114 |
| විශේෂ ගැනුම් හිමිකම් | - | - | - | - |
| **සංචිත වත්කම්** | **-1,002** | **337** | **-181,354** | **55,445** |
| මූල්‍ය රත්‍රන් | -103 | -14 | -16,244 | -2,614 |
| විශේෂ ගැනුම් හිමිකම් | -3 | 6 | -519 | 1,080 |
| ජා.මූ. අරමුදලේ සංචිත මට්ටම | - | - | - | - |
| අනෙකුත් සංචිත වත්කම් | -895 | 346 | -164,592 | 56,979 |
| මුදල් සහ තැන්පතු | -1,011 | 361 | -170,196 | 59,518 |
| සුරැකුම්පත් | 122 | -19 | 6,732 | -3,039 |
| **ශුද්ධ වැරදීම් හා අත්හැරීම්** | **-593** | **-647** | **-98,688** | **-119,909** |
| **සමස්ත ශේෂය (ඇ)** | **-1,103** | **377** | **-4,354** | **62,296** |
| **ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස** | | | | |
| වෙළඳ ගිණුම | -11.7 | -9.5 | | |
| භාණ්ඩ හා සේවා | -7.4 | -6.1 | | |
| ජංගම ගිණුම | -3.2 | -2.2 | | |
| ජංගම හා ප්‍රාග්ධන ගිණුම | -3.1 | -2.1 | | |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) සමස්ත ශේෂය ගණනය කිරීම සඳහා 5.12 සංඛ්‍යා සටහන පරිශීලනය කරන්න.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

5.1 රූප සටහන


## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය




5

**5.2 රූප සටහන**

**ගෙවුම් තුලනය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

*මෙන්ම විදේශීය අංශයේ අතිරික්තයන් ගොඩනංවා ගැනීම, දිගු කාලීනව විදේශීය අංශයේ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා අතිශයින්ම වැදගත් වේ. සැලකිය යුතු මට්ටමක විශාල රාජ්‍ය මූල්‍ය හිඟයන් පවත්වා ගෙන යෑමේ අහිතකර පසු බලපෑම් ඇති වුවහොත්, විදේශ මූල්‍යන අවශ්‍යතාව ද ඉහළ යනු ඇත. පැතිරෙන වසංගතය හේතුවෙන් නැඟී එන සහ සංවර්ධනය වෙමින් පවතින වෙළඳපොළ ආර්ථිකයන්ට ගෝලීය ප්‍රාග්ධන වෙළඳපොළ වෙත ප්‍රවේශ වීමේ හැකියාව සීමාසහිත බැවින් යම් ප්‍රමාණයක තාවකාලික මූල්‍යන තුළින් කෙටිකාලීන විදේශීය ණය වගකීම් පියවීම කෙරෙහි කඩිනමින් අවධානය යොමු කළ යුතුව ඇත. ණය නොවන විදේශ විනිමය ඉපැයීම් ආකර්ෂණය කර ගැනීම සඳහා අපනයනාභිමුඛ නිෂ්පාදන හා සේවා සඳහා පහසුකම් සැපයීමට මැදිකාලීනව පියවර ගැනීම අවශ්‍ය වේ.*

5

## 5.2 විදේශ වෙළඳ ප්‍රතිපත්ති, වර්ධනයන් සහ ආයතනික සහාය

**2019 වසරේ දී විදේශ වෙළඳාමට පහසුකම් සැපයීම සහ අපනයන ප්‍රවර්ධනය සඳහා වෙළඳ ඒකාබද්ධතාව ඉහළ නැංවීම සහ ආයතනික සහාය වැඩි කිරීම කෙරෙහි රජය අඛණ්ඩව අවධානය යොමු කළේය.** කලාපීය වෙළඳ ගිවිසුම් වැඩි දියුණු කිරීම පිළිබඳව සාකච්ඡා අඛණ්ඩව සිදු කෙරුණ ද, චීනය, ඉන්දියාව සහ තායිලන්තය සමඟ යෝජිත විස්තීර්ණ නිදහස් වෙළඳ/ හවුල්කාරිත්ව ගිවිසුම් පිළිබඳ ද්වීපාර්ශ්වික සාකච්ඡා 2019 වසරේ දී නොපැවැත්විණි. මීට අමතරව, 2018 වසරේ මැයි මාසයේ සිට බලාත්මක වූ ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ සමාලෝචන ක්‍රියාවලියක් 2019 වසරේ දී සිදු කරන ලදී. වෙළඳ ගැළපුම් වැඩසටහනක් ද ඇතුළුව, වෙළඳාම ලිහිල්කරණය සමඟ මතුවිය හැකි සෘණාත්මක බලපෑම් අවම කිරීම සඳහා ප්‍රධාන වශයෙන් වෙළඳපොළ ප්‍රවේශ වැඩසටහන සහ 2018 අංක 2 දරන ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත හා 2018 අංක 3 දරන ආරක්ෂණ පියවර පනත ක්‍රියාවට නැංවීම මගින් පියවර ගනු ලැබීය. තවද, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2018-2022 ජාතික අපනයන ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ගිවිසුම අනුව, ජාතික තනි කවුළු පද්ධතිය හා සම්බන්ධ කටයුතු සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී අඛණ්ඩව සිදු කෙරිණි. මෙවැනි ක්‍රියාමාර්ගවල ප්‍රතිඵල පිළිබිඹු කරමින්, ව්‍යාපාර කිරීමේ පහසුව දක්වන දර්ශකයේ (Ease of Doing Business Index) ශ්‍රී ලංකාවේ ශ්‍රේණිගත කිරීම 2019 වසරේ දී පැවති 100 වන ස්ථානයේ සිට 2020 වසරේ දී 99 වන ස්ථානය දක්වා වැඩිදියුණු වූ අතර (2018 වසරේ දී 111 වන ස්ථානය), ඉදිරි කාල සීමාව තුළ දී හිතකර ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමත් සමඟ මෙම දර්ශකය තවදුරටත් වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**වරණීය වෙළඳාම පිළිබඳ පොදු ක්‍රමය (ජී.එස්.පී.) තුළින් 2019 වර්ෂය තුළ දී ශ්‍රී ලංකාව අඛණ්ඩව ප්‍රතිලාභ ලැබීය.** ශ්‍රී ලංකාවට ලැබුණු ජී.එස්.පී. පහසුකම් අතර, යුරෝපා සංගමය සහ ඇමෙරිකා එක්සත් ජනපදය වෙතින් ලබා දුන් පහසුකම්, ශ්‍රී ලංකාවේ වරණීය පහසුකම් යටතේ වූ සමස්ත අපනයනවලින් තුනෙන් දෙකකට වඩා වැඩි ප්‍රමාණයකට දායක විය. 2017 මැයි මාසයේ දී යුරෝපා සංගමයේ ජී.එස්.පී. ප්ලස් යෝජනා ක්‍රමය ප්‍රතිස්ථාපනය කිරීමෙන් පසුව, යුරෝපා සංගමය වෙත සිදු කරන ලද අපනයනවල යම් වර්ධනයක් දැකිය හැකි විය. යුරෝපා සංගමයේ ජී.එස්.පී. ප්ලස් යෝජනා ක්‍රමය යටතේ, යුරෝපා සංගමයේ මුළු තීරු බදු අයිතමවලින් සියයට 66ක් සඳහා තීරු බදු ඉවත් කිරීම හේතුවෙන් ශ්‍රී ලංකාවට මෙම ප්‍රතිලාභ ලබාගැනීමට හැකි විය. ඇඟලුම්, රබර් නිෂ්පාදිත, තේ, මුහුදු ආහාර, ආහාර, පාන වර්ග හා දුම්කොළ සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ 2019 වසරේ දී මෙම යෝජනා ක්‍රමය යටතේ සිදු කළ ප්‍රධාන අපනයන කාණ්ඩ විය. කෙසේ වුව ද, ලෝක බැංකුව විසින් සිදු කරන ලද වර්ගීකරණයට අනුව 2019 වසරේ දී ශ්‍රී ලංකාව ඉහළ මැදි ආදායම් තත්ත්වයට ළඟාවීමත් සමඟ, යුරෝපා සංගමයේ ජී.එස්.පී. ප්ලස් හා සාමාන්‍ය ජී.එස්.පී. යෝජනා ක්‍රමවලට ඇති සුදුසුකම් 2023 වසර වන විට අහිමි විය හැකිය. මේ අතර, යුරෝපා සංගමයේ ජී.එස්.පී. ප්ලස් යෝජනා ක්‍රමයේ ප්‍රධානතම ප්‍රතිලාභියා වන ඇඟලුම් අංශය, මෙම යෝජනා ක්‍රමයට සුදුසුකම් ලැබීම සඳහා

**5.2 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකාව වරණීය වෙළඳ ගිවිසුම් යටතේ සිදු කළ අපනයන**

| වරණීය වෙළඳ ගිවිසුම | 2018 | 2019 (අ) | | |
|---|---|---|---|---|
| | වටිනාකම (එ.ජ. ඩොලර් මිලියන) | වටිනාකම (එ.ජ. ඩොලර් මිලියන) | වර්ධනය (%) | දායකත්වය (%) |
| වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (ජී.එස්.පී.) | 3,927.7 | 4,077.9 | 3.8 | 82.5 |
| එයින් යුරෝපා සංගමය (ජී.එස්.පී. ප්ලස් සහිතව) (ආ) | 2,665.3 | 2,766.3 | 3.8 | 56.0 |
| ඇමෙරිකා එක්සත් ජනපදය | 708.0 | 709.4 | 0.2 | 14.3 |
| රුසියානු සමූහාණ්ඩුව (ඇ) | 166.6 | 150.3 | -9.8 | 3.0 |
| ඕස්ට්‍රේලියාව | 79.5 | 89.7 | 12.9 | 1.8 |
| තුර්කිය | 79.5 | 85.3 | 7.3 | 1.7 |
| ජපානය | 92.7 | 84.9 | -8.4 | 1.7 |
| කැනඩාව | 71.6 | 73.5 | 2.6 | 1.5 |
| ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISLFTA) 2000 වසරේ සිට ක්‍රියාත්මකයි | 483.5 | 489.6 | 1.3 | 9.9 |
| ආසියා - ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) (ඈ) 2006 වසරේ සිට ක්‍රියාත්මකයි | 157.0 | 179.3 | 14.2 | 3.6 |
| ගෝලීය වරණීය වෙළඳාම් ක්‍රමය (GSTP) 1989 වසරේ සිට ක්‍රියාත්මකයි | 92.6 | 80.7 | -12.8 | 1.6 |
| පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) 2005 වසරේ සිට ක්‍රියාත්මකයි | 51.0 | 60.8 | 19.1 | 1.2 |
| දකුණු ආසියානු වෙළඳ වරණය (SAFTA) 2006 වසරේ සිට ක්‍රියාත්මකයි | 35.4 | 55.9 | 57.9 | 1.1 |
| සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) 1995 වසරේ සිට ක්‍රියාත්මකයි | 3.5 | 1.7 | -50.1 | ... |
| **වරණීය වෙළඳ ගිවිසුම් යටතේ මුළු අපනයන** | **4,750.7** | **4,945.8** | **4.1** | **100.0** |
| **ශ්‍රී ලංකාවේ මුළු වෙළඳ භාණ්ඩ අපනයනවලින් ප්‍රතිශතයක් ලෙස** | **40.0** | **41.4** | | |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
වාණිජ දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික
(ආ) යුරෝපා සංගමය මගින් ලබාදෙන ජී.එස්.පී. සහනය මගින් යුරෝපා සංගමයේ රටවල් වෙත ආනයනය කරන භාණ්ඩවලින් තීරු බදු අයිතම සියයට 66 කට වරණීය ප්‍රවේශය ලබා දෙන අතර යුරෝපා සංගමය මගින් ලබා දෙන ජී.එස්.පී. ප්ලස් සහනය මගින් යුරෝපා සංගමයේ රටවල් වෙත ආනයනය කරන එම තීරු බදු අයිතම සඳහාම තීරු බදු රහිත ප්‍රවේශයක් ලබා දේ.
(ඇ) රුසියාව, බෙලාරුස් හා කසකස්ථානය ඇතුළත් වේ.
(ඈ) පෙරදී මෙය බැංකොක් ගිවිසුම (1975) ලෙස හඳුන්වන ලදී.

වන ප්‍රභවස්ථානය පිළිබඳ අවශ්‍යතා සපුරා ගැනීම හා සම්බන්ධ ගැටලුවලට අඛණ්ඩව මුහුණ දුන් අතර, එය ඇඟලුම් අපනයනවල වර්ධනයට බාධාවක් විය. මේ සම්බන්ධව, ශ්‍රී ලංකා රජය විසින් ඉන්දුනීසියානු සහ දකුණු කොරියානු රජයන් සමඟ එක්ව මෙම රටවල් මූලාශ්‍ර කොටගත් අමුද්‍රව්‍ය ශ්‍රී ලංකාවේ ඇඟලුම් අංශය විසින් භාවිත කිරීමට යුරෝපා සංගමයේ ජී.එස්.පී. ප්ලස් යෝජනා ක්‍රමයේ සමුච්චිතකරණ නීතිය යටතේ අවසර ලබා ගැනීම සඳහා 2018 වසරේ දී ඉල්ලීම් කිහිපයක් සිදු කර ඇති අතර, දැනට මෙම ඉල්ලීම් යුරෝපා සංගමය විසින් සලකා බලමින් සිටියි. මේ අතර, වරණීය ගිවිසුම් යටතේ සිදු කළ මුළු අපනයනවලින් සියයට 14.3ක් වන ඇමෙරිකා එක්සත් ජනපදයේ ජී.එස්.පී. පහසුකම යටතේ සිදු කළ අපනයන 2019 වසරේ දී සුළු වශයෙන් ඉහළ ගියේය. ඇඟලුම්, රබර් නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ, තේ සහ රසායනික නිෂ්පාදිත එක්සත් ජනපද ජී.එස්.පී. යෝජනා ක්‍රමය යටතේ 2019 වසරේ දී සිදු කළ ප්‍රධාන අපනයන කාණ්ඩ විය. වර්තමාන එක්සත් ජනපද ජී.එස්.පී. යෝජනා ක්‍රමය 2020 වසර අවසානය දක්වා ක්‍රියාත්මක වන අතර, එක්සත් ජනපද රජයේ සාමාන්‍ය පිළිවෙත අනුව එම පහසුකම නැවත ලබාදෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මීට අමතරව, රුසියානු සමූහාණ්ඩුව, ජපානය, ඕස්ට්‍රේලියාව, තුර්කිය, කැනඩාව සහ ස්විට්සර්ලන්තය වැනි රටවල් කිහිපයක් විසින් ලබා දී ඇති ජී.එස්.පී. යෝජනා ක්‍රමවලින් ශ්‍රී ලංකාව අඛණ්ඩව ප්‍රතිලාභ ලැබුව ද, අපනයන සම්බන්ධයෙන් ඒවායෙහි දායකත්වය සාපේක්ෂව අඩු මට්ටමක පැවතුණි. මේ අතර, ගෝලීය වරණීය වෙළඳාම් ක්‍රමය යටතේ මෙක්සිකෝව සහ පේරු රාජ්‍ය වෙත ප්‍රධාන වශයෙන් කුරුඳු අපනයනය කිරීමෙන් ශ්‍රී ලංකාව උපයන ලද අපනයන ආදායම 2019 වසරේ දී අඩු විය. පටු අපනයන පදනම සහ අඩු නිෂ්පාදන ආවරණය මෙවැනි බොහොමයක් ජී.එස්.පී. ක්‍රම මගින් ශ්‍රී ලංකාවට පරිපූර්ණ ප්‍රතිලාභ අත්පත් කර ගැනීමට ඇති අවස්ථාව වළක්වා ඇත.

**2019 වසරේ දී ද්විපාර්ශ්වික වෙළඳාම වැඩිදියුණු කිරීම් පිළිබඳ සාකච්ඡා ප්‍රගතියක් ලැබුවද, නව වෙළඳ ගිවිසුම් සම්බන්ධ වැඩිදුර සාකච්ඡා නතර වී ඇත.** 2019 වර්ෂය ආරම්භය වන විට ශ්‍රී ලංකාව චීනය, ඉන්දියාව (ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතා ගිවිසුම - එට්කා) සහ තායිලන්තය සමඟ විස්තීර්ණ නිදහස් වෙළඳ/ හවුල්කාරිත්ව ගිවිසුම් තුනක් පිළිබඳ සාකච්ඡා වට කිහිපයක් අවසන් කර තිබුණි. දේශපාලන ගැටලු මධ්‍යයේ 2019 වසරේ දී මෙම නව නිදහස් වෙළඳ/ හවුල්කාරිත්ව ගිවිසුම් සම්බන්ධයෙන් නිල ද්විපාර්ශ්වික සාකච්ඡා වට නොපැවැත්විණි. චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ සාකච්ඡා නැවත ආරම්භ කිරීම පිළිබඳව චීන රජය සමඟ දේශපාලනික මට්ටමින් සාකච්ඡා පැවැත්වුව ද, 2017 මාර්තු මාසයේ දී පැවති හයවන වටයෙන් පසුව නිල මට්ටමෙන් සාකච්ඡා නැවත ආරම්භ කිරීමට අපොහොසත් වී තිබේ. මේ අතර, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර යෝජිත එට්කා ගිවිසුම පිළිබඳ සාකච්ඡා වට 11ක් 2018 සැප්තැම්බර් මාසය වන විට අවසන් වී තිබුණි. ඒ අනුව, රේගු ක්‍රියාපටිපාටිය සහ වෙළඳ පහසුකම් හා

5

වෙළඳ ප්‍රතිකර්ම යන පරිච්ඡේද දෙක පිළිබඳ සාකච්ඡා සාර්ථකව නිම කරන ලද අතර, එම පරිච්ඡේද දෙකෙහි කෙටුම්පත් අවසන් කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ වෙත යොමු කර ඇත. 2018 ජූලි මාසයේ දී ආරම්භ වූ ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ සාකච්ඡා 2018 සැප්තැම්බර් මාසයේ දී පැවති දෙවන වටයෙන් පසු නැවත නොපැවැත්වුණි. සේවා වෙළඳාම, ආයෝජන සහ ව්‍යාපාරික අවස්ථා ගෝලීය අගය දාම මෙහෙයුම් හරහා වැඩි දියුණු කිරීමේ අපේක්ෂාවෙන් ශ්‍රී ලංකාව සිය පළමු විස්තීර්ණ ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම 2018 ජනවාරි මාසයේ දී සිංගප්පූරුව සමඟ අත්සන් කළ අතර, එය 2018 මැයි මාසයේ සිට බලාත්මක විය. කෙසේ වුවද, ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම හා සම්බන්ධ විවිධ පාර්ශ්වකරුවන් මතු කළ ගැටලු මධ්‍යයේ 2018 අගෝස්තු මාසයේ දී එම ගිවිසුම තවදුරටත් විශ්ලේෂණය කිරීම සඳහා විශේෂඥ කමිටුවක් පත් කරන ලදී. ඒ අනුව, එම කමිටුව විසින් 2018 නොවැම්බර් මාසයේදී සිය වාර්තාව ඉදිරිපත් කරන ලදී. ඉන් පසුව, පංච පුද්ගල අමාත්‍ය මණ්ඩල අනු කමිටුවක් පත් කරන ලද අතර, ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුමෙහි සංශෝධනය කළ යුතු ක්ෂේත්‍ර මෙන්ම අදාළ දේශීය ආයතන සමඟ තවදුරටත් සාකච්ඡා කළ යුතු කරුණු පිළිබඳව සඳහන් කරමින් එහි මූලික වාර්තාව සකස් කරන ලදී. මේ අතර, මැලේසියාව, ඉන්දුනීසියාව සහ බංග්ලාදේශය සමඟ එළඹිය හැකි නිදහස් වෙළඳ ගිවිසුම් කිහිපයක් පිළිබඳව මූලික අධ්‍යයන සහ සාකච්ඡා 2019 වර්ෂයේ දී තවදුරටත් සිදු කෙරිණි. ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම් හැරුණු විට 2019 වසරේ දී හංගේරියාව, ඕස්ට්‍රේලියාව, ජර්මනිය සහ නවසීලන්තය සමඟ ආර්ථික සහයෝගීතාව පිළිබඳ සාකච්ඡා කිහිපයක් සිදු කරන ලද අතර, යුරෝපා සංගමය, තායිලන්තය, කුවේට් රාජ්‍යය සහ වියට්නාමය සමඟ ඒකාබද්ධ කමිටු සහ කොමිසම් හා සම්බන්ධ හමුවීම් පවත්වන ලදී. 2019 දෙසැම්බර් මාසයේ සිට බහුපාර්ශ්වික, ද්විපාර්ශ්වික හා ආර්ථික සම්මුතීන් පිළිබඳ රාජකාරි සහ කාර්යයන් මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය වෙත පවරා ඇත. ඒ අනුව, දැනට පවත්නා සහ සාකච්ඡා මට්ටමේ පවතින නිදහස් වෙළඳ ගිවිසුම් ඇතුළුව රටේ සමස්ත සාර්ව ආර්ථික ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීමෙන් අනතුරුව ඒ හා සම්බන්ධ ඉදිරි කටයුතු මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය විසින් සිදු කරනු ඇත.

**නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ සාපේක්ෂව අඩු මට්ටමක පවතින වෙළඳ පරිමා සැලකිල්ලට ගනිමින් දැනට පවත්නා ද්විපාර්ශ්වික වෙළඳ ගිවිසුම් භාවිතය තවදුරටත් වැඩිදියුණු කිරීමට පියවර ගන්නා ලදී.** ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම ශ්‍රී ලංකාවට වඩාත්ම වාසිදායක ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම වී ඇත. මෙම ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සිදු කළ අපනයන 2018 වසරේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 484 හා සැසඳීමේ දී 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 490ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. ශ්‍රී ලංකාව විසින් ඉන්දියාවට සිදු කරන ලද අපනයන සත්ත්ව ආහාර, කුළුබඩු, ඇඟලුම් සහ මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත මූලික කරගත් අතර, ඉන්දියාව වෙත සිදු කරන සමස්ත අපනයනවලින් සියයට 64ක් මෙම නිදහස් වෙළඳ ගිවිසුම හරහා සිදු කර ඇත. ඊට සාපේක්ෂව මෙම ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් ඉන්දියාවෙන් සිදු කරන ලද ආනයන එ.ජ. ඩොලර් මිලියන 199ක වටිනාකමකින් යුතු වූ අතර, එය ඉන්දියාවෙන් සිදු කළ සමස්ත ආනයනවලින් සියයට 5ක් පමණ විය. ඇඟලුම් හා ගම්මිරිස් සඳහා වූ ප්‍රමාණාත්මක සීමා කිරීම්, රේගු නිෂ්කාශනය හා නියැදි පරීක්ෂණ පිළිබඳ ක්‍රියාපටිපාටි, අධික ලේඛන ගාස්තු හා ප්‍රමාදවීම් වැනි ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ගැටලු විසඳීම සඳහා තවදුරටත් පියවර ගන්නා ලදී. සාකච්ඡා අවසන් වූ විට ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ වූ ගනුදෙනු එට්කා ගිවිසුම යටතේ සිදු කළ හැකි වනු ඇත. මේ අතර, පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සිදු කළ අපනයන 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 61ක් දක්වා සියයට 19.1කින් ඉහළ ගියේය. පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් අපනයනය කරන ලද ප්‍රධාන නිෂ්පාදිත අතරට බුලත් කොළ, පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත සහ ෆයිබර් ලෑලි ඇතුළත් විය. අඩු වෙළඳ පරිමාවක් තිබුණ ද, පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ වූ අපනයන සියයට 74ක ඉහළ අගයක පැවති අතර, ආනයන එ.ජ. ඩොලර් මිලියන 24ක් ලෙස සියයට 6ක අඩු අගයක පැවතුණි. නිෂ්පාදන විවිධාංගීකරණය පහළ මට්ටමක පැවතීම, වරින් වර සිදුවන ප්‍රතිපත්ති වෙනස්වීම් සහ කාර්යපටිපාටි ප්‍රමාදවීම් වැනි බදු නොවන බාධක මෙම ගිවිසුම යටතේ සිදුවන වෙළඳ පරිමාවන්ට බාධාවක් වී තිබේ. එසේ වුව ද, ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම හා පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම සම්බන්ධයෙන් සැලකීමේ දී 2019 වසරේ දී ශ්‍රී ලංකාව වාසිදායක වෙළඳ ශේෂයක් පවත්වාගෙන ගොස් ඇති බව පැහැදිලි වේ. මේ අතර, ඇමෙරිකා එක්සත් ජනපද - ශ්‍රී ලංකා වෙළඳ හා ආයෝජන රාමුව පිළිබඳ ගිවිසුම යටතේ 13 වන ඒකාබද්ධ රැස්වීම 2019 ජූනි මාසයේ කොළඹ දී

පවත්වන ලදී. වඩාත් සවිස්තරාත්මක වූ සාකච්ඡාවලින් අනතුරුව, එක්සත් ජනපද වෙළඳ සහකරුවන් විසින් "ව්‍යාපාර කිරීමේ පහසුව දක්වන දර්ශකයේ" ශ්‍රී ලංකාවේ ශ්‍රේණිගත කිරීම වැඩිදියුණු කිරීම ඇතුළු ක්ෂේත්‍ර කිහිපයක හැකියා වර්ධනය හා නිපුණතා සංවර්ධනය සඳහා තාක්ෂණික සහාය ලබා දීම තුළින් ඔවුන්ගේ සහයෝගය ලබා දීමට කැමැත්ත පළ කරන ලදී.

**කලාපය තුළ වෙළඳ හා සේවා ජාල අතර සහයෝගීතාව ඉහළ නැංවීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් කලාපීය වරණීය වෙළඳ ගිවිසුම් සමඟ කටයුතු කිරීම තවදුරටත් ශක්තිමත් කළ යුතුව ඇත.** 2006 වසරේ දී අත්සන් කරන ලද දකුණු ආසියානු නිදහස් වෙළඳ වරණය (SAFTA), සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) වෙනුවට ක්‍රියාත්මක වෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2019 වසරේ දී සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම භාවිතය අඩු වී ඇති අතර, දකුණු ආසියානු නිදහස් වෙළඳ වරණය හරහා සිදු වූ අපනයන ඉහළ ගියේය. දකුණු ආසියානු නිදහස් වෙළඳ වරණය යටතේ ශ්‍රී ලංකාව විසින් සිදු කළ අපනයනවලින් ලද ආදායමෙන් සියයට 83කට වැඩි ප්‍රමාණයක් දිසිදි පොල් හා ගම්මිරිස් මූලික කොටගත් ඉන්දියාවට සිදු කරන ලද අපනයනවලින් සමන්විත විය. දකුණු ආසියානු නිදහස් වෙළඳ වරණයෙහි තීරුබදු ලිහිල්කරණ වැඩසටහනේ පළමු හා දෙවන අදියරයන් පිළිවෙළින් 2015 සහ 2018 වසරවල දී ශ්‍රී ලංකාව විසින් සම්පූර්ණ කරන ලද අතර, 2019 වසරේ දී තෙවන අදියර යටතේ තීරු බදු අඩු කිරීමේ එකඟතාව ක්‍රියාත්මක කිරීම සඳහා තීරු බදු අයිතම හඳුනා ගැනීමට පාර්ශ්වකරුවන්ගේ උපදේශන සේවා ලබාගැනීම සිදු කරන ලදී. ප්‍රධාන වශයෙන් චීනය වෙත සිදු කළ තේ, ඇඟලුම් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදිත තුළින් 2019 වසරේ දී ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) යටතේ සිදු කළ අපනයන ඉහළ ගියේය. 2018 මාර්තු මාසයේ දී ශ්‍රී ලංකාව හතරවන වටයේ සහන ක්‍රියාත්මක කරන ලද අතර, ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමේ හවුල්කාර රටවල් මේ වන විට සාකච්ඡාවල පස්වන වටය සඳහා ක්‍රමවේද සහ කොන්දේසි සකස් කිරීමේ නිරතව සිටියි. මේ අතර, බහු ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව සඳහා වන බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල ප්‍රවේශය (BIMSTEC) මගින් යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ සාකච්ඡා වට කිහිපයක් 2019 වර්ෂයේ දී පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ තීරු බදු ලිහිල්කරණ වැඩසටහනේ කෙටුම්පත වාණිජ දෙපාර්තමේන්තුව විසින් සකස් කර පාර්ශ්වකරුවන්ගේ මත විමසීම සඳහා ඔවුන් වෙත යවා ඇත.

**ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ ගිවිසුම ක්‍රියාත්මක කිරීම ඇතුළුව ශ්‍රී ලංකාව සහ ලෝක වෙළඳ සංවිධානය අතර බහුපාර්ශ්වික වෙළඳ ගනුදෙනු අඛණ්ඩව ක්‍රියාත්මක විය.** 2019 වසර තුළ දී, ශ්‍රී ලංකාව ධීවර සහනාධාර, කෘෂිකර්මාන්තය, විද්‍යුත් වාණිජ්‍යය හා විද්‍යුත් මුදල් හුවමාරු, දේශීය නියාමන යන ක්ෂේත්‍රවලට අදාළ කාර්යයන් සහ ලෝක වෙළඳ සංවිධානය නවීකරණය කිරීම සඳහා වන ප්‍රතිසංස්කරණ කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියාකාරීව කටයුතු කළේය. වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ ගිවිසුම, 2017 පෙබරවාරි මාසයේ සිට බලාත්මක වූ බැවින් එහි "ඒ", "බී" සහ "සී" යන කාණ්ඩ යටතේ නිශ්චිතව දක්වා ඇති සිය බැඳීම් පිළිබඳව ශ්‍රී ලංකාව විසින් ලෝක වෙළඳ සංවිධානය වෙත දැනුම් දෙන ලදී. වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවේ බැඳීම් ඉටු කිරීම සඳහා 2018 ජූලි මාසයේ දී දියත් කරන ලද වෙළඳ තොරතුරු ද්වාරය භාවිතය වැඩිදියුණු කිරීම සඳහා 2019 වර්ෂය තුළ දී පාර්ශ්වකරුවන්ගේ උපදේශන ලබා ගැනීමේ සහ දැනුම්වත් කිරීමේ සැසි කිහිපයක් පවත්වන ලදී. මේ අතර, ශ්‍රී ලංකා රේගුව සඳහා වන ජාතික තනි කවුළුව සැලසුම් කිරීමේ කටයුතු සිදුකෙරෙමින් පැවති අතර, එහි සැලැස්ම ලෝක බැංකුව විසින් 2019 ජූලි මාසයේ දී මුදල් අමාත්‍යාංශයට සහ ශ්‍රී ලංකා රේගුවට භාර දෙන ලදී.

**විදේශීය වෙළඳාමට පහසුකම් සැලසීමේ අරමුණින් අදාළ ආයතනවල හැකියාවන් විධිමත් කිරීම සඳහා රජය විසින් මූලාරම්භයන් කිහිපයක් ගන්නා ලදී.** නව වෙළඳ ප්‍රතිපත්තියේ ප්‍රධාන ප්‍රතිඵලයක් වන වෙළඳ ගැළපුම් වැඩසටහන 2017 වර්ෂයේ දී හඳුන්වා දෙනු ලැබූ අතර, එහි අරමුණ වූයේ ලිහිල් කරන ලද වෙළඳ තත්ත්වයන්ට ආයතන සහ සේවකයන් සුමට ලෙස යොමු කිරීමට සහාය වීමයි. වෙළඳ ගැළපුම් වැඩසටහන ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වෙළඳ හා ඵලදායිතා කොමිෂන් සභාව සහ ඒකාබද්ධ මෙහෙයුම් කමිටුවක් පිහිටුවීමට 2019 මාර්තු මාසයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණි. කර්මාන්ත හා රජය අතර ඇති පරතරය පියවා ගනිමින් වෙළඳ ලිහිල්කරණ ක්‍රියාවලියේ දී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කිරීම සඳහා ස්ථාපනය කරන ලද වෙළඳ හා ඵලදායිතා කොමිෂන් සභාව සවිබල ගැන්වීම සඳහා පනතක් කෙටුම්පත් කිරීම ආරම්භ කර ඇත. මේ අතර, 2018 ජූලි මාසයේ දී දියත් කරන ලද 2018 - 2022 සඳහා වන ජාතික අපනයන ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීමේ කටයුතු 2019 වර්ෂයේ දී ද අඛණ්ඩව සිදු විය. ඒ අනුව, කාර්මික අපනයන හා ආයෝජන

5

ප්‍රවර්ධන අමාත්‍යාංශය (පෙර සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අමාත්‍යාංශය) යටතේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නියෝජනය සහිත උපදේශන කමිටු කිහිපයකින් සමන්විත ජාතික අපනයන ක්‍රමෝපාය කළමනාකරණ ඒකකයක් පිහිටුවන ලද අතර, ජාතික අපනයන ක්‍රමෝපායෙහි ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධීකරණය, අධීක්ෂණය, ක්‍රියාවට නැංවීම සහ වාර්තා කිරීම අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සිදු කරනු ලබයි. 2019 වසර අවසානය වන විට, ජාතික අපනයන ක්‍රමෝපාය සිය ඉලක්කගත අංශ සියල්ල සහ වෙළඳ ආධාරක කාර්යයන් සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. මේ අතර, වෙළඳ ප්‍රවේශ උපකාරක වැඩසටහන, තොරතුරු තාක්ෂණ වැඩසටහන, විද්‍යුත් සහ විදුලි සංරචක ක්ෂේත්‍රය සඳහා බහුජාතික සමාගම් සහාය ලබා ගැනීමේ වැඩසටහන, යටිතල පහසුකම් ස්ථාපිත කිරීම සහ අපනයන සංවර්ධන මණ්ඩලයට අයත් වෙළඳ ප්‍රවර්ධන වෙබ් අඩවිය (eMARKETPLACE) ස්ථාපිත කිරීම වැනි මූලාරම්භයන්හි ඉදිරි කටයුතු අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අඛණ්ඩව සිදු කරන ලදී. ප්‍රාදේශීය වශයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 2,000ක් නව අපනයන ශූරයින් බවට පත් කිරීම, කාන්තා ව්‍යවසායකයින් ප්‍රවර්ධනය කිරීම, "එක ගමක් එක නිෂ්පාදනයක්" සංකල්පය සහ හඳුනාගත් ප්‍රදේශවල ඍජු හා වක්‍ර අපනයනකරුවන් බිහි කිරීම සඳහා වන ජාතික වැඩසටහන් තවදුරටත් වැඩිදියුණු කරන ලදී. දැනුම්වත් කිරීමේ වැඩසටහන්, දේශීය හා විදේශීය වෙළඳ ප්‍රදර්ශන සඳහා වූ සංචාර සහ තාක්ෂණික සහාය ලබා දීම ඔස්සේ තෝරාගත් අපනයනකරුවන් ප්‍රතිලාභ ලබාගෙන ඇත. අගය එකතු කිරීම සහ ඵලදායීතාව ඉහළ නැංවීම තුළින් ව්‍යවසායකයින්ට තම වෙළඳපොළ ප්‍රවේශය පුළුල් කිරීම සඳහා නිර්මාණය කර ඇති වෙළඳපොළ ප්‍රවේශ උපකාරක වැඩසටහන යටතේ 2019 වසර අවසාන වන විට අපනයන සංවර්ධන මණ්ඩලය විසින් යෝජනා 100ක් පමණ තෝරා ගන්නා ලදී. මීට අමතරව, කුරුඳු අපනයනය වර්ධනය කිරීමට "ලංකා කුරුඳු" සඳහා භූගෝලීය අපනයන සලකුණු වෙනුවෙන් සුදුසුකම් ලබා ගැනීම ඇතුළුව ක්‍රියාමාර්ග රැසක් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාවට නංවන ලදී. අපනයන ප්‍රවර්ධනය සඳහා වාණිජ මණ්ඩලය ද දායක වූ අතර, එය ප්‍රතිපත්ති සම්පාදනයේ දී හා ගැටලු නිරාකරණයේ දී රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් සම්බන්ධ කිරීමට උපකාරී විය. මේ අතර, 2019 වසරේ දී ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ ගිවිසුම ක්‍රියාත්මක කිරීමට අනුකූලව ශ්‍රී ලංකා රේගුව සිය ක්‍රියාකාරකම් තවදුරටත් විධිමත් කළේය. ඒ අනුව, පද්ධති පදනම් කරගත් පශ්චාත් නිෂ්කාශන විගණනයක් ක්‍රියාත්මක කරන ලද අතර, එමගින් රේගු ක්‍රියාපටිපාටි තවදුරටත් සරල කිරීමට හා අභ්‍යන්තර පාලනයක් පවත්වාගෙන යන අතරම පහසුකම් සැපයීමේ පිරිවැය අවම කිරීමට ශ්‍රී ලංකා රේගුවට අවකාශ සලසයි. තව ද, ශ්‍රී ලංකා දේශ සීමාවට කුණු කසළ හා අපද්‍රව්‍ය ඇතුළුවීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා රේගුව පියවර ගත්තේය. මේ අතර, 2019 ජූලි මාසයේ දී ආනයන භාණ්ඩ නිෂ්කාශනය මුළුමනින්ම ස්වයංක්‍රීයකරණය කරන ලදී.

**2019 අයවැය මගින් ඉදිරිපත් කළ වෙළඳාම ආශ්‍රිත යෝජනා ක්‍රියාත්මක කිරීමට රජය පියවර ගත් අතර, දේශීය ගොවීන් හා කර්මාන්ත රැක ගැනීම සඳහා තෝරාගත් භාණ්ඩ ආනයනය සීමා කරන ලදී.** 2019 අයවැය මගින් තෝරාගත් භාණ්ඩ සඳහා ඉදිරි වසර 5ක කාලසීමාවක් තුළ තීරු බදුවලට අමතරව අය කරන අනෙකුත් බදු වර්ග ක්‍රමයෙන් අඩු කිරීමට යෝජනා කරන ලදී. මීට අමතරව, දැනට ක්‍රියාත්මක වන වෙළඳ ප්‍රතිසංස්කරණ වැඩසටහන් වන වෙළඳ ගැළපුම් වැඩසටහන, ජාතික අපනයන ක්‍රමෝපාය, අපනයන වෙළඳපොළ ප්‍රවේශ වැඩසටහන සඳහා මෙන්ම බිංගිරිය හා වගවත්ත යන ප්‍රදේශවල ස්ථාපිත කිරීමට යෝජිත කාර්මික කලාප වැඩිදුරට සංවර්ධනය කිරීම සඳහා තවදුරටත් අරමුදල් වෙන් කරන ලදී. දේශීය ගොවීන් හා කර්මාන්ත රැක ගැනීමට පියවරක් ලෙස තෝරාගත් භාණ්ඩ ආනයනය සීමා කිරීමට 2019 දෙසැම්බර් මාසයේ දී නියෝග නිකුත් කරන ලදී. ඒ අනුව, ඍජුවම ප්‍රතිඅපනයනය කිරීම හෝ සුළු සකස් කිරීමකින් පසු ප්‍රතිඅපනයනය කිරීම අරමුණු කරගෙන ගම්මිරිස්, අබ, සියඹලා, කුරුඳු, සාදික්කා, වසාවාසි, කරදමුංගු, ඉඟුරු සහ කරාබුනැටි වැනි කුළුබඩු ආනයනය කිරීම සීමා කරන ලදී. තවද, දේශීය කර්මාන්ත කෙරෙහි ඇති කරන බලපෑම හේතුවෙන් වෙසක් පහන් කූඩු, සරුංගල් සහ හඳුන්කූරු ආනයනය සීමා කරන ලදී. මීට අමතරව, ප්‍රතිනැව්ගත කිරීම හෝ ප්‍රතිඅපනයනය කිරීමේ අරමුණින් අපද්‍රව්‍ය ආනයනය කිරීම මෙන්ම මත්පැන් නිෂ්පාදනය සඳහා එතනෝල් ආනයනය කිරීම අත්හිටුවන ලදී. මීට අමතරව, කොවිඩ්-19 වසංගතය පැතිර යෑම හේතුවෙන් විදේශීය අංශය මත ඇති වූ පීඩනය අඩු කිරීම සඳහා රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 මාර්තු මාසයේ දී තෝරාගත් මෝටර් වාහන සහ අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය කිරීම මාස තුනක කාලයක් සඳහා තාවකාලිකව අත්හිටුවීම ඇතුළුව කඩිනම් ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී.

**දේශීය හා ගෝලීය වශයෙන් මතු වූ බාධා ශ්‍රී ලංකාවේ වෙළඳ කාර්යසාධනයට දිගින් දිගටම අභියෝග කරනු ඇති අතර, ඉදිරි කාලසීමාව තුළ වෙළඳ කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිපත්තිවල ස්ථාවරභාවය, පුළුල් ආයතනික සහාය සහ සාර්ව ආර්ථික ස්ථායීතාව අවශ්‍ය වනු ඇත.** 2019 වසරේ දී දේශීය හා විදේශීය අභියෝග රාශියක් පැන නැගුණ ද, ප්‍රධාන වශයෙන් අත්‍යාවශ්‍ය නොවන කාණ්ඩයේ පාරිභෝගික භාණ්ඩ අධික ලෙස ආනයනය කිරීම සීමා කිරීම සඳහා හඳුන්වා දුන් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මගින් ආනයන වියදම් අඩු වීම හේතුවෙන් වෙළඳ හිඟය සැලකිය යුතු ලෙස අඩු විය. ගෝලීය වෙළඳාමේ නියැලෙන ප්‍රධාන රටවල් විසින් ගනු ලබන ආරක්ෂණ පියවරයන්, එක්සත් රාජධානිය යුරෝපා සංගමයෙන් ඉවත් වීම, ශ්‍රී ලංකාව ඉහළ මැදි ආදායම් ලබන රටක මට්ටමට ළඟාවීමත් සමඟ 2023 වසර වන විට යුරෝපා සංගමයෙන් පිරිනමන ජී.එස්.පී/ජී.එස්.පී.ප්ලස් පහසුකම් අහිමි වීම සහ මෑතක සිට පැතිරී යන කොවිඩ්-19 වසංගතය නිසා ඉල්ලුම් හා සැපයුම් ජාලවලට බාධා සිදු වීම ඉදිරි කාල පරිච්ඡේදය තුළ දී පවතින ප්‍රධාන අභියෝග වනු ඇත. ගෝලීය වෙළඳ ක්ෂේත්‍රයේ ප්‍රධාන රටවල් අතර දැනට පවතින වෙළඳාම ආශ්‍රිත ගැටුම් ශ්‍රී ලංකාවේ විදේශීය වෙළඳ ක්‍රියාකාරිත්වයට සැලකිය යුතු ලෙස බලපානු ඇතැයි අපේක්ෂා නොකෙරුණ ද, ගෝලීය වෙළඳාම හා ගෝලීය ආර්ථික වර්ධනය මන්දගාමී වීමෙන් ශ්‍රී ලංකාවේ වෙළඳ කාර්යසාධනය මත යම් බලපෑමක් ඇති විය හැකිය. ඉන්දියාවට එක්සත් ජනපදය ලබා දී ඇති ජී.එස්.පී. පහසුකම ඉවත් කිරීම සහ යුරෝපා සංගමය සමඟ වියට්නාමය එළඹි නිදහස් වෙළඳ ගිවිසුම වැනි කලාපීය රටවල්වල වෙළඳාම සම්බන්ධ ප්‍රවණතා ද ශ්‍රී ලංකාවේ අපනයන ක්‍රියාකාරිත්වයට යම් බලපෑමක් ඇති කළ හැකිය. නව වෙළඳ හවුල්කරුවන් සමඟ සම්බන්ධතා ඇති කර ගනිමින් පවත්නා වෙළඳ සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීම, හිතකර හා ස්ථාවර විදේශ වෙළඳ ප්‍රතිපත්ති, හැකියාවන් වැඩිදියුණු කිරීම තුළින් ලබාදෙන ආයතනික සහාය, වෙළඳාම මනා සැලැස්මෙන් ලිහිල් කිරීම සහ පුළුල් ලෙස ගත් කළ ස්ථාවර සාර්ව ආර්ථික පරිසරයක් සමඟ අපනයනවල වර්ධන වේගය ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. සමස්තයක් වශයෙන් සියලුම පාර්ශ්වකරුවන් විසින් විදේශ වෙළඳාම සම්බන්ධයෙන් වන ඉඩ ප්‍රස්ථා, අභියෝග සහ පිළියම් පිළිගෙන ඇත. ඉහළ නිෂ්පාදන පිරිවැය හා අවශ්‍ය ශ්‍රමය නොමැතිවීම වැනි සැපයුම් සංරෝධක ඉවත් කිරීම, විභවතාවන් සහිත ගෝලීය අගය දාම සහ නිෂ්පාදන ජාල දියුණු කිරීම සඳහා පර්යේෂණ හා සංවර්ධන තුළින් කරනු ලබන නවෝත්පාදනවල සහාය ඇතිව අපනයන සංස්කෘතියක් නිර්මාණය කිරීම, එකතු කළ අගය වැඩිදියුණු කිරීම, ආයතනික රාමුව ක්‍රමවත් කිරීම, නිලධාරිවාදී බාධක ඉවත් කිරීම සහ වෙළඳාමට හා ආයෝජකයින්ට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම කෙරෙහි ප්‍රමුඛතාව ලබා දිය යුතුය. තවද, ලොව පුරා පාරිභෝගිකයින් විසින් ඉහළ වටිනාකමක් ලබා දෙනු ලබන කාබනික නිෂ්පාදන, පරිසර හිතකාමී නිෂ්පාදන සහ සාධාරණ වෙළඳ භාවිතයන් වැනි තිරසාර නිෂ්පාදන සංකල්ප වෙත ශ්‍රී ලංකාව තවදුරටත් යොමු විය යුතුය. ඒ අනුව, හඳුනාගත් උපායමාර්ග කාලානුරූපව ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වන අතර, නව උපායමාර්ග සඳහා පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය. කල්තියා සැලසුම් කිරීම් තුළින් ඉහළ මැදි ආදායම් ලබන රටක් ලෙස ශ්‍රී ලංකාව පත්වීමේ දී ඇති විය හැකි අවදානම විසඳීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

## 5.3 භාණ්ඩ වෙළඳාම, වෙළඳ ශේෂය, වෙළඳ මිල අනුපාතය සහ වෙළඳ දිශාව


### 5.3.1 අපනයන ක්‍රියාකාරිත්වය

**දේශීය හා විදේශීය අභියෝග ඉහළ යෑම හමුවේ වෙළඳ භාණ්ඩ අපනයන ආදායම 2019 වසරේ දී සුළු වශයෙන් වුව ද, අඛණ්ඩව ඉහළ ගියේය.** වෙළඳ භාණ්ඩ අපනයන ආදායම වසරේ පළමු භාගය තුළ දී ඉහළ වේගයකින් වර්ධනය වුවද, ඉන් අනතුරුව එම වර්ධන වේගය මන්දගාමී වූ අතර, එම නිසා සමස්තයක් ලෙස වසරේ අපනයන වර්ධන වේගය පෙර වසරට සාපේක්ෂව සියයට 0.4කට සීමා විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2018 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 11,890ක් වූ වෙළඳ භාණ්ඩ අපනයන ආදායම 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 11,940ක් ලෙස වාර්තා විය. අපනයන ආදායම ඉහළ යෑම සඳහා කාර්මික අපනයන ආදායම දායක වූ අතර, කෘෂිකාර්මික හා ඛනිජ අපනයන ආදායම පහත වැටුණි.

**සමස්ත අපනයන ආදායමෙන් සියයට 79ක් පමණ වූ කාර්මික භාණ්ඩ අපනයන ආදායම 2019 වසරේ දී ඉහළ ගිය අතර, රෙදිපිළි හා ඇඟලුම් අපනයන වර්ධනය ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.** ඒ අනුව, කාර්මික අපනයන ආදායම 2018 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 9,258ක සිට 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 9,426 දක්වා සියයට 1.8කින් ඉහළ ගියේය. අපනයන සඳහා ඉහළම දායකත්වය සපයමින් රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 5,596ක්

5

### 5.3 රූප සටහන
### අපනයන සංයුතිය - 2019




මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

දක්වා සියයට 5.2කින් ඉහළ ගියේය. 2019 වසරේ දී ඇමෙරිකා එක්සත් ජනපදය වෙත අපනයනය කළ ඇඟලුම්වලින් ලද ආදායම එ.ජ. ඩොලර් මිලියන 2,338ක් දක්වා සියයට 3.0කින් ඉහළ ගියේය. ජී.එස්.පී. ප්ලස් පහසුකම ප්‍රතිස්ථාපනය කිරීමේ ප්‍රතිලාභ ලබා ගනිමින් යුරෝපා වෙළඳපොළ වෙත අපනයනය කළ ඇඟලුම්වලින් ලද ආදායම ද එ.ජ. ඩොලර් මිලියන 2,153ක් දක්වා සියයට 4.9කින් ඉහළ ගිය අතර, යුරෝපා වෙළඳපොළ තුළ තනි විශාලතම ගැනුම්කරුවා වන එක්සත් රාජධානිය වෙත සිදු කළ අපනයනවල වටිනාකම එ.ජ. ඩොලර් මිලියන 747ක් විය. මීට අමතරව, යුරෝපා වෙළඳපොළෙහි ඉතාලිය, ජර්මනිය, බෙල්ජියම සහ නෙදර්ලන්තය මෙන්ම කැනඩාව, ඕස්ට්‍රේලියාව, චීනය, ඉන්දියාව සහ ජපානය 2019 වසරේ දී ශ්‍රී ලංකාවේ ඇඟලුම් සඳහා වූ විශාලතම ගැනුම්කරුවන් අතර විය. ඉන්දියාව, එක්සත් රාජධානිය, ඇමෙරිකා එක්සත් ජනපදය, ජර්මනිය සහ පාකිස්ථානයෙන් වූ ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් 2019 වසරේ දී රෙදිපිළි හා නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය අපනයන ආදායම ද ඉහළ ගියේය. මේ අතර, 2018 වසරේ දී අඩු ආදායමක් වාර්තා කළ මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ අපනයන ආදායම යථා තත්ත්වයට පත්වෙමින් 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 306ක් දක්වා සියයට 10.0කින් ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් ජපානය වෙත නාවික යාත්‍රාවක් අපනයනය කිරීම හේතුවෙන් නැව්, බෝට්ටු හා දිය මත පාවෙන ව්‍යූහ අපනයන ආදායම සැලකිය යුතු ලෙස ඉහළ යෑමත් සමඟ ප්‍රවාහන උපකරණ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 146ක් දක්වා සියයට 21.3කින් ඉහළ ගියේය. සක්‍රීය කාබන් අපනයන ඉහළ යෑම හේතුවෙන් රසායනික නිෂ්පාදිත අපනයන ආදායම ද සියයට 5.7කින් ඉහළ ගියේය. තවද, ප්‍රධාන වශයෙන් යකඩ සහ වානේ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන් මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම සියයට 6.7කින් ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් ආහාර කර්මාන්තයේ අවශේෂ අපනයන ඉහළ යෑම හේතුවෙන් සත්ත්ව ආහාර අපනයන ආදායම ද ඉහළ ගිය අතර, මුදල් නෝට්ටු අපනයන ඉහළ යෑම සමඟ මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගියේය. මීට ප්‍රතිවිරුද්ධව, ප්‍රධාන වශයෙන් නැව් හා ගුවන් යානා ඉන්ධනවලින් සමන්විත බනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 521ක් දක්වා සියයට 16.2කින් පහළ ගියේය. කලාපයේ නාවික වරායන් අතර පවතින ඉහළ තරගකාරිත්වය සහ පාස්කු ඉරු දින සිදු වූ ප්‍රහාරවලින් පසුව සමහර ගුවන් ගමන් නවතා දැමීම හේතුවෙන් ඉන්ධන අපනයන පරිමා අඩු වීම මෙන්ම මිල ගණන් පහළ මට්ටමක පැවතීම හේතුවෙන් නැව් හා ගුවන් යානා ඉන්ධන අපනයන ආදායම පහළ ගියේය. 2019 වසරේ දී ලිහිසි ද්‍රව්‍ය, තාර ඇතුළු අනෙකුත් බනිජ තෙල් නිෂ්පාදිත අපනයනය ද පහළ ගියේය. රබර් අත්වැසුම් අපනයන ආදායම ඉහළ ගිය ද, ටයර් අපනයන පහත වැටීම හේතුවෙන් 2019 වසරේ දී රබර් නිෂ්පාදිත අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 866ක් දක්වා සියයට 1.1කින් පහත වැටුණි. යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 400ක් දක්වා සියයට 8.0කින් අඩු වූ අතර, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ කොටස් අපනයන ඉහළ ගිය ද, අනෙකුත් බොහෝ උප කාණ්ඩවල අපනයන ආදායම පහළ යෑම මේ සඳහා හේතු විය. මීට අමතරව, 2019 වසරේ දී, සකස් කළ දුම්කොළ නිෂ්පාදිත අපනයන අඩු වීම හේතුවෙන් ආහාර, පාන වර්ග හා දුම්කොළ අපනයන ආදායම පහත වැටුණු අතර, සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ සහ පාවහන් අපනයනය යටතේ වන සියලු අපනයන උප කාණ්ඩ ද පහළ ගියේය.

**සමස්ත අපනයනවලින් සියයට 21ක් පමණ වන කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය 2019 වසරේ දී තවදුරටත් පහළ ගියේය.** 2019 වසරේ දී කෘෂිකාර්මික අපනයන ආදායම 2018 වසර හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 2,462ක් දක්වා සියයට 4.6කින් පහළ ගිය අතර, තේ සහ කුළුබඩු අපනයන ආදායම පහළ යෑම ඒ සඳහා හේතු විය. ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන ආදායමෙන් සියයට 11.3ක් වාර්තා කරමින් දෙවැනි විශාලතම දායකත්වය සපයන තේ

5

**5.3 සංඛ්‍යා සටහන**

**අපනයන සංයුතිය**

| කාණ්ඩය | 2018 | | 2019 (අ) | | වටිනාකමේ වෙනස එ.ජ. ඩොලර් මිලියන | වාර්ෂික වෙනස්වීම % | වෙනස් වීමට වූ දායකත්වය % |
|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | දායකත්වය % | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | දායකත්වය % | | | |
| **කෘෂිකාර්මික අපනයන** | **2,579.3** | **21.7** | **2,461.9** | **20.6** | **-117.4** | **-4.6** | **-233.1** |
| තේ | 1,428.5 | 12.0 | 1,346.4 | 11.3 | -82.1 | -5.7 | -162.9 |
| රබර් | 31.6 | 0.3 | 24.2 | 0.2 | -7.4 | -23.4 | -14.7 |
| පොල් | 311.0 | 2.6 | 329.5 | 2.8 | 18.5 | 6.0 | 36.7 |
| කුළුබඩු | 360.2 | 3.0 | 312.5 | 2.6 | -47.7 | -13.2 | -94.6 |
| එළවළු | 28.2 | 0.2 | 32.0 | 0.3 | 3.8 | 13.3 | 7.5 |
| සකස් නොකළ දුම්කොළ | 35.6 | 0.3 | 34.7 | 0.3 | -0.8 | -2.4 | -1.7 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 118.4 | 1.0 | 120.0 | 1.0 | 1.7 | 1.4 | 3.4 |
| මුහුදු ආහාර | 265.8 | 2.2 | 262.5 | 2.2 | -3.4 | -1.3 | -6.7 |
| **කාර්මික අපනයන** | **9,258.2** | **77.9** | **9,426.3** | **78.9** | **168.2** | **1.8** | **333.8** |
| රෙදිපිළි හා ඇඟලුම් | 5,317.7 | 44.7 | 5,596.5 | 46.9 | 278.8 | 5.2 | 553.4 |
| රබර් නිෂ්පාදිත | 875.3 | 7.4 | 866.1 | 7.3 | -9.2 | -1.1 | -18.3 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 622.1 | 5.2 | 521.1 | 4.4 | -101.0 | -16.2 | -200.5 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 278.0 | 2.3 | 305.7 | 2.6 | 27.7 | 10.0 | 55.1 |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 462.3 | 3.9 | 447.0 | 3.7 | -15.3 | -3.3 | -30.4 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 434.8 | 3.7 | 400.0 | 3.3 | -34.8 | -8.0 | -69.1 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 31.7 | 0.3 | 48.3 | 0.4 | 16.6 | 52.4 | 33.0 |
| ප්‍රවාහන උපකරණ | 120.3 | 1.0 | 145.9 | 1.2 | 25.6 | 21.3 | 50.9 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 147.7 | 1.2 | 102.9 | 0.9 | -44.8 | -30.3 | -88.9 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 31.3 | 0.3 | 30.1 | 0.3 | -1.2 | -3.9 | -2.4 |
| අනෙකුත් කාර්මික අපනයන | 937.1 | 7.9 | 962.8 | 8.1 | 25.7 | 2.7 | 51.1 |
| **ඛනිජ අපනයන** | **34.4** | **0.3** | **33.9** | **0.3** | **-0.5** | **-1.4** | **-0.9** |
| **වර්ග නොකළ අපනයන** | **17.8** | **0.1** | **17.9** | **0.2** | **0.1** | **0.6** | **0.2** |
| **මුළු අපනයන (ආ) (ඇ)** | **11,889.6** | **100.0** | **11,940.0** | **100.0** | **50.4** | **0.4** | **100.0** |
| **වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතිකය (ඈ)** | **162.54** | | **178.78** | | | | |

(අ) තාවකාලික
(ආ) ප්‍රතිඅපනයන ඇතුළත් නොවේ.
(ඇ) ගළපන ලද
(ඈ) විනිමය අනුපාතිකය: එ.ජ. ඩොලරයට රුපියල්

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා වෙනත් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයනකරුවන්
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

5

අපනයන ආදායම 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,346ක් දක්වා සියයට 5.7කින් පහත වැටුණි. කෙසේ වුවද, තේ අපනයන පරිමාව 2018 වසරේ දී පැවති කිලෝග්‍රෑම් මිලියන 282 සිට 2019 වසරේ දී කිලෝග්‍රෑම් මිලියන 293ක් දක්වා සියයට 3.6කින් ඉහළ ගිය අතර, තේ අපනයන ආදායම පහත වැටීම සඳහා සාමාන්‍ය අපනයන මිල ගණන් පහළ යෑම මුළුමනින්ම හේතු වූ බව මෙමගින් පිළිබිඹු වේ. කල්කටා (ඉන්දියාව) සහ මුම්බාසා (කෙන්යාව) වෙන්දේසි හා සැසඳීමේ දී කොළඹ තේ වෙන්දේසියෙහි සාමාන්‍ය වෙන්දේසි මිල ගණන් ඉහළ අගයක පැවතිය ද, තේ අපනයන සඳහා වූ සාමාන්‍ය මිල ගණන් 2018 වසරේ පැවති කිලෝග්‍රෑමයට එ.ජ. ඩොලර් 5.06 සිට 2019 වසරේ දී කිලෝග්‍රෑමයට එ.ජ. ඩොලර් 4.60ක් දක්වා සියයට 9.1කින් පහත වැටුණි. වටිනාකම සහ පරිමාව යන දෙආකාරයෙන් ම සැලකීමේ දී ශ්‍රී ලංකාවේ තේ සඳහා ප්‍රධානතම ගැනුම්කරුවා ලෙස තුර්කිය අඛණ්ඩව සිය ස්ථානය පවත්වා ගෙන ඇත. වටිනාකම අනුව සැලකීමේ දී පෙර වසරේ දී මෙන්ම 2019 වසරේ දී ද රුසියාව, ඉරාකය, ඉරානය සහ සිරියාව අනෙකුත් ප්‍රධාන තේ අපනයන ගමනාන්ත වූ අතර, එම රටවල් එක්ව සමස්ත තේ අපනයන ආදායමෙන් සියයට 42ක් සඳහා දායක වී ඇත. 2019 වසරේ දී කුළුබඩු අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 313ක් දක්වා සියයට 13.2කින් පහළ ගිය අතර, දේශීය සැපයුම ඉහළ යෑමත් සමඟ කරාබුනැටි, සාදික්කා සහ වසාවාසි අපනයන ආදායම ඉහළ ගිය ද කුරුඳු සහ ගම්මිරිස් අපනයන පරිමා පහළ යෑම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2019 වසරේ දී මුහුදු ආහාර අපනයන ආදායම සියයට 1.3කින් පහළ ගිය අතර, යුරෝපා වෙළඳපොළ වෙතින් වූ ඉල්ලුම ඉහළ යෑම හමුවේ වුවද, එක්සත් ජනපද වෙළඳපොළ වෙතින් වූ ඉල්ලුම සැලකිය යුතු ලෙස පහළ යෑම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මීට අමතරව, ක්‍රේප් රබර් අපනයන පහළ යෑම හේතුවෙන් 2019 වසරේ දී ස්වාභාවික රබර් අපනයන ආදායම සැලකිය යුතු ලෙස පහළ ගිය අතර, සකස් නොකළ

දුම්කොළ අපනයන ආදායම සුළු වශයෙන් පහළ ගියේය. මීට ප්‍රතිවිරුද්ධව, පොල් අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 330ක් දක්වා සියයට 6.0කින් ඉහළ ගිය අතර, පහළ මිල ගණන් හමුවේ වුවද දිසිදි පොල් මූලික කරගත් පොල්මද ආශ්‍රිත අපනයන සහ පොල් කෙඳි වැනි පොල්මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත අපනයන පරිමා ඉහළ යෑම ඒ සඳහා හේතු විය. මීට අමතරව, 2019 වසරේ දී නැවුම් එළවළු සහ පැපොල්, අඹ, පුවක් සහ බුලත් වැනි සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන පසුගිය වසරට සාපේක්ෂව ඉහළ ගියේය.

**ඛනිජ ද්‍රව්‍ය අපනයන ආදායම 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 34ක් දක්වා සියයට 1.4කින් පහත වැටුණි.** ටයිටේනියම් ලෝපස් අපනයන ඉහළ යෑම හේතුවෙන් ලෝපස්, ලෝබොර හා අළු අපනයන ආදායම ඉහළ ගියද, පාෂාණ සහ ගල් වර්ග අපනයන ආදායම පහළ යෑම හේතුවෙන් සමස්තයක් ලෙස ඛනිජ ද්‍රව්‍ය අපනයන ක්‍රියාකාරිත්වය පහළ ගියේය.


### 5.3.2 ආනයන ක්‍රියාකාරිත්වය

**රජය සහ මහ බැංකුව විසින් 2018 වසරේ අග භාගයේ දී අත්‍යාවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය සීමා කිරීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හේතුවෙන් පසුගිය වසර තුනක කාලය තුළ දී දැකිය හැකි වූ වර්ධන ප්‍රවණතාව වෙනස් කරමින් වෙළඳ භාණ්ඩ ආනයන වියදම 2019 වසරේ දී සැලකිය යුතු ලෙස පහත වැටුණි.** මේ අනුව, ආනයන වියදම 2018 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 22,233ට සාපේක්ෂව 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 19,937ක් දක්වා සියයට 10.3කින් පහත වැටුණි. 2019 වසරේ දී ආනයන පහත වැටීම සඳහා පාරිභෝගික භාණ්ඩ සහ අන්තර් භාණ්ඩ ආනයන වියදම අඩු වීම ප්‍රධාන වශයෙන් දායක වූ අතර, ආයෝජන භාණ්ඩ ආනයන වියදම ද සුළු වශයෙන් පහත වැටුණි. මේ අතර, 2019 වසරේ දී ඉන්ධන ආනයන ඉවත් කළ පසු ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 16,045ක් දක්වා සියයට 11.3කින් පහත වැටුණි.

**සමස්ත ආනයනවලින් සියයට 57ක් වන අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරට සාපේක්ෂව 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 11,370ක් දක්වා සියයට 9.0කින් පහත වැටුණි.** 2019 වසරේ දී ඉන්ධන ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 3,892ක් දක්වා සියයට 6.3කින් පහත වැටුණු අතර, මේ සඳහා බොරතෙල්, පිරිපහදු කළ ඛනිජතෙල් හා ගල් අඟුරු යන සියලුම උප කාණ්ඩවල ආනයන මිල ගණන් පහත වැටීම මෙන්ම පිරිපහදු කළ ඛනිජතෙල් ආනයන පරිමාව පහත වැටීම ද හේතු විය. ජාත්‍යන්තර වෙළඳපොළෙහි තෙල් මිල ගණන් පහත වැටීම හා සමගාමීව බොරතෙල් බැරලයක් සඳහා වූ සාමාන්‍ය ආනයන මිල 2018 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් 76.25ට සාපේක්ෂව 2019 වසරේ දී එ.ජ. ඩොලර් 68.80ක් දක්වා පහත වැටුණි. 2018 වසරේ අප්‍රේල් මාසයේ දී රත්‍රන් ආනයන මත සියයට 15ක තීරු බද්දක් පැනවීම හේතුවෙන් 2019 වසරේ දී රත්‍රන් ආනයනය පහත වැටීම නිසා දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග ආනයන වියදම සැලකිය යුතු ලෙස පහත වැටුණි. යකඩ හා වානේ ආනයනය පහත වැටීම හේතුවෙන් 2019 වසරේ දී මූල ලෝහ ආනයන වියදම සියයට 17.6කින් පහත වැටුණි. තිරිඟු සඳහා වන සාමාන්‍ය ආනයන මිල ගණන් ඉහළ ගිය ද, ආනයන පරිමාව අඩු වීම හේතුවෙන් තිරිඟු ආනයන වියදම පහත වැටුණු අතර, ප්‍රධාන වශයෙන් යූරියා ආනයන පරිමාව අඩු වීම හේතුවෙන් පොහොර ආනයන වියදම පහත වැටුණි. ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත, කඩදාසි, ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත, ආහාර සැකසුම්, රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ රථවාහන හා යන්ත්‍රසූත්‍ර කොටස් ඇතුළු අන්තර් භාණ්ඩ යටතේ වර්ග කර ඇති වෙනත් බොහෝ උප කාණ්ඩ ආනයන ද පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. කෙසේ වුවද, 2019 වසරේ දී රෙදිපිළි හා ඇඟලුම් අපනයනය ඉහළ යෑම හා සමගාමීව, කෙඳි වර්ග සහ රෙදි වර්ග ආනයනය ඉහළ යෑම හේතුවෙන් රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම ඉහළ ගියේය.

**5.4 රූප සටහන**

**ආනයන සංයුතිය - 2019**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

මීට අමතරව, පෙර වසරට සාපේක්ෂව 2019 වසරේ දී සිමෙන්ති ක්ලින්කර ආනයනය සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් ඛනිජ නිෂ්පාදිත ආනයන වියදම ඉහළ ගියේය.

**ආහාර හා පාන වර්ග සහ ආහාරමය නොවන පරිභෝගික භාණ්ඩ යන දෙඅංශයෙහිම ආනයන වියදම පහත වැටීමත් සමඟ සමස්ත වියදමෙන් සියයට 20ක් පමණ වන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සැලකිය යුතු ලෙස පහත වැටුණි.** ඒ අනුව, පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2018 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 4,980ට සාපේක්ෂව 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 3,957ක් දක්වා සියයට 20.5කින් පහත වැටුණි. මුහුදු ආහාර, එළවළු සහ කුළුබඩු හැර අනෙකුත් ප්‍රධාන ආහාර කාණ්ඩ ආනයන පහත වැටීමේ ප්‍රතිඵලයක් ලෙස ආහාර හා පාන වර්ග ආනයන වියදම සියයට 11.2 කින් පහත වැටුණි. ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත යටතේ වර්ග කර ඇති සහල් ආනයන වියදම කැපී පෙනෙන ලෙස පහත වැටුණු අතර, ඒ සඳහා සහල් ආනයන පරිමාව 2018 වසරට සාපේක්ෂව 2019 වසරේ දී අඩු වීම හේතු විය. ඒ අනුව, 2019 වසරේ දී දේශීය වී අස්වැන්න ඉහළ යෑම හේතුවෙන් සහල් ආනයන පරිමාව 2018 වසරේ දී වාර්තා වූ කිලෝග්‍රෑම් මිලියන 249ට සාපේක්ෂව 2019 වසරේ දී කිලෝග්‍රෑම් මිලියන 24ක් දක්වා පහත වැටුණි. සීනි ආනයන පරිමාව සහ සාමාන්‍ය ආනයන මිල ගණන් සැලකිය යුතු ලෙස පහත වැටීම හේතුවෙන් 2019 වසරේ දී සීනි හා රසකැවිලි ආනයන වියදම සියයට 19.4කින් පහත වැටුණි. තවද, කිරිපිටි සඳහා වූ සාමාන්‍ය මිල ගණන් සුළු වශයෙන් ඉහළ ගිය ද, ආනයන පරිමාව අඩු වීම හේතුවෙන් 2019 වසරේ දී කිරි නිෂ්පාදිත ආනයන වියදම සියයට 6.1කින් පහත වැටුණි. මීට අමතරව, 2018 වසරට සාපේක්ෂව 2019 වසරේ දී පොල්තෙල් ආනයනය

**5.4 සංඛ්‍යා සටහන**

**ආනයන සංයුතිය**

| කාණ්ඩය | 2018 | | 2019 (අ) | | වටිනාකමේ වෙනස එ.ජ. ඩොලර් මිලියන | වාර්ෂික වෙනස්වීම % | වෙනස්වීමට වූ දායකත්වය % |
|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | දායකත්වය % | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | දායකත්වය % | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | **4,979.7** | **22.4** | **3,956.5** | **19.8** | **-1,023.2** | **-20.5** | **44.6** |
| ආහාර හා පාන වර්ග | 1,606.1 | 7.2 | 1,426.9 | 7.2 | -179.1 | -11.2 | 7.8 |
| සහල් | 106.8 | 0.5 | 12.8 | 0.1 | -94.0 | -88.0 | 4.1 |
| සීනි හා රසකැවිලි | 249.7 | 1.1 | 201.2 | 1.0 | -48.5 | -19.4 | 2.1 |
| කිරි නිෂ්පාදිත | 332.3 | 1.5 | 311.9 | 1.6 | -20.4 | -6.1 | 0.9 |
| පරිප්පු | 78.6 | 0.4 | 79.9 | 0.4 | 1.3 | 1.6 | -0.1 |
| වෙනත් | 838.7 | 3.8 | 821.2 | 4.1 | -17.5 | -2.1 | 0.8 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 3,373.6 | 15.2 | 2,529.6 | 12.7 | -844.0 | -25.0 | 36.8 |
| පෞද්ගලික රථවාහන | 1,573.5 | 7.1 | 815.7 | 4.1 | -757.9 | -48.2 | 33.0 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 532.0 | 2.4 | 552.6 | 2.8 | 20.7 | 3.9 | -0.9 |
| ගෘහ උපකරණ | 232.2 | 1.0 | 206.6 | 1.0 | -25.6 | -11.0 | 1.1 |
| රෙදිපිළි හා උපාංග | 310.3 | 1.4 | 275.1 | 1.4 | -35.1 | -11.3 | 1.5 |
| වෙනත් | 725.6 | 3.3 | 679.6 | 3.4 | -46.1 | -6.3 | 2.0 |
| **අන්තර් භාණ්ඩ** | **12,488.0** | **56.2** | **11,369.6** | **57.0** | **-1,118.4** | **-9.0** | **48.7** |
| ඉන්ධන | 4,151.9 | 18.7 | 3,891.6 | 19.5 | -260.3 | -6.3 | 11.3 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 2,858.5 | 12.9 | 2,909.4 | 14.6 | 50.9 | 1.8 | -2.2 |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 572.7 | 2.6 | 201.4 | 1.0 | -371.3 | -64.8 | 16.2 |
| රසායනික නිෂ්පාදිත | 904.2 | 4.1 | 831.5 | 4.2 | -72.8 | -8.0 | 3.2 |
| තිරිඟු හා ඉරිඟු | 373.5 | 1.7 | 346.4 | 1.7 | -27.1 | -7.3 | 1.2 |
| පොහොර | 261.6 | 1.2 | 221.4 | 1.1 | -40.2 | -15.4 | 1.7 |
| අනෙකුත් අන්තර් භාණ්ඩ | 3,365.6 | 15.1 | 2,967.9 | 14.9 | -397.7 | -11.8 | 17.3 |
| **ආයෝජන භාණ්ඩ** | **4,690.4** | **21.1** | **4,602.6** | **23.1** | **-87.7** | **-1.9** | **3.8** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 1,524.5 | 6.9 | 1,508.7 | 7.6 | -15.8 | -1.0 | 0.7 |
| ප්‍රවාහන උපකරණ | 668.1 | 3.0 | 596.6 | 3.0 | -71.6 | -10.7 | 3.1 |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 2,491.6 | 11.2 | 2,489.7 | 12.5 | -1.9 | -0.1 | 0.1 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 6.1 | 0.03 | 7.6 | 0.04 | 1.5 | 25.5 | -0.1 |
| **වර්ග නොකළ ආනයන** | **74.6** | **0.3** | **8.3** | **0.04** | **-66.4** | **-88.9** | **2.9** |
| **මුළු ආනයන (ආ) (ඇ)** | **22,232.7** | **100.0** | **19,937.1** | **100.0** | **-2,295.6** | **-10.3** | **100.0** |
| **වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතිකය (ඈ)** | **162.54** | | **178.78** | | | | |

(අ) තාවකාලික
(ආ) ප්‍රතිආනයන ඇතුළත් නොවේ.
(ඇ) ගළපන ලද
(ඈ) විනිමය අනුපාතිකය: එ.ජ. ඩොලරයට රුපියල්

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

5

අඩු වීම හේතුවෙන් තෙල් හා මේද ආනයන වියදම ද, සකස් කළ පලතුරු වර්ග ආනයනය අඩු වීම හේතුවෙන් පලතුරු ආනයන වියදම ද මධ්‍යසාර සහිත පාන වර්ග ආනයනය අඩු වීම හේතුවෙන් පාන වර්ග ආනයන වියදම ද පහත වැටුණි. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් ටින් කළ මාළු ආනයන ඉහළ යෑම හේතුවෙන් 2019 වසරේ දී මුහුදු ආහාර ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 215ක් දක්වා සියයට 8.8කින් ඉහළ ගියේය. මීට අමතරව, 2019 වසරේ දී, සුදු ළූණු, මයිසූර් පරිප්පු, ලොකු ළූණු සහ අර්තාපල් ආනයන වියදම ඉහළ යෑම සමඟ එළවළු ආනයන වියදම ඉහළ ගිය අතර, මිරිස් ආනයන මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් කුළුබඩු ආනයන වියදම සුළු වශයෙන් ඉහළ ගියේය.

**ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහත වැටීම සඳහා ප්‍රධාන වශයෙන් පෞද්ගලික රථවාහන ආනයන වියදම සැලකිය යුතු ලෙස අඩු වීම හේතු විය.** 2018 වසරේ අග භාගයේ දී පෞද්ගලික රථවාහන ආනයන සීමා කිරීම සඳහා ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින් පෞද්ගලික රථවාහන ආනයන වියදම 2018 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,574ක් වූ වාර්තාගත අගයක සිට 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 816ක් දක්වා සියයට 48.2කින් සැලකිය යුතු ලෙස පහළ ගියේය. මෙම ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාර දක්වමින් 2018 වසරේ දෙසැම්බර් මාසයේ සිට පෞද්ගලික රථවාහන ආනයන වියදම අඩු විය. 2019 වසරේ පළමු භාගයේ දී පෞද්ගලික රථවාහන ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 324ක් දක්වා සියයට 60.1කින් පහත වැටුණි. කෙසේ වුවද, 2019 වසරේ මාර්තු මාසයේ දී ඉදිරිපත් කළ 2019 වසර සඳහා වූ අයවැය මගින් තෝරාගත් පෞද්ගලික රථවාහන කාණ්ඩ මත නිෂ්පාදන බදු තවදුරටත් ඉහළ දැමූ අතර, එමගින් 2018 වසරේ දී රථවාහන ආනයනය සඳහා වූ ඉහළ වියදම් අඩු කිරීම සඳහා ගනු ලැබූ සාර්ව විචක්ෂණශීලී ප්‍රතිපත්ති යම්තාක් දුරකට ලිහිල් කිරීමට අවකාශ සැලසුණි. ඒ අනුව, 2019 වසරේ මාර්තු - අප්‍රේල් කාලය තුළ දී ආන්තික තැන්පතු අවශ්‍යතාව සහ සහනදායී බලපත්‍ර භාවිතා කරමින් ණයවර ලිපි යටතේ රථවාහන ආනයනය නැවැත්වීම ආදී සීමා ඉවත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, සහනදායී බලපත්‍ර යටතේ රථවාහන ආනයනය නැවත ආරම්භ කිරීම හේතුවෙන් 2019 වසරේ දෙවැනි භාගයේ දී පෞද්ගලික රථවාහන ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 491ක් දක්වා ඉහළ ගියේය. අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය මත පනවා තිබූ ආන්තික තැන්පතු අවශ්‍යතාව සහ එවැනි භාණ්ඩ ආනයනය කිරීම සඳහා විදේශ විනිමය නිකුත් කිරීම සම්බන්ධයෙන් පනවා තිබූ සීමා ද 2019 වසරේ මාර්තු මාසයේ දී ඉවත් කරන ලදී. කෙසේ වුවද, 2018 වසරට සාපේක්ෂව 2019 වසරේ දී රෙදිපිළි හා උපාංග (සියයට 11.3කින්), ගෘහ උපකරණ (සියයට 11.0කින්), විදුලි සන්දේශ මෙවලම් (සියයට 9.3කින්), රබර් නිෂ්පාදිත (සියයට 12.9කින්) සහ විලවුන් වර්ග හා සේදුම් ද්‍රව්‍ය (සියයට 8.4කින්) සඳහා වූ ආනයන වියදම්හි පහළ යෑමක් වාර්තා විය. මීට ප්‍රතිවිරුද්ධව, 2019 වසරේ දී පෙර වසරට සාපේක්ෂව ඖෂධ ආනයනය ඉහළ යෑම හේතුවෙන් බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත ආනයනය ඉහළ ගිය අතර, ප්ලාස්ටික් මුළුතැන්ගෙයි උපකරණ ආනයන ඉහළ යෑම හේතුවෙන් ගෘහ හා දැව භාණ්ඩ ආනයන ඉහළ ගියේය. කෙසේ වුවද, කොවිඩ්-19 වසංගතය පැතිර යෑම හේතුවෙන් විනිමය අනුපාතිකය මත ඇතිවන පීඩනය ලිහිල් කිරීම සහ

**5.5 සංඛ්‍යා සටහන**

**ප්‍රධාන ආනයනවල පරිමාවන්**

මෙට්‍රික් ටොන් දහස්

| ශීර්ෂය | 2015 | 2016 | 2017 | 2018 | 2019 (අ) |
|---|---|---|---|---|---|
| **සහල්** | **286** | **30** | **748** | **249** | **24** |
| පළමු කාර්තුව | 176 | 6 | 259 | 203 | 8 |
| දෙවන කාර්තුව | 91 | 9 | 79 | 37 | 3 |
| තෙවන කාර්තුව | 9 | 6 | 160 | 2 | 5 |
| සිව්වන කාර්තුව | 9 | 8 | 250 | 7 | 8 |
| **තිරිඟු** | **1,208** | **948** | **1,250** | **1,297** | **1,159** |
| පළමු කාර්තුව | 242 | 171 | 291 | 412 | 164 |
| දෙවන කාර්තුව | 342 | 326 | 334 | 329 | 318 |
| තෙවන කාර්තුව | 373 | 271 | 359 | 285 | 292 |
| සිව්වන කාර්තුව | 251 | 179 | 265 | 271 | 385 |
| **සීනි** | **624** | **651** | **498** | **645** | **556** |
| පළමු කාර්තුව | 169 | 147 | 108 | 205 | 140 |
| දෙවන කාර්තුව | 161 | 144 | 158 | 166 | 153 |
| තෙවන කාර්තුව | 156 | 179 | 101 | 119 | 100 |
| සිව්වන කාර්තුව | 137 | 181 | 132 | 154 | 164 |
| **බොරතෙල් (ආ)** | **1,763** | **1,685** | **1,591** | **1,674** | **1,842** |
| පළමු කාර්තුව | 369 | 372 | 282 | 283 | 461 |
| දෙවන කාර්තුව | 355 | 456 | 376 | 459 | 460 |
| තෙවන කාර්තුව | 472 | 384 | 464 | 461 | 461 |
| සිව්වන කාර්තුව | 567 | 473 | 469 | 471 | 460 |
| **පිරිපහදු කළ ඛනිජ තෙල් (ආ)** | **3,321** | **3,885** | **4,895** | **4,959** | **4,740** |
| පළමු කාර්තුව | 799 | 830 | 1,275 | 1,382 | 1,199 |
| දෙවන කාර්තුව | 952 | 1,163 | 1,123 | 1,207 | 1,206 |
| තෙවන කාර්තුව | 744 | 749 | 1,336 | 1,317 | 1,211 |
| සිව්වන කාර්තුව | 826 | 1,142 | 1,161 | 1,054 | 1,124 |
| **පොහොර** | **873** | **527** | **399** | **861** | **707** |
| පළමු කාර්තුව | 163 | 139 | 78 | 256 | 148 |
| දෙවන කාර්තුව | 244 | 135 | 73 | 154 | 142 |
| තෙවන කාර්තුව | 189 | 126 | 129 | 225 | 238 |
| සිව්වන කාර්තුව | 277 | 127 | 119 | 226 | 179 |

(අ) තාවකාලික
(ආ) ගලපන ලද


මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

5

මූල්‍ය වෙළඳපොළ තුළ ඇතිවන නොසන්සුන්කාරී බව වැළැක්වීම සඳහා රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 මාර්තු මස සිට බලපැවැත්වෙන පරිදි රථවාහන සහ අත්‍යාවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය කිරීම සඳහා පහසුකම් සැලසීම තාවකාලිකව අත්හිටුවීම ඇතුළු කඩිනම් ක්‍රියාමාර්ග ගණනාවක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව, තෝරාගත් රථවාහන ණයවර ලිපි යටතේ ආනයනය කිරීමට සහ ඇතැම් අත්‍යාවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ණයවර ලිපි, ප්‍රතිග්‍රහණය මත ලියවිලි ලබා දීමේ කොන්දේසි මත සහ පෙර ගෙවීම් ක්‍රමය යටතේ ආනයනය කිරීමට පහසුකම් සැලසීම තාවකාලිකව අත්හිටුවන ලෙස ලියාපදිංචි වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත නියෝග කරන ලදී.

**සමස්ත ආනයන වියදමෙන් සියයට 23ක් පමණ වන ආයෝජන භාණ්ඩ ආනයන වියදම, සියලුම උප කාණ්ඩවල ආනයන වියදම පහත වැටීමත් සමග සුළු වශයෙන් පහළ ගියේය.** ඒ අනුව, ආයෝජන භාණ්ඩ ආනයන වියදම 2018 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 4,690 සිට 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 4,603ක් දක්වා සියයට 1.9කින් පහත වැටුණි. යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 2,490ක් දක්වා සියයට 0.1කින් සුළු වශයෙන් පහත වැටුණි. මේ තුළින් වෛද්‍ය හා රසායනාගාර උපකරණ, විද්‍යුත් මෝටර් හා විදුලි ජනක කට්ටල සහ ඉංජිනේරු උපකරණ ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් ඇති වූ බලපෑම යන්ත්‍රසූත්‍ර හා උපකරණ කොටස්, කාර්යාලයීය යන්ත්‍ර, විදුලි සන්දේශ මෙවලම් සහ රෙදිපිළි කර්මාන්තය සඳහා භාවිත කරනු ලබන යන්ත්‍ර ආනයන වියදම පහත වැටීම මගින් සමනය වූ බව පිළිබිඹු විය. ප්‍රවාහන උපකරණ ආනයන වියදම සියයට 10.7කින් සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, දුම්රිය එන්ජින්, මැදිරි හා වෙනත් දුම්රිය උපකරණ ආනයන වියදම සැලකිය යුතු ලෙස ඉහළ ගිය ද වාණිජ කටයුතු සඳහා යොදාගන්නා රථවාහන කාණ්ඩ, නැව් හා බෝට්ටු, ගුවන් යානා හා ගුවන් යානා කොටස් වර්ග සඳහා වූ ආනයන වියදම පහත වැටීම ඒ සඳහා හේතු විය. 2019 වසරේ දී පාලම් තැනීම සඳහා ගන්නා අමුද්‍රව්‍ය ආනයනය ඉහළ යෑම හේතුවෙන් යකඩ හා වානේ උපාංග ආනයනය කැපී පෙනෙන ලෙස ඉහළ ගියද, ආර්ථික ක්‍රියාකාරකම් සමස්තයක් ලෙස මන්දගාමී වීම පිළිබිඹු කරමින් යකඩ හා වානේ, සිමෙන්ති, ප්ලාස්ටික්, රබර් හා වීදුරු උපකරණ, දැව නිෂ්පාදිත, පිඟන් මැටි නිෂ්පාදිත, ඛනිජ නිෂ්පාදිත සහ පරිවරණය කරන ලද කම්බි හා රැහැන් වැනි වෙනත් උප කාණ්ඩ යටතේ වර්ග කර ඇති බොහෝ අයිතම ආනයනය පහත වැටීම හේතුවෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,509ක් දක්වා සියයට 1.0කින් පහත වැටුණි.

5.5 රූප සටහන
අපනයන, ආනයන සහ වෙළඳ හිඟය
(එ.ජ. ඩොලර් බිලියන)




මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

### 5.3.3. වෙළඳ ශේෂය

**පසුගිය වසර පහ තුළ දී අඛණ්ඩව පුළුල් වූ වෙළඳ හිඟුමේ හිඟය 2019 වසරේ දී සැලකිය යුතු ලෙස අඩු විය.** වෙළඳ හිඟය අඩු වීම සඳහා 2018 වසරේ අග භාගයේ දී අත්‍යාවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය සීමා කිරීම සඳහා ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හේතුවෙන් ආනයන වියදම අඩු වීම මෙන්ම අපනයන ආදායම සුළු වශයෙන් ඉහළ යෑම හේතු විය. ඒ අනුව, 2019 වසරේ දී වෙළඳ හිඟය 2018 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 10,343ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 7,997ක් දක්වා එ.ජ. ඩොලර් මිලියන 2,346කින් අඩු විය. මෙය 2013 වසරට පසුව වෙළඳ හිඟයෙහි වාර්තා වූ අඩුම අගය විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස වෙළඳ හිඟය 2018 වසරේ දී වාර්තා වූ සියයට 11.7ට සාපේක්ෂව 2019 වසරේ දී සියයට 9.5ක් දක්වා අඩු විය.

### 5.3.4 වෙළඳ මිල අනුපාතය

**ශ්‍රී ලංකාවේ අපනයන භාණ්ඩවල මිල ගණන් සහ ආනයන භාණ්ඩවල මිල ගණන් අතර අනුපාතය දැක්වෙන වෙළඳ මිල අනුපාතය 2019 වසරේ දී පහත වැටුණි.** මෙම වසර තුළ දී අපනයන මිල දර්ශකය දර්ශකාංක 94.1ක් දක්වා සියයට 6.3කින් පහත වැටුණු අතර, ආනයන මිල දර්ශකය දර්ශකාංක 90.5ක් දක්වා සියයට 4.8කින් පහත වැටුණි. ආනයන මිල දර්ශකය පහළ යෑමේ වේගයට වඩා වැඩි වේගයකින් අපනයන

5

මිල දර්ශකය පහත වැටීම හේතුවෙන් වෙළඳ මිල අනුපාතය 2018 වසරේ දී වාර්තා වූ දර්ශකාංක 105.6 සිට 2019 වසරේ දී දර්ශකාංක 103.9ක් දක්වා සියයට 1.6කින් පහත වැටුණි.

**සියලුම ප්‍රධාන අපනයන කාණ්ඩවල මිල ගණන් පහත වැටීම පිළිබිඹු කරමින් 2019 වසරේ දී සමස්ත අපනයන මිල දර්ශකය පහත වැටුණි.** මෙම වසර තුළදී කාර්මික අපනයන මිල දර්ශකය සියයට 5.4 කින් පහත වැටුණු අතර, මේ සඳහා ජාත්‍යන්තර වෙළඳපොළෙහි මිල ගණන් පහළ යෑම හා සමගාමීව ඛනිජ තෙල් නිෂ්පාදිත මිල ගණන් සියයට 14.7කින් පහත වැටීම ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, මූල ලෝහ හා උපාංග සහ දැව හා කඩදාසි නිෂ්පාදිත මිල ගණන් පිළිවෙළින් සියයට 18.9කින් සහ සියයට 17.9කින් පහත වැටුණි. මීට අමතරව, මෙම කාලපරිච්ඡේදය තුළ දී, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ සහ රෙදිපිළි හා ඇඟලුම් සඳහා වූ මිල දර්ශක පහත වැටුණි. කෙසේ වුවද, 2019 වසරේ දී කාර්මික අපනයන යටතේ වර්ග කර ඇති ප්‍රවාහන උපකරණ, රසායනික නිෂ්පාදිත සහ රබර් නිෂ්පාදිත සඳහා වූ මිල දර්ශක ඉහළ ගියේය. මේ අතර, ප්‍රධාන වශයෙන් තේ, රබර් හා පොල් යන සාම්ප්‍රදායික අපනයන ද්‍රව්‍යවල මිල ගණන් පහත වැටීම හේතුවෙන් 2019 වසරේ දී කෘෂිකාර්මික අපනයන මිල දර්ශකය සියයට 9.5කින් පහත වැටුණි. තේ සඳහා වූ මිල දර්ශකය සියයට 9.3කින් පහත වැටුණු අතර, රබර් සහ පොල් සඳහා වූ මිල දර්ශක පිළිවෙළින්

**5.6 සංඛ්‍යා සටහන**

**වෙළඳ දර්ශක (අ)**

2010 = 100


| කාණ්ඩය | වටිනාකම් දර්ශකය | | | පරිමා දර්ශකය | | | ඒකක වටිනාකම් දර්ශකය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2018 | 2019 (ආ) | වාර්ෂික වෙනස්වීම% | 2018 | 2019 (ආ) | වාර්ෂික වෙනස්වීම% | 2018 | 2019 (ආ) | වාර්ෂික වෙනස්වීම% |
| **අපනයන** | | | | | | | | | |
| **කෘෂිකාර්මික අපනයන** | **111.9** | **106.8** | **-4.6** | **92.6** | **97.7** | **5.5** | **120.8** | **109.3** | **-9.5** |
| තේ | 99.2 | 93.5 | -5.7 | 85.5 | 88.8 | 3.9 | 116.0 | 105.3 | -9.3 |
| රබර් | 18.2 | 14.0 | -23.4 | 26.7 | 24.0 | -10.1 | 68.4 | 58.3 | -14.8 |
| පොල් | 187.8 | 198.9 | 6.0 | 132.8 | 177.6 | 33.8 | 141.4 | 112.0 | -20.8 |
| කුළුබඩු | 173.9 | 150.9 | -13.2 | 120.5 | 115.0 | -4.6 | 144.3 | 131.2 | -9.1 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 165.7 | 168.1 | 1.4 | 162.0 | 163.0 | 0.6 | 102.3 | 103.1 | 0.8 |
| **කාර්මික අපනයන** | **152.0** | **154.7** | **1.8** | **158.7** | **170.8** | **7.6** | **95.7** | **90.6** | **-5.4** |
| රෙදිපිළි හා ඇඟලුම් | 158.6 | 166.9 | 5.2 | 132.4 | 143.2 | 8.2 | 119.8 | 116.6 | -2.7 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 236.3 | 198.0 | -16.2 | 251.1 | 246.7 | -1.8 | 94.1 | 80.3 | -14.7 |
| රබර් නිෂ්පාදිත | 157.2 | 155.6 | -1.1 | 111.4 | 109.4 | -1.8 | 141.1 | 142.2 | 0.7 |
| **ඛනිජ අපනයන** | **141.8** | **139.9** | **-1.4** | **99.3** | **98.2** | **-1.1** | **142.8** | **142.4** | **-0.2** |
| **මුළු අපනයන** | **137.9** | **138.5** | **0.4** | **137.3** | **147.2** | **7.2** | **100.4** | **94.1** | **-6.3** |
| **ආනයන** | | | | | | | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | **201.3** | **159.9** | **-20.5** | **183.4** | **145.4** | **-20.7** | **109.7** | **110.0** | **0.2** |
| ආහාර හා පාන වර්ග | 121.4 | 107.9 | -11.2 | 129.5 | 120.5 | -7.0 | 93.8 | 89.5 | -4.5 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 293.0 | 219.7 | -25.0 | 245.3 | 174.0 | -29.1 | 119.4 | 126.3 | 5.7 |
| **අන්තර් භාණ්ඩ** | **155.2** | **141.3** | **-9.0** | **162.2** | **156.0** | **-3.8** | **95.6** | **90.5** | **-5.3** |
| ඉන්ධන | 136.5 | 128.0 | -6.3 | 152.5 | 151.8 | -0.5 | 89.5 | 84.3 | -5.8 |
| පොහොර | 108.9 | 92.2 | -15.4 | 136.0 | 119.5 | -12.1 | 80.1 | 77.1 | -3.7 |
| රසායනික නිෂ්පාදිත | 173.9 | 159.9 | -8.0 | 165.2 | 155.7 | -5.8 | 105.3 | 102.7 | -2.4 |
| තිරිඟු සහ ඉරිඟු | 140.7 | 130.5 | -7.3 | 134.2 | 127.5 | -5.0 | 104.8 | 102.3 | -2.4 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 158.0 | 160.8 | 1.8 | 144.3 | 153.9 | 6.6 | 109.5 | 104.5 | -4.5 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 164.9 | 144.9 | -12.1 | 166.9 | 158.5 | -5.0 | 98.8 | 91.4 | -7.5 |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 151.7 | 53.3 | -64.8 | 169.1 | 66.5 | -60.7 | 89.7 | 80.2 | -10.6 |
| **ආයෝජන භාණ්ඩ** | **170.2** | **167.1** | **-1.9** | **208.2** | **211.5** | **1.6** | **81.8** | **79.0** | **-3.4** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 185.5 | 183.6 | -1.0 | 212.1 | 215.1 | 1.5 | 87.5 | 85.3 | -2.5 |
| ප්‍රවාහන උපකරණ | 112.8 | 100.7 | -10.7 | 109.3 | 93.7 | -14.3 | 103.1 | 107.5 | 4.2 |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 186.3 | 186.1 | -0.1 | 249.6 | 261.5 | 4.8 | 74.6 | 71.2 | -4.6 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 181.7 | 228.0 | 25.5 | 181.9 | 220.4 | 21.2 | 99.9 | 103.5 | 3.6 |
| **මුළු ආනයන** | **165.8** | **148.7** | **-10.3** | **174.3** | **164.2** | **-5.8** | **95.1** | **90.5** | **-4.8** |
| **වෙළඳ මිල අනුපාතය** | | | | | | | **105.6** | **103.9** | **-1.6** |

(අ) එ.ජ. ඩොලර් වටිනාකම අනුව
(ආ) තාවකාලික

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

**5.6 රූප සටහන**

**වෙළඳ මිල අනුපාතය සහ වෙළඳ දර්ශක**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සියයට 14.8කින් සහ සියයට 20.8කින් පහත වැටුණි. මෙම වසර තුළ දී කුළුබඩු, සකස් නොකළ දුම්කොළ සහ මුහුදු ආහාර සඳහා වන මිල දර්ශක පහත වැටුණු අතර, එළවළු සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත සඳහා වූ මිල දර්ශක ඉහළ ගියේය. ඛනිජ නිෂ්පාදිත සඳහා වන මිල දර්ශකය ද 2018 වසරට සාපේක්ෂව 2019 වසරේ දී සියයට 0.2කින් සුළු වශයෙන් පහත වැටුණි.

**ප්‍රධාන වශයෙන් අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයන සඳහා වූ මිල ගණන් පහත වැටීම හේතුවෙන් 2019 වසරේ දී සමස්ත ආනයන මිල දර්ශකය පහත වැටුණි.** රථවාහන හා යන්ත්‍රසූත්‍ර කොටස් සඳහා වූ මිල දර්ශකය හැර බොහෝදුරට අනෙකුත් සියලුම උප කාණ්ඩවල මිල ගණන් පහත වැටීම හේතුවෙන් අන්තර් භාණ්ඩ ආනයන මිල දර්ශකය සියයට 5.3කින් පහත වැටුණි. ඉන්ධන සඳහා වූ මිල දර්ශකය සියයට 5.8කින් පහත වැටුණු අතර, මූල ලෝහ සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සඳහා වූ මිල දර්ශක පිළිවෙළින් සියයට 11.2කින් හා සියයට 7.5කින් පහත වැටුණි. මීට අමතරව, මෙම කාලපරිච්ඡේදය තුළ දී කෘෂිකාර්මික යෙදවුම්, රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත, දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග, තිරිඟු හා ඉරිඟු සහ පොහොර සඳහා වූ මිල දර්ශක පහත වැටුණි. 2019 වසරේ දී ආයෝජන භාණ්ඩ සඳහා වූ මිල දර්ශකය පෙර වසරට සාපේක්ෂව සියයට 3.4කින් පහත වැටුණු අතර, ඒ සඳහා යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා වූ මිල ගණන් පිළිවෙළින් සියයට 4.6කින් සහ සියයට 2.5කින් පහත වැටීම ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, 2019 වසරේ දී ප්‍රවාහන උපකරණ සඳහා වූ මිල ගණන් සියයට 4.2කින් ඉහළ ගියේය. ආහාර හා පාන වර්ග සඳහා වූ මිල දර්ශකය පහත වැටුණ ද, ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ මිල ගණන් සියයට 5.7කින් ඉහළ යෑම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ ආනයන මිල දර්ශකය සියයට 0.2කින් සුළු වශයෙන් ඉහළ ගියේය. ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ යටතේ වර්ග කර ඇති රථවාහන සඳහා වූ මිල දර්ශකය සියයට 12.3කින් ඉහළ ගිය අතර, රෙදිපිළි හා උපාංග, ගෘහ හා දැව භාණ්ඩ සහ රබර් නිෂ්පාදිත සඳහා වූ මිල දර්ශක ද ඉහළ ගියේය. කෙසේ වුවද, 2019 වසරේ දී විදුලි සංදේශ මෙවලම්, ගෘහ භාණ්ඩ සහ බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත ආනයනය සඳහා වූ මිල ගණන් පහත වැටුණි. ප්‍රධාන වශයෙන් ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත සහ සීනි හා රසකැවිලි සඳහා වූ මිල දර්ශක පිළිවෙළින් සියයට 21.9කින් සහ සියයට 10.9කින් පහත වැටීම හේතුවෙන් ආහාර හා පාන වර්ග සඳහා වූ මිල දර්ශකය සියයට 4.5කින් පහත වැටුණි. තෙල් හා මේද, කිරි නිෂ්පාදිත සහ එළවළු සඳහා වූ ආනයන මිල දර්ශක ද පහත වැටුණි. කෙසේ වුව ද, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී මුහුදු ආහාර සහ කුළුබඩු සඳහා වූ ආනයන මිල දර්ශක ඉහළ ගියේය.

### 5.3.5 වෙළඳ දිශාව


**2019 වසරේ දී ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් පෙර වසර හා සැසඳීමේ දී බොහෝදුරට නොවෙනස්ව පැවතුණි.** වටිනාකම අනුව සැලකූ විට, 2019 වසරේ දී ශ්‍රී ලංකාවේ ප්‍රධානතම වෙළඳ හවුල්කරුවා ලෙස ඉන්දියාව ද, ඉන් අනතුරුව චීනය සහ ඇමෙරිකා එක්සත් ජනපදය ද ප්‍රධාන හවුල්කරුවන් වූ අතර එම රටවල් තුන ශ්‍රී ලංකාවේ සමස්ත විදේශ වෙළඳාමෙන් සියයට 40කට පමණ දායක විය. කෙසේ වුවද, 2018 වසරේ දී ඉන්දියාව සමඟ සිදු කළ මුළු වෙළඳ ගනුදෙනු ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 5 ඉක්ම වුවද, එම ප්‍රමාණය 2019 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 4.7ක් දක්වා පහත වැටුණි. චීනය සමඟ සිදු කළ මුළු වෙළඳ ගනුදෙනු ප්‍රමාණය ද පහත වැටුණ ද, පෙර වසරේ මෙන්ම එ.ජ. ඩොලර් බිලියන 4 ට වඩා ඉහළ මට්ටමක පැවති අතර, ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ සිදු කළ මුළු වෙළඳ ගනුදෙනු ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 3 ඉක්මවීය. එක්සත් අරාබි එමීර් රාජ්‍යය, එක්සත් රාජධානිය, ජපානය, සිංගප්පූරුව සහ ජර්මනිය අනෙකුත් ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් වූ අතර, ඒ එක් එක් රටවල් 2019 වසරේ දී ශ්‍රී ලංකාවේ සමස්ත විදේශීය වෙළඳාම සඳහා එ.ජ. ඩොලර් බිලියන 1 ට වඩා වැඩි දායකත්වයක් දැක්වීය. 2019 වසරේ දී ඉන්දියාව සමඟ සිදු කළ වෙළඳ ගනුදෙනු ප්‍රමාණය අඩු වීම සඳහා 2018 වසරට සාපේක්ෂව සැලකිය යුතු ලෙස ආනයන පහත වැටීමත් අපනයන මධ්‍යස්ථ ලෙස අඩු වීමත් හේතු විය.

චීනය සමග සිදු කළ මුළු වෙළඳ ගනුදෙනු ප්‍රමාණය පහත වැටීම සඳහා චීනය වෙතින් වූ ආනයන පහත වැටීම හේතු විය. මීට අමතරව, 2018 වසරට සාපේක්ෂව 2019 වසරේ දී එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ජපානය, සිංගප්පූරුව සහ ජර්මනිය සමග සිදු කළ මුළු වෙළඳ ගනුදෙනු ප්‍රමාණය ද පහත වැටුණි. මීට ප්‍රතිවිරුද්ධව, 2018 වසරට සාපේක්ෂව 2019 වසරේ දී ඇමෙරිකා එක්සත් ජනපදය සහ එක්සත් රාජධානිය සමග සිදු කළ මුළු වෙළඳ ගනුදෙනු ප්‍රමාණය ඉහළ ගිය අතර, ඒ සඳහා එම රටවල් සමග සිදු කළ අපනයන සහ ආනයන යන අංශ දෙකම ඉහළ යෑම හේතු විය. බටහිර රටවල්, ප්‍රධාන වශයෙන් ඇමෙරිකා එක්සත් ජනපදය සහ එක්සත් රාජධානිය, 2019 වසරේ දී ද ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගමනාන්ත ලෙස තවදුරටත් පැවති අතර, ආසියාව, ප්‍රධාන වශයෙන් චීනය සහ ඉන්දියාව, ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන ප්‍රභව ලෙස පැවතුණි.

**ඇමෙරිකා එක්සත් ජනපදය තවදුරටත් ශ්‍රී ලංකාවේ අපනයන සඳහා විශාලතම තනි ගැනුම්කරුවා විය.** ශ්‍රී ලංකාවේ සමස්ත අපනයනවලින් ඇමෙරිකා එක්සත් ජනපදය වෙත සිදු කළ අපනයන 2018 වසරේ දී වාර්තා වූ සියයට 25.9 සිට 2019 වසරේ දී සියයට 26.3ක් දක්වා ඉහළ ගියේය. 2019 වසරේ දී ඇමෙරිකා එක්සත් ජනපදය වෙතින් වූ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 3,141ක් දක්වා සියයට 1.8කින් ඉහළ ගිය අතර, ඒ සඳහා ඇමෙරිකා එක්සත් ජනපදය වෙත සිදු කළ මුළු අපනයනවලින් සියයට 87කට පමණ දායකත්වයක් ලබා දුන් ඇඟලුම්, රබර් නිෂ්පාදිත, මූල ලෝහ, ආහාර, පාන වර්ග හා දුම්කොළ සහ තේ අපනයන ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. 2019 වසරේ දී ශ්‍රී ලංකාවේ මුළු ඇඟලුම් අපනයනවලින් සියයට 45කට පමණ දායක වෙමින් ඇමෙරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ ප්‍රධාන තනි ඇඟලුම් අපනයන ගමනාන්තය ලෙස තවදුරටත් පැවතුණි. කෙසේ වුවද, 2019 වසරේ දී ඇමෙරිකා එක්සත් ජනපදය වෙත සිදු කළ මුහුදු ආහාර අපනයනවලින් ලද ආදායම සියයට 37.9කින් සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, ඒ වෙත අපනයනය කරන ලද යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, කුළුබඩු සහ පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම ද පහත වැටුණි. ශ්‍රී ලංකාවේ සමස්ත අපනයනවලින් සියයට 8.4කට පමණ දායක වෙමින් එක්සත් රාජධානිය ශ්‍රී ලංකාවේ දෙවැනි විශාලතම අපනයන ගමනාන්තය ලෙස පැවති අතර, ශ්‍රී ලංකාවේ සමස්ත ඇඟලුම් අපනයනවලින් සියයට 14ක් පමණ එක්සත් රාජධානිය වෙත අපනයනය කරන ලදී. 2019 වසරේ දී එක්සත් රාජධානිය වෙතින් වූ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 998ක් දක්වා සියයට 1.8කින් ඉහළ ගිය අතර, ඒ සඳහා ඇඟලුම්, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, නිමකළ රෙදිපිළි ද්‍රව්‍ය, ප්‍රවාහන උපකරණ, මුහුදු ආහාර, රබර් නිෂ්පාදිත සහ තේ අපනයන ආදායම ඉහළ යෑම හේතු විය. කෙසේ වුවද, 2019 වසරේ දී එක්සත් රාජධානිය වෙත අපනයනය කළ ආහාර, පාන වර්ග හා දුම්කොළ, පොල් නිෂ්පාදිත සහ කුළුබඩුවලින් ලද ආදායම පහත වැටුණි. ශ්‍රී ලංකාවේ මුළු අපනයනවලින් සියයට 6.4කට දායක වෙමින් ශ්‍රී ලංකාවේ තෙවැනි විශාලතම ගැනුම්කරු වන ඉන්දියාව වෙත සිදු කළ අපනයන 2018 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 777 සිට 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 768ක් දක්වා සියයට 1.1කින් පහත වැටුණි. මේ සඳහා ඛනිජ තෙල් නිෂ්පාදිත, ඇඟලුම්, මූල ලෝහ හා උපාංග සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන ආදායම පහත වැටීම ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, ඉන්දියාව වෙත අපනයනය කළ සත්ත්ව ආහාර, පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත, ඇඟලුම් සහ තේ මගින් ලද ආදායම ඉහළ ගියේය. මේ අතර, 2019 වසරේ දී සමස්ත අපනයන ආදායමෙන් සියයට 5.4කට පමණ දායක වෙමින් ජර්මනිය වෙත සිදු කළ අපනයන සියයට 5.5කින් ඉහළ ගියේය. 2019 වසරේ දී ජර්මනිය වෙතින් වූ අපනයන ආදායම ඉහළ යෑම සඳහා ඇඟලුම්, රබර් නිෂ්පාදිත සහ තේ අපනයන විශාල වශයෙන් දායක වූ අතර, එම අයිතම ජර්මනිය වෙතින් ලද මුළු අපනයන ආදායමෙන් සියයට 70ක් පමණ විය. ප්‍රධාන වශයෙන් ඉතාලිය වෙත සිදු කළ අපනයනවලින් සියයට 89කට පමණ දායක වූ ඇඟලුම්, රබර් නිෂ්පාදිත, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ සහ තේ අපනයන පහත වැටීම හේතුවෙන් 2019 වසරේ දී ඉතාලිය වෙතින් වූ අපනයන ආදායම සියයට 7.7කින් පහත වැටුණ ද, ශ්‍රී ලංකාවේ සමස්ත අපනයනවලින් සියයට 4.4කට දායක වෙමින් ඉතාලිය ශ්‍රී ලංකාවේ පස්වැනි විශාලතම අපනයන ගමනාන්තය ලෙස තවදුරටත් පැවතුණි. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම කලාපීය වෙළඳපොළ වන යුරෝපා සංගමය වෙතින් ලද අපනයන ආදායම 2019 වසරේ දී සමස්ත අපනයනවලින් සියයට 30කට පමණ දායකත්වය ලබා දෙමින් එ.ජ. ඩොලර් මිලියන 3,552ක් දක්වා සියයට 2.2කින් ඉහළ ගියේය. යුරෝපා වෙළඳපොළ වෙත සිදු කළ අපනයනවලින් සියයට 65ක් වන ඇඟලුම්, මුහුදු ආහාර සහ ප්‍රවාහන උපකරණ අපනයන ඉහළ යෑම යුරෝපා වෙළඳපොළ වෙතින් වූ අපනයන ආදායම ඉහළ යෑම සඳහා විශාල වශයෙන් දායක වූ අතර, යුරෝපා සංගමයේ ජී.එස්.පී. ප්ලස් පහසුකම නැවත ලබා ගැනීමේ සහ යුරෝපා වෙළඳපොළ වෙත ශ්‍රී ලංකාවේ මත්ස්‍ය නිෂ්පාදිත අපනයනය කිරීම

**5.7 රූප සටහන**


**අපනයන වෙළඳ දිශාව**




මූලය: ශ්‍රී ලංකා රේගුව

**5.8 රූප සටහන**

**ආනයන වෙළඳ දිශාව**




මූලය: ශ්‍රී ලංකා රේගුව

සඳහා පනවා තිබූ තහනම ඉවත් කිරීමේ බලපෑම මින් පිළිබිඹු විය. 2019 වසරේ දී මැද පෙරදිග රටවල් සහ ප්‍රධාන වශයෙන් රුසියාව ඇතුළු ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් ශ්‍රී ලංකාවේ තේ සඳහා ප්‍රධාන අපනයන ගමනාන්ත විය. එම රටවල් වෙත සිදු කළ තේ අපනයන පහත වැටුණ ද, සමස්ත තේ අපනයන ආදායම සඳහා එම රටවල්, පිළිවෙළින්, සියයට 42කින් සහ සියයට 17කින් දායක විය.

**2016 වසරට පසුව දෙවන වරටත් චීනය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන ප්‍රභවය බවට 2019 වසරේ දී පත්විය.** 2018 වසරේ දී සමස්ත ආනයන වියදමෙන් සියයට 18.5කට දායක වූ චීනය 2019 වසරේ දී සියයට 20.2ක කැපී පෙනෙන දායකත්වයක් දැක්වීය. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් විදුලි සන්දේශ මෙවලම්, මූල ලෝහ සහ රසායනික නිෂ්පාදිත ආනයනය පහත වැටීම හේතුවෙන් 2019 වසරේ දී චීනය වෙතින් වූ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 4,034ක් දක්වා සියයට 2.0කින් පහත වැටුණි. 2019 වසරේ දී චීනය වෙතින් වූ සමස්ත ආනයනවලින් සියයට 64කට පමණ දායකත්වයක් දෙමින් රෙදිපිළි හා රෙදිපිළි උපාංග, යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය චීනය වෙතින් ආනයනය කළ ප්‍රධාන අයිතම විය.

ඉන්දියාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍ය දෙවැනි සහ තෙවැනි ආනයන ප්‍රභව වූ අතර, එම රටවල් වෙත වූ ආනයන වියදම, පිළිවෙළින්, එ.ජ. ඩොලර් මිලියන 3,899ක් (සමස්ත ආනයනවලින් සියයට 19.6ක්) සහ එ.ජ. ඩොලර් මිලියන 1,669ක් (සමස්ත ආනයනවලින් සියයට 8.4ක්) විය. ඉන්දියාව පිළිබඳව සැලකූ විට, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, ඛනිජ තෙල් නිෂ්පාදිත, ගොඩනැගිලි ද්‍රව්‍ය, යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ රසායනික නිෂ්පාදිත ප්‍රධාන ආනයන අයිතම වූ අතර ඒවා ඉන්දියාවෙන් වූ ආනයනවලින් සියයට 51ක් විය. ඛනිජ තෙල් නිෂ්පාදිත, ඛනිජ නිෂ්පාදිත සහ මූල ලෝහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය වෙතින් වූ ප්‍රධාන ආනයන අයිතම වූ අතර, ඒවා එම රට වෙතින් වූ සමස්ත ආනයනවලින් සියයට 88ක් විය. සිංගප්පූරුව සහ ජපානය 2019 වසරේ දී සිව්වැනි සහ පස්වැනි විශාලතම ආනයන ප්‍රභවයන් වූ අතර, එම රටවල් ශ්‍රී ලංකාවේ සමස්ත ආනයන සඳහා පිළිවෙළින් සියයට 4.8කට සහ සියයට 4.4කට දායක විය. ප්‍රධාන වශයෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයනය සැලකිය යුතු ලෙස පහත වැටීම හේතුවෙන් 2019 වසරේ දී සිංගප්පූරුව වෙතින් වූ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 964ක් දක්වා සියයට 29.7කින් කැපී පෙනෙන

ලෙස පහත වැටුණු අතර, සමස්ත ආනයන සඳහා දායකත්වය ද 2018 වසරේ වාර්තා වූ සියයට 6.2 සිට සියයට 4.8ක් දක්වා පහත වැටුණි. ඛනිජ තෙල් නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ රසායනික නිෂ්පාදිත 2019 වසරේ දී සිංගප්පූරුව වෙතින් වූ ප්‍රධාන ආනයන අයිතම වූ අතර, ඒවා සිංගප්පූරුව වෙතින් වූ සමස්ත ආනයන වියදමෙන් සියයට 89ක් විය. ප්‍රධාන වශයෙන් පෞද්ගලික රථවාහන ආනයනය අඩු වීම හේතුවෙන් 2019 වසරේ දී ජපානය සඳහා වූ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 875ක් දක්වා සියයට 44.8කින් පහත වැටුණු අතර, සමස්ත ආනයන සඳහා වූ දායකත්වය 2018 වසරේ දී වාර්තා කළ සියයට 7.1 සිට සියයට 4.4ක් දක්වා පහත වැටුණි. පෞද්ගලික රථ වාහන, ප්‍රවාහන උපකරණ සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණ 2019 වසරේ දී ජපානය වෙතින් ආනයනය කළ ප්‍රධාන ආනයන අයිතම වූ අතර, ඒවා ජපානය වෙතින් වූ සමස්ත ආනයනවලින් සියයට 79ක් විය.

## 5.4 ජංගම සහ ප්‍රාග්ධන ගිණුම

### 5.4.1 සේවා වෙළඳාම

**පාස්කු ඉරු දින ප්‍රහාරයන් නිසා 2019 වසරේ දී සේවා ගිණුමට සැලකිය යුතු බලපෑමක් එල්ල විය.** 2019 වසරේ දී සේවා ගිණුමේ අතිරික්තය කැපී පෙනෙන අඩු වීමක් වාර්තා කළ අතර, මෙම කාලසීමාව තුළ දී සංචාරක හා ප්‍රවාහන අංශයන්හි ඉපැයීම් අඩුවීම ඒ සඳහා මූලික වශයෙන් හේතු විය. පාස්කු ඉරු දින ප්‍රහාරවල බලපෑම හේතුවෙන් 2019 වසරේ දී සංචාරක හා ගුවන් මගී ප්‍රවාහන සේවාවලින් ලද ඉපැයීම් පහත වැටුණු අතර, විදුලි සන්දේශ සේවා, පරිගණක සේවා සහ අනෙකුත් සේවාවන්ගේ ඉපැයීම් වර්ධනය විය. සමස්තයක් ලෙස සේවා අපනයන ආදායම 2018 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 8,374 සිට 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 7,474ක් දක්වා සියයට 10.7කින් පහළ වැටුණි. මේ අතර, රක්ෂණය, මූල්‍ය, විදුලි සන්දේශ සහ පරිගණක සේවා ඇතුළත් අනෙකුත් සේවාවන්හි ගෙවීම් ඉහළ යෑමක් ද, පාස්කු ඉරු දින ප්‍රහාරවලින් පසුව පෞද්ගලික විදේශ ගමන් සහ මගී සේවා ප්‍රවාහන වියදම් අඩු වීමක් ද සමග සේවා ගිණුමෙන් වූ ගෙවීම් වසර තුළ දී එ.ජ. ඩොලර් මිලියන 4,625ක් දක්වා සියයට 0.4ක සුළු ඉහළ යෑමක් වාර්තා කළේය. මේ අතර, පරිගණක සේවා අංශය 2019 වසර තුළ දී එහි වර්ධන ප්‍රවණතාව අඛණ්ඩව පවත්වාගෙන ගියේය. මෙම ප්‍රවණතා

**5.7 සංඛ්‍යා සටහන**

**ජංගම සහ ප්‍රාග්ධන ගිණුම**

එ.ජ. ඩොලර් මිලියන

| ශීර්ෂය | 2018 (අ) | | | 2019 (ආ) | | |
|---|---|---|---|---|---|---|
| | බැර | හර | ශුද්ධ | බැර | හර | ශුද්ධ |
| **භාණ්ඩ හා සේවා** | **20,264** | **26,841** | **-6,577** | **19,414** | **24,562** | **-5,148** |
| **භාණ්ඩ** | **11,890** | **22,233** | **-10,343** | **11,940** | **19,937** | **-7,997** |
| වෙළඳ භාණ්ඩ | 11,890 | 21,794 | -9,904 | 11,940 | 19,935 | -7,995 |
| මූල්‍ය නොවන රත්‍රන් | - | 439 | -439 | - | 3 | -3 |
| **සේවා** | **8,374** | **4,608** | **3,766** | **7,474** | **4,625** | **2,849** |
| ප්‍රවාහන | 2,486 | 1,737 | 750 | 2,339 | 1,710 | 630 |
| මුහුදු ප්‍රවාහන | 1,134 | 819 | 315 | 1,155 | 820 | 335 |
| නැව් කුලී | 1,134 | 819 | 315 | 1,155 | 820 | 335 |
| ගුවන් ප්‍රවාහන | 1,353 | 918 | 435 | 1,184 | 889 | 295 |
| මගී ගාස්තු | 1,227 | 827 | 400 | 1,056 | 798 | 258 |
| ගුවන් කුලී | 126 | 91 | 35 | 128 | 91 | 37 |
| සංචාරක (ඇ) | 4,381 | 1,660 | 2,721 | 3,607 | 1,638 | 1,969 |
| ඉදිකිරීම් | 65 | 33 | 32 | 67 | 35 | 32 |
| රක්ෂණ සහ විශ්‍රාම වැටුප් | 130 | 97 | 33 | 137 | 102 | 36 |
| මූල්‍ය සේවා | 242 | 447 | -205 | 213 | 470 | -258 |
| විදුලි සන්දේශ සහ පරිගණක සේවා | 995 | 484 | 511 | 1,054 | 515 | 539 |
| විදුලි සන්දේශ | 147 | 112 | 35 | 155 | 135 | 21 |
| පරිගණක සේවා | 848 | 372 | 475 | 899 | 380 | 519 |
| වෙනත් ව්‍යාපාරික සේවා | 40 | 75 | -34 | 35 | 78 | -43 |
| රජයේ භාණ්ඩ හා සේවා වියදම් (අන් තැනක සඳහන් නොවන) | 35 | 75 | -41 | 21 | 77 | -56 |
| **ප්‍රාථමික ආදායම්** | **249** | **2,633** | **-2,385** | **252** | **2,678** | **-2,426** |
| සේවක වැටුප් | 28 | 102 | -74 | 31 | 130 | -99 |
| ආයෝජන ආදායම් | 221 | 2,532 | -2,311 | 220 | 2,548 | -2,327 |
| සෘජු ආයෝජන | 23 | 783 | -760 | 26 | 863 | -837 |
| ලාභාංශ | 13 | 558 | -545 | 14 | 599 | -585 |
| ප්‍රති ආයෝජිත ඉපැයුම් | 10 | 225 | -215 | 13 | 264 | -252 |
| විවිධ ආයෝජන | - | 1,037 | -1,037 | - | 1,007 | -1,007 |
| හිමිකම් | - | 70 | -70 | - | 31 | -31 |
| පොලී ආදායම් | - | 967 | -967 | - | 976 | -976 |
| කෙටි කාලීන | - | 4 | -4 | - | 8 | -8 |
| දිගු කාලීන | - | 963 | -963 | - | 969 | -969 |
| අනෙකුත් ආයෝජන | 88 | 711 | -623 | 97 | 677 | -580 |
| සංචිත වත්කම් | 110 | - | 110 | 97 | - | 97 |
| **ද්විතීයික ආදායම්** | **7,023** | **860** | **6,163** | **6,726** | **960** | **5,766** |
| රජය | 8 | - | 8 | 9 | - | 9 |
| සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 7,015 | 860 | 6,155 | 6,717 | 960 | 5,757 |
| **ජංගම ගිණුම** | **27,535** | **30,334** | **-2,799** | **26,392** | **28,200** | **-1,808** |
| **ප්‍රාග්ධන ගිණුම** | **42** | **27** | **14** | **51** | **28** | **23** |
| ප්‍රාග්ධන සංක්‍රාම | 42 | 27 | 14 | 51 | 28 | 23 |
| රජය | 14 | - | 14 | 16 | - | 16 |
| සංස්ථා සහ කුටුම්බ | 28 | 27 | ... | 34 | 28 | 7 |
| **ජංගම ගිණුම සහ ප්‍රාග්ධන ගිණුම** | **27,577** | **30,362** | **-2,785** | **26,443** | **28,228** | **-1,785** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) අනේවාසිකයන්ට සැපයූ මගී සේවාවන්, ප්‍රවාහන සේවාවන්හි ඇතුළත්ය.

පිළිබිඹු කරමින් සේවා ගිණුමේ අතිරික්තය, 2018 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 3,766ට සාපේක්ෂව 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,849ක් දක්වා අඩු විය.

### ප්‍රවාහන සේවා

**2019 වසරේ දී ගුවන් මගී ප්‍රවාහන සේවා අඩු වීම හේතුවෙන් ප්‍රවාහන සේවාවල අතිරික්තය අඩු විය.** මගී ගාස්තු, නැව් කුලී, වරාය හා ගුවන් තොටුපළ ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් සමන්විත ප්‍රවාහන සේවා දළ ලැබීම් 2018 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 2,486 සමඟ සැසඳීමේ දී 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,339ක් විය. පාස්කු ඉරු දින ප්‍රහාරයන්ගෙන් පසුව ගුවන් මගී ප්‍රවාහන සේවා අඩු වීම මෙම අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වෙතත්, නැව් කුලී ඉපැයීම් ඉහළ යෑම හමුවේ මුහුදු ප්‍රවාහන සේවා සුළු වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, ප්‍රවාහන සේවා ගෙවීම් ද 2018 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,737 සිට 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,710ක් දක්වා පහත වැටුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රවාහන අංශයෙන් වූ ශුද්ධ ලැබීම් 2018 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 750 සිට 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 630ක් දක්වා පහත වැටුණි. පාස්කු ඉරු දින ප්‍රහාරයන්ගෙන් අනතුරුව ශ්‍රී ලංකාවට මගීන් පැමිණීම අඩුවීමත් සමඟ ගුවන් මගී ගාස්තු ලැබීම් 2018 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,227 සිට 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,056ක් දක්වා අඩු වූ අතර, එසේ මගී පැමිණීම් අඩු වීම නිසා 2019 වසරේ අප්‍රේල් මාසයේ සිට මාස කිහිපයක කාලයක් තුළ ගුවන් ගාස්තු අඩු කිරීමට සහ ගුවන් ගාස්තු සඳහා වට්ටම් ලබා දීමට ද ශ්‍රීලංකන් ගුවන් සමාගමට සිදු විය. කෙසේ වෙතත්, සීත සංචාරක සමයට සමගාමීව සංචාරක පැමිණීම් අපේක්ෂා කළ වේගයට වඩා වැඩි වේගයකින් යථා තත්ත්වයට පත්වීම සහ ගුවන් ගාස්තු සාමාන්‍ය තත්ත්වයට පත්වීම හේතුවෙන් වසර අග භාගයේ දී මගී ගාස්තු මගින් වූ ඉපැයීම් ඉහළ ගියේය. කොළඹ වරායේ භාණ්ඩ, බහලු සහ ප්‍රතිනැව්ගත කිරීම් හැසිරවීම් පරිමාව වර්ධනය වීම පිළිබිඹු කරමින් වරාය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල යම් වර්ධනයක් ඇතිවීම සමඟ මුහුදු ප්‍රවාහන සේවාවන්ට අදාළ නැව් කුලී ගාස්තු ලෙස වූ ලැබීම් සුළු වශයෙන් ඉහළ ගිය අතර, ගුවන් තොටුපළ ආශ්‍රිත කටයුතු සඳහා වූ කුලී ගාස්තු ද ඉහළ යෑම හේතුවෙන් 2019 වසර තුළ දී කුලී සේවා වෙතින් වූ ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 1,283ක් දක්වා සියයට 1.9කින් වර්ධනය විය.


### විදේශ ගමන් සහ සංචාරක සේවා

**පාස්කු ඉරු දින සිදු වූ ප්‍රහාරවලින් දැඩි ලෙස හානි වූ සංචාරක කර්මාන්තය, ඒ හා සම්බන්ධ බලධාරීන් විසින් ගනු ලැබූ කඩිනම් ක්‍රියාමාර්ග හේතුවෙන් 2019 වසරේ අග භාගය වන විට අපේක්ෂා කළ මට්ටම කරා වඩා වේගයෙන් යථා තත්ත්වයට පත් විය.** 2019 වසරේ පළමු කාර්තුව තුළ දී, කාර්තුවක් සඳහා මෙතෙක් වාර්තා කළ ඉහළම සංචාරක පැමිණීම් ප්‍රමාණය වාර්තා වුවද, 2019 වසරේ දී සංචාරක පැමිණීම් 2018 වසරේ දී වාර්තා වූ 2,333,796ට සාපේක්ෂව 1,913,702ක් දක්වා සියයට 18.0කින් අඩු විය. පාස්කු ඉරු දින සිදු වූ ප්‍රහාරවලින් පසුව සංචාරකයින් පැමිණෙන ප්‍රධාන රටවල් විසින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් නිකුත් කළ අවදානම් පිළිබඳ දැන්වීම් හේතුවෙන් සංචාරක පැමිණීම් කැපී පෙනෙන ලෙස පහත වැටුණි. කෙසේ වුවද, 2019 වසරේ මැද භාගය වන විට යෝග්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මගින් පිළියම් යෙදීම, ආරක්ෂක තත්ත්වයන් වර්ධනය වීම, සංචාරක ක්ෂේත්‍රය හා සම්බන්ධ ව්‍යාපාර සඳහා මූල්‍යමය සහයෝගය ලබා දීම, සංචාරක ප්‍රවර්ධනය සහ විවිධ රටවලින් නිකුත් කර තිබූ අවදානම පිළිබඳ දැන්වීම් ලිහිල් කිරීම මගින් වසර අවසාන වන විට අපේක්ෂා කළ මටටමට වඩා වැඩි වේගයකින් සංචාරක පැමිණීම් ඉහළ ගියේය. මේ අනුව, 2019 වසරේ මැයි මාසයේ දී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සංචාරක පැමිණීම්වල වාර්තා වූ සියයට 70.8ක අඩු වීමේ සිට 2019 වසරේ දෙසැම්බර් මාසය වන විට සියයට 4.5ක අඩු වීමක් පමණක් වාර්තා කරමින් සංචාරක පැමිණීම් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් විය.

**2019 වසරේ දී සියලුම ප්‍රධාන කලාප වෙතින් වූ සංචාරක පැමිණීම් පහත වැටුණි.** සංචාරක පැමිණීම් 887,572ක් වාර්තා කරමින් සමස්ත සංචාරක පැමිණීම්වලින් සියයට 46.4කට දායක වූ යුරෝපය ශ්‍රී ලංකාවේ විශාලතම සංචාරක ප්‍රභවය ලෙස තවදුරටත් පැවතුණි. කෙසේ වුවද, රුසියාව වෙතින් වූ සංචාරක පැමිණීම් සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් මධ්‍යම සහ නැගෙනහිර යුරෝපයෙන් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව ක්‍රමයෙන් ඉහළ ගිය ද, බටහිර, උතුරු, දකුණු හා මධ්‍යධරණී උප කලාප වෙතින් වූ සංචාරක පැමිණීම් සංඛ්‍යාව පහත වැටීම හේතුවෙන් 2019 වසරේ දී යුරෝපයෙන් පැමිණි සංචාරකයින් ප්‍රමාණය 2018 වසරට සාපේක්ෂව සියයට 12.8කින් පහත වැටුණි. 2019 වසරේ දී ආසියා ශාන්තිකර කලාපය වෙතින් වූ සංචාරක පැමිණීම් සියයට 23.1කින් පහත වැටුණ ද, සංචාරක පැමිණීම් 839,470ක් සමඟ සමස්ත සංචාරක පැමිණීම්වලින් සියයට 43.9කට දායක වෙමින්

**5.9 රූප සටහන**

**රටවල් අනුව සංචාරක පැමිණීම් - 2019**





මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

වසරේ දෙවැනි විශාලතම සංචාරක ප්‍රභවය බවට පත් විය. 2019 වසරේ දී සමස්ත සංචාරක පැමිණීම් සංඛ්‍යාව පහත වැටීම සඳහා ආසියා ශාන්තිකර කලාපය වෙතින් වූ සංචාරක පැමිණීම් පහළ යෑම විශාල වශයෙන් දායක විය. රටවල් අනුව සංචාරක පැමිණීම් සැලකුවිට, සංචාරක පැමිණීම් 355,002ක් වාර්තා කරමින් ඉන්දියාව ප්‍රධාන සංචාරක ප්‍රභවය ලෙස පැවති අතර, ඉන් අනතුරුව එක්සත් රාජධානිය, චීනය, ජර්මනිය සහ ඔස්ට්‍රේලියාව ප්‍රධාන සංචාරක ප්‍රභව විය. මෙම ප්‍රධාන සංචාරක ප්‍රභව පහ 2019 වසරේ දී සමස්ත සංචාරක පැමිණීම්වලින් සියයට 50කට පමණ දායක විය. ප්‍රධාන සංචාරක ප්‍රභව දහය සැලකූ විට, රුසියාවෙන් පැමිණි සංචාරක සංඛ්‍යාව පමණක් සියයට 34.2ක වර්ධනයක් වාර්තා කළ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් කුලී ගුවන් යානා මගින් සංචාරකයින් පැමිණීම හේතු විය. සංචාරකයින් පැමිණීමේ අරමුණ සැලකීමේ දී සංචාරකයින් සියයට 83කටත් වඩා විවේකය ගත කිරීම සඳහා මෙරටට පැමිණි අතර, සියයට 3.7ක් ව්‍යාපාර කටයුතු සඳහා පැමිණ ඇත. සංචාරකයින් සියයට 2කට අඩු ප්‍රමාණයක් රැස්වීම්, දිරි ගැන්වීම්, සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන (MICE) සහ ක්‍රීඩා කටයුතු සඳහා පැමිණ ඇත. ඥාති මිත්‍රාදීන් මුණ ගැසීම සහ ආගමික කටයුතු, සෞඛ්‍ය හා අධ්‍යාපන වැනි අනෙකුත් අරමුණු සඳහා පැමිණි සංචාරකයින් සංඛ්‍යාව මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 11.4ක් විය.

**පාස්කු ඉරු දින ප්‍රහාරවලින් පසුව සංචාරකයින්ගේ පැමිණීම අඩු වීම හේතුවෙන් සංචාරක ඉපැයීම්වල සැලකිය යුතු අඩු වීමක් වාර්තා විය.** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ලබන සංචාරක වියදම් පිළිබඳ වාර්ෂික සමීක්ෂණයට අනුව, 2019 වසරේ දී සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදම 2018 වසරේ දී වාර්තා වූ දිනකට එ.ජ. ඩොලර් 173.80 සිට දිනකට එ.ජ. ඩොලර් 181.23ක් දක්වා ඉහළ ගියේය. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ලැබූ සමීක්ෂණය තුළින් සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදම ඉහළ යෑම සඳහා ප්‍රධානතම හේතුව ලෙස දක්වා ඇත්තේ පාස්කු ඉරු දින ප්‍රහාරවලින් අනතුරුව නවාතැන් මිල ගණන් සඳහා යම් අහිතකර බලපෑමක් ඇති වීම හමුවේ වුවද නවාතැන් සඳහා සිදු කළ වියදම් වැඩි වීමයි. සංචාරකයෙකු විසින් මෙරට ගත කරන සාමාන්‍ය කාලය 2018 වසරේ දී වාර්තා වූ දින 10.8 සමඟ සැසඳීමේ දී 2019 වසරේ දී දින 10.4ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදම ඉහළ ගිය ද සංචාරක පැමිණීම් සැලකිය යුතු ලෙස අඩු වීම සහ සංචාරකයෙකු මෙරට ගත කරන කාලය සුළු වශයෙන් අඩු වීම හේතුවෙන් 2019 වසරේ දී සංචාරක ඉපැයීම් 2018 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 4,381 හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 3,607ක් දක්වා සියයට 17.7කින් අඩු විය. මේ අතර, ප්‍රධාන වශයෙන් පාස්කු ඉරු දින ප්‍රහාරවලින් පසුව ශ්‍රී ලාංකිකයන් විසින් සිදු කළ විදෙස් සංචාර අඩු වීම හේතුවෙන් 2019 වසරේ දී විදේශ ගමන් හා සම්බන්ධ ගෙවීම් එ.ජ. ඩොලර් මිලියන 1,638ක් දක්වා සියයට 1.3කින් අඩු වී ඇති බවට ඇස්තමේන්තු කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, විදේශ ගමන් හා සංචාරක උප අංශය වෙත වූ ශුද්ධ ලැබීම් 2018 වසරේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 2,721 සිට 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,969ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු විය.

**5.10 රූප සටහන**

**සංචාරක පැමිණීම් සහ ඉපැයීම්**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**5.8 සංඛ්‍යා සටහන**

**සංචාරක අංශයේ ක්‍රියාකාරිත්වය**

| ශීර්ෂය | 2015 | 2016 | 2017 | 2018 | 2019 (අ) | වාර්ෂික වෙනස්වීම (%) 2019 |
|---|---|---|---|---|---|---|
| සංචාරක පැමිණීම් (සංඛ්‍යාව) | 1,798,380 | 2,050,832 | 2,116,407 | 2,333,796 | 1,913,702 | -18.0 |
| පැමිණීමේ අරමුණ අනුව සංචාරකයින් ගණන | | | | | | |
| විනෝදාස්වාදය | 1,198,240 | 1,710,027 | 1,744,149 | 1,979,819 | 1,592,212 | -19.6 |
| ව්‍යාපාර | 23,323 | 37,121 | 70,683 | 71,255 | 70,068 | -1.7 |
| වෙනත් | 576,817 | 303,684 | 301,575 | 282,722 | 251,422 | -11.1 |
| සංචාරකයින් ගත කළ රාත්‍රී ගණන (දහස්) | 18,163 | 20,918 | 23,068 | 25,205 | 19,903 | -21.0 |
| කාමර උපයෝජන අනුපාතය (%) | 74.5 | 74.8 | 73.3 | 72.8 | 57.1 | -21.6 |
| දළ සංචාරක ලැබීම් (රු. මිලියන) | 405,492 | 512,373 | 598,143 | 711,961 | 646,362 | -9.2 |
| ඒක පුද්ගල සංචාරක ලැබීම් (රු.) | 225,476 | 249,837 | 282,622 | 305,066 | 337,755 | 10.7 |
| මුළු සේවා නියුක්තිය (සංඛ්‍යාව) (ආ) | 319,436 | 335,659 | 359,215 | 388,487 | 402,607 | 3.6 |
| සෘජු සේවා නියුක්තිය | 135,930 | 146,115 | 156,369 | 169,003 | 173,592 | 2.7 |
| වක්‍ර සේවා නියුක්තිය | 183,506 | 189,544 | 202,846 | 219,484 | 229,015 | 4.3 |

(අ) තාවකාලික
(ආ) ඇස්තමේන්තු

මූලයන්: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

**පාස්කු ඉරු දින සිදු වූ ප්‍රහාරවලින් පසුව සංචාරක පැමිණීම් පහත වැටුණ ද, 2019 වසරේ දී ද සංචාරක කර්මාන්තය කැපී පෙනෙන ලෙස ආයෝජන ආකර්ෂණය කර ගැනීමට සමත් විය.** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ආයෝජන සබඳතා ඒකකය (Investor Relations Unit - මීට පෙර One Stop unit නමින් හැඳින් වූ අංශය) 2019 වසරේ දී සමස්ත කාමර ධාරිතාව 2,237ක් වන හෝටල් ව්‍යාපෘති 59ක් සඳහා අනුමැතිය ලබා දී ඇත. 2019 වසර තුළ දී, ආයෝජන සබඳතා අංශය වෙත හෝටල් 132ක් සඳහා එ.ජ. ඩොලර් මිලියන 189ක වටිනාකමක් සහිත නව යෝජනා ඉදිරිපත් වී ඇති අතර, මෙම ව්‍යාපෘති සම්පූර්ණ වීමෙන් පසුව කර්මාන්තයට තවත් කාමර 2,584ක් එකතු වීමට නියමිතය. මෙම යෝජනාවලින්, එ.ජ. ඩොලර් මිලියන 81.6ක වටිනාකමක් සහිත නව යෝජනා 66ක් 2019 වසරේ දෙවන භාගයේ දී ලැබීම මගින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයෙහි විභවතාව පිළිබඳව ආයෝජකයින්ගේ අඛණ්ඩ කැමැත්ත පිළිබිඹු වේ.

**පාස්කු ඉරු දින සිදු වූ ප්‍රහාරවලට පසුව විශේෂ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන අතරම ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ විභවතාව වර්ධනය කර ගැනීම සඳහා 2019 වසරේ දී ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගණනාවක් සහ විවිධ ප්‍රවර්ධන වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී.** මේ අනුව, 2019 වසරේ මැයි මාසයේ දී ණය හා පොලී ගෙවීම් සඳහා සහන කාලයක් ලබා දීම ඇතුළුව ආර්ථික සහන පැකේජයක් හඳුන්වා දෙන ලදී. ආරම්භයේ දී මෙම සහන පැකේජය 2020 වසරේ මාර්තු 31 දින දක්වා වලංගු වූ නමුත් පසුව සංචාරක කර්මාන්තයේ නියුතු ලියාපදිංචි වූ ව්‍යාපාර විසින් ගනු ලැබූ ණය සඳහා ගෙවිය යුතු වාරික සහ අදාළ පොලිය යන දෙඅංශයම ආවරණය වන පරිදි 2021 වසරේ මාර්තු 31 වන දින දක්වා දීර්ඝ කරන ලදී. සංචාරක කර්මාන්තය කෙරෙහි විනාශකාරී බලපෑමක් ඇති කර තිබෙන දැනට පවතින කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් මෙම සහන තවදුරටත් දීර්ඝ කිරීමට ඉඩ ඇත. ප්‍රධාන වශයෙන් සංචාරක අංශයේ අවිධිමත් පාර්ශ්වකරුවන් ඉලක්ක කර ගනිමින් 2019 වසරේ මැයි මාසයේ දී මුදල් අමාත්‍යාංශය විසින් වෙනත් සහන පැකේජයක් හඳුන්වා දෙන ලදී. 'එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා' යටතේ ලියාපදිංචි වූ ව්‍යාපාර සඳහා සහනදායී පොලී අනුපාතිකවලට කාරක ප්‍රාග්ධන ණය ලබා දීම සඳහා යෝජනා ක්‍රම හඳුන්වා දෙන ලදී. තවද, ලියාපදිංචි කරන ලද හෝටල් සහ සංචාරක පැකේජ මෙහෙයවන්නන් සඳහා වන එකතු කළ අගය මත බදු 2019 වසරේ ජූනි මාසයේ දී සියයට 7ක් දක්වා අඩු කළ අතර, 2019 වසරේ දෙසැම්බර් මාසයේ දී එය සම්පූර්ණයෙන්ම ඉවත් කරන ලදී. සංචාරකයින්ගේ විශ්වාසය ගොඩ නැගීම සඳහා රටේ ආරක්ෂක තත්ත්වය තහවුරු කිරීමට ද ක්‍රියාමාර්ග ගන්නා ලදී. තවද, ආරක්ෂාව සම්බන්ධ උපකරණ මත වන ආනයන බදු ඉවත් කරන ලදී. පාස්කු ඉරු දින ප්‍රහාරවලින් පසු සංචාරක ප්‍රවර්ධනය සඳහා විශේෂයෙන් කටයුතු කරමින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මගින් ජාත්‍යන්තර සංචාරක කර්මාන්තය කෙරෙහි බලපෑම් ඇති කළ හැකි කිහිප දෙනෙකු සමඟ මාධ්‍ය චාරිකා සංවිධානය කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත් අතර, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය පිළිබඳව ප්‍රතිරූපය ඉහළ නැංවීම සඳහා සංචාරක සංගම් විසින් චාරිකා සංවිධානය කිරීම සහ

### විශේෂ සටහන 09
## පාස්කු ඉරු දින ප්‍රහාරයේ බලපෑම

2019 වසරේ පාස්කු ඉරු දින සැමරුම් දිනය වූ අප්‍රේල් මස 21 වන දින මීගමුව, මඩකලපුව සහ කොළඹ පිහිටි පල්ලි තුනක් සහ කොළඹ පිහිටි සුඛෝපභෝගී හෝටල් තුනක් විදේශීය ත්‍රස්තවාදී සංවිධානයකට පක්ෂපාතී බව ප්‍රකාශ කළ දේශීය ත්‍රස්තවාදී කණ්ඩායමක් විසින් එල්ල කරන ලද සැලසුම් සහගත මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර මාලාවකට ලක් විය. මෙම ඛේදජනක සිදුවීම හේතුවෙන් විදේශීය ජාතිකයන් ද ඇතුළු සිවිල් වැසියන් 250කට අධික පිරිසක් මිය ගිය අතර, 500කට අධික පිරිසක් තුවාල ලබා ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

පාස්කු ඉරු දින ප්‍රහාරවලින් අනතුරුව රජය විසින් රට තුළ හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කළ අතර, දින කිහිපයක් සඳහා රාත්‍රී පොලිස් ඇඳිරි නීතිය පනවන ලදී. මෙම සිදුවීමෙන් පසුව රටේ සියලුම පාසල් සහ රාජ්‍ය විශ්වවිද්‍යාල සති දෙකක කාලයකට වසා දමන ලදී. ප්‍රජාව අතර ප්‍රචණ්ඩත්වයට හේතු විය හැකි වැරදි තොරතුරු පැතිරීම වැළැක්වීම සඳහා ප්‍රධාන සමාජ මාධ්‍ය ජාලා අවහිර කිරීමට ද රජය පියවර ගත්තේය. කොළඹ කොටස් වෙළඳපොළෙහි මෙහෙයුම් කටයුතු ද 2019 වසරේ අප්‍රේල් 22 වන දින තාවකාලිකව අත්හිටුවන ලදී. සිද්ධියෙන් පසුව, ජන ජීවිතය හා ආර්ථික කටයුතු ක්‍රමයෙන් සාමාන්‍ය තත්ත්වයට පත් වීමේ ලකුණු පහළ කිරීමට සති දෙකක පමණ කාලයක් ගත විය. මේ අතර, පාස්කු ඉරු දින ප්‍රහාරවලින් තවදුරටත් මන්දගාමී වූ ආර්ථික වර්ධනය, පෞද්ගලික අංශය වෙත සපයන ලද ණයවල මන්දගාමී වර්ධනය, අඩු උද්ධමන අපේක්ෂා සහ උද්ධමනය පිළිබඳ ඉදිරි දැක්ම හමුවේ 2019 වසරේ මැයි මාසයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව ද ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කළේය.

මෙම ප්‍රහාර මාලාව හේතුවෙන් විශේෂයෙන්ම සංචාරක කර්මාන්තයට විශාල බලපෑමක් සිදු වූ අතර, ඒ හේතුවෙන් ගුවන් ප්‍රවාහන සේවා, දේශීය ප්‍රවාහන, තොග හා සිල්ලර වෙළඳාම සහ නවාතැන්, ආහාර පාන සේවා කටයුතු, විවේකය හා විනෝදාස්වාදය, ආහාර පාන නිෂ්පාදනය සහ කෘෂිකර්මාන්තය වැනි වෙනත් අංශ රාශියකට අහිතකර පසු බලපෑම් ඇති විය. ප්‍රහාර සිදු වූ විගසම රජයේ සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන ඉවත් කර ගැනීමත් සමඟ විනිමය අනුපාතිකය ද යම් පීඩනයකට ලක් විය. මිල දර්ශක සහ වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය පහත වැටීමත් සමඟ කොළඹ කොටස් වෙළඳපොළ ද පසුබෑමට ලක් විය. කෙසේ වුවත්, ගෝලීය ආර්ථික හා මූල්‍ය වෙළඳපොළ ප්‍රවණතා, 2019 වසරේ දෙවන භාගය පුරාවට පැවති අහිතකර කාලගුණික තත්ත්වයන් සහ වසර අග භාගයේ දී පැවැත්වූ ජනාධිපතිවරණය අවසාන වන තෙක් පැවති අවිනිශ්චිතතාව යනාදී අනෙකුත් ප්‍රධාන සාධක ද පාස්කු ඉරු දින ප්‍රහාරවලින් අනතුරුව ආර්ථික වර්ධනය මන්දගාමී වීම කෙරෙහි අහිතකර ලෙස බල පෑ බැවින්, ත්‍රස්ත ප්‍රහාරවල ආර්ථික බලපෑම නිශ්චිතවම ගණනය කිරීම අපහසුය. එනමුත්, ඒ වන විටත් පැවති මන්දගාමී ආර්ථික වර්ධනය ප්‍රහාර හේතුවෙන් තවදුරටත් බලපෑමට ලක් වූ බව ද, 2019 වසරේ දී සියයට 2.3ක් වූ මන්දගාමී වර්ධනයට එය බොහෝදුරට දායක වූ බව ද නිගමනය කළ හැකිය.

පාස්කු ඉරු දින ප්‍රහාරවල යම් බලපෑමක් ද හේතුවෙන් සමස්ත ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම හමුවේ ආදායම් රැස් කිරීම පහළ යෑම සමඟ 2019 වසරේ දී රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය දුර්වල විය. මීට අමතරව, පීඩාවට පත් පාර්ශ්වයන් යථා තත්ත්වයට ගෙන ඒම සඳහා පහසුකම් සැලසෙන සහන පැකේජ ක්‍රියාත්මක කිරීම, ආරක්ෂක ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම, පොලී සහනාධාර සැපයීම සහ හානියට පත් පොදු යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය සිදු කිරීම සමඟ රජයේ වියදම් ද ඉහළ ගොස් ඇතැයි ඇස්තමේන්තු කර ඇත. කෙසේ වෙතත්, පාස්කු ඉරු දින ප්‍රහාරවලින් පසුව පවා, ශ්‍රී ලංකා රජය විසින් 2019 වසරේ ජූනි මාසයේ දී එ.ජ. ඩොලර් බිලියන 2ක් වටිනා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවක් සිදු කළ අතර, ඒ සඳහා පැවති අධි දායකත්වය මගින් ජාත්‍යන්තර ආයෝජක ප්‍රජාව ශ්‍රී ලංකාවට දක්වන අඛණ්ඩ සහයෝගය සහ රටේ දිගුකාලීන වර්ධන අපේක්ෂාවන් පිළිබඳ ඔවුන්ගේ විශ්වාසය පිළිබිඹු විය.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ඇස්තමේන්තුවලට අනුව, සංචාරක ක්ෂේත්‍රයේ ඍජු සහ වක්‍ර රැකියා ප්‍රමාණය ශ්‍රී ලංකාවේ සමස්ත ශ්‍රම බලකායෙන් සියයට 4.6කි. එපමණක් නොව, රටෙහි දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස සංචාරක ඉපැයීම් දළ වශයෙන් සියයට 4-5 අතර වේ. ත්‍රස්ත ප්‍රහාරවලින් පසුව, ශ්‍රී ලංකාවට සංචාරකයින් පැමිණෙන ප්‍රධාන රටවල් ඇතුළු රටවල් 37ක් විවිධ අවදානම් මට්ටම්වල සංචාරක උපදේශන නිකුත් කළ නමුත්, රටේ ආරක්ෂක තත්ත්වය වැඩි දියුණු වීමත් සමඟ ඒවායින් බොහෝමයක් පසු මාසවල දී ඉවත් කරනු ලැබීය. දෛනික ගුවන් ගමන් වෙන් කරවා ගැනීමේ ගනුදෙනු මිලියන 17කට වඩා විශ්ලේෂණය කරමින් අනාගත සංචාරක රටාවන් පිළිබඳව පුරෝකථනය කරනු ලබන ෆෝවර්ඩ් කීස් (ForwardKeys) ආයතනය මගින් සිදු කරනු ලැබූ විශ්ලේෂණයකට අනුව ප්‍රහාරවලින් පසුව දින තුනක් තුළ දී ඒ වන විට වෙන් කරවාගෙන තිබූ ගුවන් ගමන් ආසන අවලංගු කිරීම් සියයට 86.2කින් ඉහළ ගිය අතර, නව ආසන වෙන් කිරීම් තියුණු ලෙස පහත වැටුණි. ප්‍රහාරවලට පෙර 2019 වසරේ දී දිනක් තුළ පැමිණි සංචාරකයින්ගේ සාමාන්‍යය 7,600ක් පමණ වූ අතර, ප්‍රහාරයෙන් පසු මාස දෙකක් තුළ එය 1,700ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය වසරේ දෙවන භාගයේ දී වේගවත්ව යථා තත්ත්වයට පත්වෙමින් වසරේ අවසාන මාස දෙක

5

තුළ දී දිනකට පැමිණි සංචාරකයින්ගේ ප්‍රමාණය 6,900ක සාමාන්‍යයක් දක්වා ඉහළ ගියේය. එනමුත්, සමස්තයක් වශයෙන් 2019 වසරේ දී සංචාරකයින්ගේ පැමිණීම් පෙර වසරට සාපේක්ෂව 1,913,702 දක්වා සියයට 18.0කින් අඩු වූ අතර, එමගින් සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 3,607ක් දක්වා සියයට 17.7කින් අඩු විය.


ලොව පුරා සමහර ප්‍රධාන සංචාරක ගමනාන්ත ද මෑත වසරවල දී මෙවැනිම ත්‍රස්ත ප්‍රහාරවලට මුහුණ දී තිබේ. මෑතකාලීන උදාහරණ වන්නේ 2015 වසරේ නොවැම්බර් මස එල්ල වූ පැරිස් ප්‍රහාර සහ 2016 වසරේ මාර්තු මස බ්‍රසල්ස් හි සිදු වූ බෝම්බ ප්‍රහාරයි. කෙසේ වෙතත්, සුදුසු ක්‍රියාමාර්ග කාලෝචිතව ක්‍රියාත්මක කිරීමත් සමඟ මෙම රටවල් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්ව ඇත. ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් වසරකට වඩා අඩු කාලයක දී ප්‍රංශයේ සංචාරක කර්මාන්තය 2016 වසරේ ඔක්තෝබර් මාසයේ සිට ශක්තිමත් ලෙස යළිත් වර්ධනය වී ඇති අතර[1], බ්‍රසල්ස් කලාපය ද ත්‍රස්තවාදී ප්‍රහාරවලින් මාස හතකට පසු 2016 වසරේ ඔක්තෝබර් මාසයේ සිට යථා තත්ත්වයට පත්වීමේ ලකුණු පෙන්නුම් කළේය[2]. ලෝක විදේශ ගමන් හා සංචාරක කවුන්සිලයේ (World Travel and Tourism Council) ඇස්තමේන්තුවලට අනුව ත්‍රස්ත ප්‍රහාරවල බලපෑමෙන් ගමනාන්ත යථා තත්ත්වයට පත්වීමට ගතවන කාලය මාස 13ක් පමණ වන අතර, දේශපාලන නොසන්සුන්තාවයකින් මිදීමට මාස 27ක් පමණ ගත වේ. වසංගතයකින් සහ පාරිසරික ව්‍යසනයකින් පසු නැවත යථා තත්ත්වයට පත්වීමේ සාමාන්‍ය කාලය ත්‍රස්ත ප්‍රහාරයකට වඩා දීර්ඝ වන අතර, ඒ සඳහා පිළිවෙළින් මාස 21ක් සහ මාස 24ක් ගත වන බවට ඇස්තමේන්තු කර ඇත.

සංචාරක කර්මාන්තය නැවත නගා සිටුවීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාර ලෙස පාස්කු ඉරු දින ප්‍රහාරයෙන් පසුව ශ්‍රී ලංකාවේ සංචාරක පැමිණීම් නැවත යථා තත්ත්වයට පත් වූ ආකාරය රූප සටහන වි.ස. 9.1 මගින් පෙන්නුම් කෙරේ. 2019 වසරේ මැයි මාසයේ සංචාරක පැමිණීම් පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 71ක සැලකිය යුතු අඩුවීමක් පෙන්නුම් කළේය. කෙසේ වුවත්, ඊළඟ මාස තුන තුළ දී සංචාරක පැමිණීම් ක්‍රමයෙන් වැඩි වී සැප්තැම්බර් මාසයේ දී නැවත අඩුවූ අතර, සංචාරක සමයේ ආරම්භය සමගින් වසර අවසාන වන විට සංචාරක පැමිණීම් කැපී පෙනෙන ලෙස වැඩි විය. ඒ අනුව, 2019 නොවැම්බර් මාසයේ දී සංචාරක පැමිණීම් පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 9.5ක අඩු වීමක් පමණක් වාර්තා කළ අතර, එම අඩු වීම දෙසැම්බර් මාසයේ දී සියයට 4.5ක් දක්වා තවදුරටත් පහළ ගියේය. ශ්‍රී ලංකාවේ සංචාරක අංශය ත්‍රස්තවාදී ප්‍රහාරවලින් මාස හතක් ඉක්ම යන විට මුළුමනින්ම පාහේ නැවත යථා තත්ත්වයට පත් වූ බව මෙම සංඛ්‍යානවලින් පෙන්නුම් කරන අතර, එය ලෝක විදේශ ගමන් හා සංචාරක කවුන්සිලය විසින් ඇස්තමේන්තු කරන ලද සාමාන්‍ය

1 සංඛ්‍යාන සහ ආර්ථික අධ්‍යයන පිළිබඳ ජාතික ආයතනය (National Institute of Statistics and Economic Studies), ප්‍රංශය, 2017.

2 බ්‍රසල්ස් සංචාරක නිරීක්ෂණාගාරයෙහි (Brussels Tourism Observatory) වාර්ෂික වාර්තාව, 2016.

**රූප සටහන වි.ස. 9.1**
**පාස්කු ඉරු දින ප්‍රහාරවලට පෙර සහ පසු මාසික සංචාරක පැමිණීම්**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

සටහන : අළු පැහැයෙන් අඳුරු කර ඇති කාලපරිච්ඡේදය තුළ සංචාරක පැමිණීම් අඩු වීම කෙරෙහි කොවිඩ්-19 වසංගතයෙහි බලපෑම හේතු විය.

කාලය වන මාස 13ට වඩා අඩු කාලයකි. කෙසේ වුවත් කොවිඩ්-19 වසංගතය පැතිරීම හේතුවෙන් ගෝලීය සහ දේශීය සංචාරක කර්මාන්තයට වන අහිතකර බලපෑම 2020 වසර තුළ සංචාරක පැමිණීම්වලින් පිළිබිඹු වනු ඇත.

පාස්කු ඉරු දින ප්‍රහාරවලින් අනතුරුව සංචාරක කර්මාන්තය නැවත නගා සිටුවීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ක්‍රියාමාර්ග ගණනාවක් ගන්නා ලදී. සංචාරක ප්‍රවර්ධනය සහ සංචාරක අංශය සමඟ සෘජුවම සම්බන්ධ අංශ සඳහා මූල්‍ය සහ රාජ්‍ය මූල්‍ය සහාය ලබා දීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී. ඒ අනුව, සංචාරක කර්මාන්තයේ යෙදෙන ලියාපදිංචි ව්‍යාපාර විසින් ලබා ගෙන ඇති ණය සඳහා අදාළ වාරික හා පොලී ගෙවීම සඳහා සහන කාලයක් ඇතුළත් ආර්ථික සහන පැකේජයක් 2019 මැයි මාසයේදී හඳුන්වා දෙන ලදී. 2020 වසරේ මාර්තු මස අවසානය දක්වා වලංගු වී තිබූ මෙම සහන කාලය කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමඟ තවදුරටත් දීර්ඝ කරන ලදී. ණය ගෙවීම සඳහා වූ එම සහනයට අමතරව ප්‍රධාන වශයෙන් සංචාරක කර්මාන්තයේ අවිධිමත් අංශයේ පාර්ශ්වකරුවන් ඉලක්ක කර ගනිමින් රජය විසින් 2019 මැයි මාසයේ දී වෙනත් සහන පැකේජයක් හඳුන්වා දෙන ලදී. එමෙන්ම, සංචාරක කර්මාන්තයේ නියැලෙන්නන් හට කාරක ප්‍රාග්ධන පහසුකම් සැපයීම සඳහා රජයේ එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ වන *ජය ඉසුර* ණය යෝජනා ක්‍රමය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ *සෞභාග්‍යා* ණය යෝජනා ක්‍රමය යටතේ වන අරමුදල් යොදාගැනීමට බලපත්‍රලාභී වාණිජ බැංකුවලට ද අවසර ලබා දෙන ලදී. තවද, ලියාපදිංචි හෝටල් සහ සංචාර සංවිධානය කරන්නන් සඳහා 2019 ජූනි 01 වන දින සිට 2019 නොවැම්බර් 30 වන දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී එකතු කළ අගය මත බද්ද සියයට 15 සිට සියයට 7ක් දක්වා අඩු කරන ලද අතර, ආරක්ෂාව හා සම්බන්ධ නිෂ්පාදන සඳහා ආනයන බදු ඉවත් කරන ලදී. 2019 දෙසැම්බර් 01

5

වන දින සිට බලපැවැත්වෙන පරිදි, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි කර ඇති හෝටල් සහ ඒ හා සමාන සේවා සැපයීම් සිදු කරන ව්‍යාපාර විසින් සිය යෙදවුම්වල මුළු වටිනාකමින් සියයට 60ක් දේශීය සැපයුම්කරුවන්ගෙන් ලබා ගන්නේ නම් එම ව්‍යාපාර මත එකතු කළ අගය මත බද්ද ශූන්‍ය අනුපාතිකයක් සහ අනෙකුත් ව්‍යාපාර මත සියයට 8ක අනුපාතිකයක් අය කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ සන්නාමය යළි නගා සිටුවීම උදෙසා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් ඉලක්කගත ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර, ජාත්‍යන්තර සංචාරක කර්මාන්තය කෙරෙහි බලපෑම් ඇති කළ හැකි කිහිපදෙනෙකු සමඟ මාධ්‍ය සංචාර සංවිධානය කිරීම, සංචාරක සංගම්වල සංචාර සංවිධානය කිරීම සහ චීනයේ සහ ඉන්දියාවේ මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම එයට ඇතුළත් විය. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් ඉන්දියාවේ සංචාරක නියෝජිත ජාලය හරහා සිදු කරනු ලබන වෙන් කිරීම් සඳහා විශේෂ ප්‍රවර්ධන පැකේජ 15ක් හඳුන්වා දෙන ලදී. හඳුනාගත් වෙළඳපොළවල විදේශ ගමන් හා සංචාරක ප්‍රදර්ශන සහ මාර්ග සංදර්ශන මගින් සාමාන්‍ය ප්‍රවර්ධන කටයුතු සිදු කරන ලද අතර, විදේශයන්හි උමං දුම්රිය ස්ථානවල එළිමහන් වෙළඳ ප්‍රචාරණ කටයුතු ද සිදු කරන ලදී. ඩිජිටල් වෙළඳ ප්‍රචාරණ ව්‍යාපාරයක් සහ සී.එන්.එන්. (CNN) නාලිකාව සමඟ සම්බන්ධ වී සිදු කළ රූපවාහිනී ප්‍රචාරණ වැඩසටහනක් ද මෙම ප්‍රයත්න සපුරා ගැනීමට රුකුලක් විය. පසුකාලීනව රටේ ආරක්ෂක තත්ත්වයන් වැඩිදියුණු වීම සහ සංචාරක කර්මාන්තයේ නියුතු පෞද්ගලික අංශයේ සහ රජයේ පාර්ශ්වකරුවන් විසින් සිදු කළ අඛණ්ඩ ප්‍රවර්ධන කටයුතු සංචාරක ක්ෂේත්‍රය වේගයෙන් යථා තත්ත්වයට පත්වීමට හේතු විය.

ත්‍රස්ත ප්‍රහාරයකින් හෝ වෙනත් ඕනෑම අර්බුදකාරී තත්ත්වයකින් පසු ආර්ථික කටයුතු නැවත වේගවත්ව යථා තත්ත්වයට පත් කිරීමට රටට ඇති හැකියාව රඳා පවතින්නේ එවන් හදිසි අවස්ථාවකට මුහුණ දීම සඳහා වන ශක්තිමත් අතුරු සැලසුම්, ආපදා ප්‍රතිසාධන වැඩසටහන් සහ අවදානම් කළමනාකරණය සඳහා ඇති නිල ක්‍රියා පටිපාටි මතය. එබැවින්, යම් අර්බුදයක් ඇතිවීමෙන් පසු ඊට ප්‍රතිචාර වශයෙන් යම් ක්‍රියාමාර්ග සැලසුම් කිරීමට වඩා අර්බුදයකට සාර්ථකව මුහුණ දීමට හැකි වන පරිදි පූර්ව ක්‍රියාමාර්ග සැලසුම් කිරීම අර්බුදයක දී ඉතා තීරණාත්මක සාධකයකි. මේ අනුව, එවැනි අර්බුදයන්ට මුහුණ දීම සඳහා නීතිය හා සාමය පිළිබඳ බලධාරීන්, සිවිල් සමාජය, සංචාරක අංශයේ බලධාරීන් සහ මාධ්‍ය පෙළ ගැස්වීම, ව්‍යාපාර සහ සංචාරක අංශවල අවදානම්වලට මුහුණ දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. වසර 30 ක සන්නද්ධ ගැටුම්, සුනාමි ව්‍යසනය සහ පාස්කු ඉරු දින ප්‍රහාරයන් ඇතුළු ඛේදජනක සිදුවීම් රැසකට ඔරොත්තු දීමේ හැකියාව ශ්‍රී ලංකාව වරින්වර ඔප්පු කර තිබේ. ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත්වීම හමුවේ වුවද, මෑතකාලීනව මතුවූ කොවිඩ්-19 වසංගතය ඇතුළු බොහෝ ගෝලීය අවදානම් තත්ත්වයන්, රටේ සංචාරක අංශයට සහ අනෙකුත් ආර්ථික කටයුතුවලට බලපෑම් ඇති කර තිබේ. එබැවින්, මෙවැනි අනපේක්ෂිත සිදුවීම්වලට මුහුණ දීමට රටෙහි ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා සාර්ව ආර්ථික ප්‍රතිපත්තිය ඇතුළු සියලු අංශ හා සම්බන්ධ හදිසි සූදානම් තත්ත්වයන් අත්‍යාවශ්‍ය වන අතර, එමගින් මෙම අනපේක්ෂිත සිදුවීම්වලින් ඇතිවන අහිතකර ආර්ථික හා සාමාජීය බලපෑම් අවම වනු ඇත.

මූලාශ්‍ර

1. Misrahi, T. (2016) *How destinations can bounce back after terrorist attacks.* https://www.weforum.org/agenda/2016/03/how-destinations-can-bounce-back-after-terrorist-attacks/

2. National Institute of Statistics and Economic Studies, France. (2017) *Tourism occupancy in hotels, campsites and holiday and other short-stay accommodation in metropolitan France − Q4 2016.*

3. Sri Lanka Tourism Development Authority. (2018) *Annual Statistical Report 2018.*

4. Visit Brussels. (2016) *Annual Report of the Brussels Tourism Observatory 2016.*

5. Wong, J. (2019) *Sri Lanka suffers cancellation tsunami.* https://forwardkeys.com/sri-lanka-easter-attacks/

චීනයේ හා ඉන්දියාවේ මාධ්‍ය හමු පැවැත්වීම සිදු කරන ලදී. මේ අතර, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් හඳුනාගත් වෙළඳපොළ සඳහා නිරන්තරයෙන් සිදු කරන සිය ප්‍රවර්ධන කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, දේශීය සංචාරක ආයතන සඳහා ඍජු ව්‍යාපාර සම්බන්ධතා ගොඩ නැංවීමේ අරමුණින් සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් සංචාරක සල්පිල් 59ක් සහ ප්‍රචාරණ වැඩසටහන් 18ක් පවත්වන ලදී. මීට අමතරව, 2019 වසරේ දී මාස හයක ඩිජිටල් වෙළඳ දැන්වීම් ව්‍යාපාරය ඔස්සේ උමං මාර්ග සහ සංචාරකයින් ආකර්ෂණය කර ගන්නා ප්‍රසිද්ධ ස්ථාන ආවරණය කරමින් එළිමහන් ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. සී.එන්.එන්. නාලිකාව සමඟ මාස තුනක රූපවාහිනී ප්‍රචාරණ වැඩසටහනක් ක්‍රියාත්මක කළ අතර, ප්‍රධාන සංචාරක වෙළඳපොළවල් තුළ මුද්‍රිත වෙළඳ ප්‍රචාරණ සිදු කරන ලදී. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් 2019 වසරේ දී ද බ්ලොග් අඩවිකරුවන් සහ සමාජ මාධ්‍යවල බලපෑම් කළ හැකි පුද්ගලයින් 57ක් සහභාගි කරගනිමින් සංචාරක බ්ලොග්කරුවන්ගේ වැඩසටහනක් සංවිධානය කළ අතර, සංචාරක ජනමාධ්‍යවේදීන්ගේ වැඩසටහන යටතේ ජනමාධ්‍යවේදීන් 62කට අනුග්‍රහය දක්වන ලදී. මේ අතර, 2019 වසරේ දී මගී නෞකා 53කින් මගීන් 99,000ක් කොළඹ වරාය වෙත ළඟා වී ඇත. තවද, ශ්‍රී ලංකාව කලාපය තුළ විවිධත්වයෙන් යුතු වික්‍රමාන්විත සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය

කිරීම සඳහා අයන් මෑන් 70.3 සහ රේඩ් ඇමසන් වැනි ජාත්‍යන්තර වශයෙන් ජනප්‍රිය ත්‍රාසජනක ක්‍රීඩා ඉසව් කිහිපයක දෙවැනි වටය 2019 වසරේ දී ශ්‍රී ලංකාවේ දී පැවැත්විණි. මීට අමතරව, 2025 වසර වන විට එ.ජ. ඩොලර් බිලියන 10ක ආදායම් ඉලක්කයක් වෙත ළඟා වීමේ අරමුණ සහිතව ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක වෙළඳපොළවල් ආවරණය කරමින් පස් අවුරුදු ගෝලීය සන්නිවේදන ප්‍රචාරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා වී ඇත.

**පාස්කු ඉරු දින සිදු වූ ප්‍රහාරවලින් පසු විශාල වශයෙන් බිඳවැටුණු ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ගොඩ නැංවීම සඳහා එම ක්ෂේත්‍රයේ සියලුම පාර්ශ්වකරුවන් සමඟ සමීපව සාකච්ඡා කර මනා සුසංයෝගයකින් යුතු ප්‍රතිසංවිධාන සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතුව ඇත.** කෙසේ වුවද, 2009 වසර වන තෙක් දශක තුනකට වැඩි කාලයක් ත්‍රස්තවාදයෙන් පීඩා විඳි රටක් ලෙස අනපේක්ෂිත සිදුවීම් කළමනාකරණය කිරීමේ අත්දැකීම් ශ්‍රී ලංකාව සතුව ඇත. මේ අනුව, රටේ ආරක්ෂාව තර කිරීම, ආයෝජකයින්ගේ විශ්වාසය නැවත දිනා ගැනීම, සංචාරක වෙළඳපොළ වෙතින් සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම, නවාතැන් සම්බන්ධයෙන් වඩා හොඳ මිලක් සහ සේවා ප්‍රමිතීන් පිළිබඳ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මේ සඳහා අවශ්‍ය උපායමාර්ග වේ. ශ්‍රී ලංකාව සුරක්ෂිත සහ සංචාරයට සුදුසු ගමනාන්තයක් ලෙස සංචාරකයින් තුළ විශ්වාසය නැවත ඇති කිරීම සඳහා වඩා විශ්වාසදායී හදිසි ආපදා සැලසුම්, ආපදා යථා තත්ත්වයට පත් කිරීමේ වැඩසටහනක් සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් අනුගමනය කළ යුතුය. සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා කටයුතු කරන බලධාරීන් සහ සියලුම පාර්ශ්වකරුවන් සංචාරකයින්ගේ ආකල්ප වෙනස් කිරීම මගින් සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සහ රඳවා ගැනීම සඳහා බලපෑම් කළ හැකි මාධ්‍ය ව්‍යාපාරයක් නිර්මාණය කිරීම සහ ඒ සඳහා විශේෂයෙන් සමාජ මාධ්‍ය ජාල වැනි විවිධ මාධ්‍ය සමඟ එක්ව කටයුතු කිරීම අවශ්‍ය වේ. තවදුරටත්, සංචාරක ක්ෂේත්‍රය නගා සිටුවීම සඳහා සංචාරකයෙකු මෙරටට පැමිණීමේ සිට රටින් පිටවීම දක්වා ඔවුන්ගේ සමස්ත චර්යාවන් සැලකිල්ලට ගනිමින් සුහුරු තාක්ෂණය සම්බන්ධ ක්‍රම භාවිතා කිරීම අත්‍යාවශ්‍ය වේ. මෙම සුහුරු තාක්ෂණික ක්‍රම මගින් සංචාරකයින් මෙරටට පැමිණෙන විට ඔවුන් ඉලක්ක කරගත් කෙටි පණිවිඩ යැවීම, වීසා බලපත්‍ර ගැනීමේ ක්‍රියාවලිය සහ ආගමන විගමන පාලනය ස්වයංක්‍රීය කිරීම, රට පුරා ඇති ජනප්‍රිය සංචාරකයින් ආකර්ෂණය කර ගත හැකි ස්ථානවල දී අන්තර්ජාලය වෙත නොමිලේ සම්බන්ධ වීමේ හැකියාව, ඓතිහාසික ස්ථානවල දී සහ කෞතුකාගාරවල දී භාවිත කළ හැකි සංචාරකයින් සඳහා විශේෂිත නව තොරතුරු යෙදවුම් ප්‍රවර්ධනය කිරීම සහ අවසානයේ දී ඔවුන්ගේ අත්දැකීම් බෙදා ගැනීම සඳහා දිරිමත් කිරීම සිදු කළ හැක. චීනයෙන් ඇරඹී ව්‍යාප්ත වූ කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ඉදිරි කාලය තුළ සංචාරක ක්ෂේත්‍රය තවදුරටත් පසුබෑමකට ලක් විය හැකිය. 2020 වසරේ මාර්තු මාසයේ සිට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සහ අනෙකුත් සියලුම ජාත්‍යන්තර ගුවන් තොටුපොළ වෙත සියලුම රටවලින් පැමිණෙන සාමාන්‍ය මගීන් සඳහා මෙහෙයුම් කටයුතු නැවැත්වීම ඇතුළු ක්‍රියාමාර්ග හරහා වසංගතය පැතිරීම වැළැක්වීම මගින් ලංකාවේ පදිංචිකරුවන් මෙන්ම සංචාරකයින් ද එහි බලපෑමෙන් මුදවා ගැනීම සඳහා අදාළ බලධාරීන් විසින් පියවර ගනු ලැබීය.

### විදුලි සන්දේශ, පරිගණක සහ තොරතුරු සේවා

**විදුලි සන්දේශ, පරිගණක සහ තොරතුරු සේවාවලින් ලද ඉපැයීම් 2019 වසරේ දී අඛණ්ඩව වර්ධනය විය.** විදුලි සන්දේශ, පරිගණක හා තොරතුරු සේවා අපනයන ඉපැයීම් 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,054ක් දක්වා සියයට 5.9කින් වර්ධනය විය. විදුලි සන්දේශ උප අංශයෙහි ඉපැයීම් 2018 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 147 සිට 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 155ක් දක්වා වර්ධනය විය. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් අධිවේගී දත්ත සේවා සපයන අන්තර්ජාලය මත පදනම් වූ සන්නිවේදන පහසුකම් භාවිතය වැඩි වීම හේතු විය. පනවා තිබූ විදුලි සන්දේශ බද්ද 2019 දෙසැම්බර් මාසයේ සිට අඩු කිරීමට රජය විසින් පියවර ගත් අතර, එය විදුලි සන්දේශ ක්ෂේත්‍රයේ වර්ධනය ඉහළ නැංවීමට ආධාර වනු ඇතැයි අපේක්ෂා කෙරේ. විදුලි සන්දේශ ක්ෂේත්‍රයේ දත්ත මත පදනම් කරගත් වර්ධනය සැලකිය යුතු ලෙස ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, හතරවන පරම්පරාවේ තාක්ෂණය (4G) සහිත ස්මාර්ට් දුරකථන භාවිතය සැලකිය යුතු ලෙස වර්ධනය වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. විදුලි සන්දේශ යටිතල පහසුකම් තවදුරටත් දියුණු කරමින් පස්වන පරම්පරාවේ තාක්ෂණික ජාලයක් (5G) දියත් කිරීමේ හැකියාව පිළිබඳව විදුලි සන්දේශ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයන් සොයා බලමින් සිටින අතර, මෙමගින් හතරවන පරම්පරාවේ තාක්ෂණික ජාලවලට (4G-LTE) වඩා දස ගුණයක ඉහළ වේගයකින් දත්ත හුවමාරු කිරීම සඳහා පහසුකම් සැලසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

5

**පරිගණක හා තොරතුරු සේවා උප අංශයේ වර්ධන ප්‍රවණතාව 2019 දී අඛණ්ඩව පැවතුණි.** ඒ අනුව, පරිගණක හා තොරතුරු සේවා සඳහා වූ ලැබීම් 2018 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 848 සිට 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 899ක් දක්වා ඉහළ ගියේය. ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (BPO) සහ දැනුම පදනම් කරගත් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (KPO) යන අංශවල අඛණ්ඩ වර්ධනය පරිගණක හා තොරතුරු අංශයේ වර්ධනය සඳහා දායක විය. සේවා බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ කර්මාන්ත සඳහා වන කර්මාන්ත සංගමය සහ වෘත්තීය ආයතනය වන එක්සත් රාජධානියේ Global Sourcing Associaion විසින් ශ්‍රී ලංකාව වෙත 2019 වසරේ දී Delivery Destination Award පිරිනමන ලදී. තොරතුරු තාක්ෂණය පදනම් කරගත් දැනුම සහ තොරතුරු කර්මාන්තය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික මණ්ඩලය වශයෙන් ශ්‍රී ලංකා මෘදුකාංග සහ සේවා සමාගම් සංගමය (SLASSCOM) ව්‍යාපාර පහසුකම් සැපයීම, අධ්‍යාපනය සහ රැකියා වැඩිදියුණු කිරීම මෙන්ම ක්ෂේත්‍රයේ පර්යේෂණ සහ නවෝත්පාදන සම්බන්ධ වැඩසටහන් රාශියක් සංවිධානය කරමින් සිය පාර්ශ්වකරුවන්ගේ සහයෝගීතාවයෙන් ක්ෂේත්‍රයේ වර්ධනය හා නවෝත්පාදන හා සම්බන්ධ ප්‍රධාන අංග ප්‍රවර්ධනය අඛණ්ඩව සිදු කරන ලදී.



### 5.4.2 ප්‍රාථමික ආදායම

**2019 වසරේ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය සුළු වශයෙන් පුළුල් විය.** විදේශීය සෘජු ආයෝජන සමාගම් විසින් ලාභාංශ ගෙවීම් සහ ප්‍රතිආයෝජිත ඉපැයීම් ඉහළ යෑම හමුවේ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය 2018 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 2,385 සමඟ සැසඳීමේ දී 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,426ක් දක්වා ඉහළ ගියේය. ලාභ ඉපැයූ සෘජු ආයෝජන ව්‍යාපාර වැඩි වශයෙන් ලාභාංශ ගෙවීම් සිදු කිරීමත් සමඟ 2019 වසරේ දී ලාභාංශ ගෙවීම් පෙර වසරට සාපේක්ෂව ඉහළ ගියේය. විශේෂයෙන් ප්‍රසිද්ධ ලැයිස්තුගත සමාගම් වන සමහර විශාල සෘජු ආයෝජන ව්‍යාපාර ඉපැයූ ලාභ සාපේක්ෂව ඉහළ යෑමත් සමඟ 2019 වසරේ දී ප්‍රතිආයෝජිත ඉපැයීම් ද ඉහළ ගියේය. වසර තුළ දී, ප්‍රධාන වශයෙන්, නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා කූපන ගෙවීම් ඉහළ යෑම හේතුවෙන් විවිධ ආයෝජන සඳහා වූ පොලී ගෙවීම්වල සුළු ඉහළ යෑමක් පෙන්නුම් කළ අතර, නොපියවා ඉතිරිව ඇති භාණ්ඩාගාර බැඳුම්කරවල විදේශීය ආයෝජන සැලකිය යුතු ලෙස පහළ යෑම හේතුවෙන් භාණ්ඩාගාර බැඳුම්කර මත වූ කූපන ගෙවීම් කැපී පෙනෙන ලෙස අඩු විය. තැන්පතු භාරගන්නා ආයතන විසින් නිකුත් කළ ජාත්‍යන්තර බැඳුම්කර සියල්ලම කල් පිරීම හේතුවෙන් තැන්පතු භාරගන්නා ආයතන විසින් සිදු කළ කූපන ගෙවීම් 2019 වසර අවසානය වන විට සැලකිය යුතු ලෙස අඩු විය. වසර තුළ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ අනෙකුත් ආයෝජන සඳහා පොලී ගෙවීම් යටතේ වාර්තා කරනු ලබන රජයේ විදේශීය ණය සඳහා වන පොලී ගෙවීම් සුළු වශයෙන් ඉහළ ගිය අතර, තැන්පතු භාරගන්නා ආයතන විසින් ලබා ගත් විදේශීය ණය සඳහා වූ පොලී ගෙවීම් සුළු අඩු වීමක් වාර්තා කළේය. මේ අතර, ප්‍රධාන වශයෙන් තැන්පතු භාරගන්නා ආයතනවල පොලී ආදායම් ඉහළ යෑම හේතුවෙන් ප්‍රාථමික ආදායම් ගිණුම වෙත වූ ලැබීම් 2018 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 249ට සාපේක්ෂව 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 252ක් විය.

### 5.4.3 ද්විතීයික ආදායම

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ 2019 වසරේ දී තවදුරටත් අඩු විය.** ද්විතීයික ආදායම් ගිණුමේ ලැබීම් සඳහා වැඩි දායකත්වයක් සපයන විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ, 2018 වසරේ දී සියයට 2.1ක අඩු වීමක් වාර්තා කිරීමෙන් පසුව, 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 6,717ක් දක්වා සියයට 4.3කින් පහළ ගියේය. ජාත්‍යන්තර වෙළඳපොළේ බනිජ තෙල් මිල ගණන් විචලනය වීම හමුවේ, වැඩි වශයෙන් විදේශීය සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වාර්තා වන මැද පෙරදිග කලාපයේ රටවල භූ-දේශපාලනික ප්‍රවණතා හේතුවෙන් විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ බලපෑමට ලක් විය. තවද, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දත්ත අනුව, 2019 වසරේ දී ද විදේශ රැකියා සඳහා වූ සමස්ත ශ්‍රම සංක්‍රමණය පහළ යෑමේ ප්‍රවණතාව තවදුරටත් දක්නට ලැබුණි. දේශීය ශ්‍රම වෙළඳපොළහි රැකියා අවස්ථා බහුල වීම සහ නුපුහුණු කාන්තා ශ්‍රම සංක්‍රමණය අධෛර්යවත් කිරීමට රජය විසින් අඛණ්ඩව අනුගමනය කළ ක්‍රියාමාර්ග විදේශ රැකියා සඳහා ශ්‍රම සංක්‍රමණය පහළ යෑම සඳහා හේතු විය. ඒ අනුව, ද්විතීයික ආදායම් ගිණුම වෙත වූ ලැබීම් 2018 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 7,023 සමඟ සැසඳීමේ දී 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 6,726ක් දක්වා අඩු විය. මේ අතර, ශ්‍රී ලංකාවේ වෙසෙන අනේවාසිකයන් විසින් සිදු කරන ලද පෞද්ගලික සංක්‍රාම සහ ඒ හා සම්බන්ධ ගෙවීම් 2019 වසරේ දී වැඩි වීමක් වාර්තා කළේය. මෙම ප්‍රවණතා හමුවේ, ද්විතීයික ආදායම් ගිණුම වෙත වූ ශුද්ධ ලැබීම් 2018 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 6,163 සමඟ සැසඳීමේ දී 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 5,766ක් දක්වා අඩු විය.

## 5.5 ජංගම ගිණුමේ ශේෂය

**2018 වසරේ දී ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස 2019 වසරේ දී ජංගම ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස පහළ ගියේය.** ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය සුළු වශයෙන් පුළුල් වීම සහ සේවා ගිණුමෙහි හා ද්විතීයික ආදායම් ගිණුමෙහි අතිරික්තයන් මධ්‍යස්ථ අගයක පැවතීම හමුවේ වුව ද, ප්‍රධාන වශයෙන් වෙළඳ ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස අඩු වීම හේතුවෙන් ජංගම ගිණුමේ හිඟය අඩු විය. භාණ්ඩ ආනයන වියදම සැලකිය යුතු ලෙස අඩු වීම සහ භාණ්ඩ අපනයන ආදායම සුළු වර්ධනයක් වාර්තා කිරීම හේතුවෙන් වසර තුළ දී වෙළඳ ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස අඩු විය. ප්‍රධාන වශයෙන්, පාස්කු ඉරු දින ප්‍රහාරයන්ගේ බලපෑම හේතුවෙන් සංචාරක ඉපැයීම් අඩු වීම හමුවේ සේවා ගිණුමේ අතිරික්තය අඩු විය. සෘජු ආයෝජන ව්‍යාපාරවල ලාභාංශ ගෙවීම් සහ ප්‍රතිආයෝජිත ඉපැයීම් ඉහළ යෑම හේතුවෙන් වසර තුළ දී, ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය සුළු වශයෙන් පුළුල් විය. වසර තුළ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ පහළ යෑම හේතුවෙන් ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්තය පහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස ජංගම ගිණුමේ හිඟය 2018 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 2,799 සමඟ සැසඳීමේ දී 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,808ක් දක්වා පහළ ගිය අතර, 2018 වසරේ දී ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 3.2ක් වූ ජංගම ගිණුමේ හිඟය 2019 වසරේ දී ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 2.2ක් දක්වා පහළ ගියේය.

## 5.6 ප්‍රාග්ධන ගිණුමේ ශේෂය


**2019 වසරේ දී ප්‍රාග්ධන ගිණුම වෙත වූ ලැබීම් සුළු වශයෙන් ඉහළ ගියේය.** රජය සහ පෞද්ගලික අංශය වෙත ලැබුණු ප්‍රාග්ධන සංක්‍රාම ඉහළ යෑම හේතුවෙන්, ශුද්ධ පදනම මත ප්‍රාග්ධන ගිණුම වෙත වූ ලැබීම් 2018 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 14 සමඟ සැසඳීමේ දී 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 23ක් ලෙස සුළු වැඩිවීමක් වාර්තා කළේය.

## 5.7 මූල්‍ය ගිණුම

**මූල්‍ය ගිණුම වෙත වූ සැලකිය යුතු ලැබීම්වල ප්‍රතිඵලයක් ලෙස 2019 වසරේ දී ශුද්ධ විදේශීය වගකීම් වෙනස්වීම් මෙන්ම ශුද්ධ මූල්‍ය වත්කම් අත්කර ගැනීම් ද 2018 වසරට සාපේක්ෂව ඉහළ ගියේය.** ණය ආපසු ගෙවීම්වලට සාපේක්ෂව රජය විසින් ලබාගත් විදේශීය ණය ඉහළ යෑම හේතුවෙන් මූල්‍ය ගිණුම වෙත ඉහළ ශුද්ධ ලැබීම් ප්‍රමාණයක් වාර්තා වූ අතර, එමගින් 2019 වසරේ දී ශුද්ධ විදේශීය වගකීම් වෙනස්වීම් වැඩි විය. ඒ අනුව, ශුද්ධ විදේශීය වගකීම් වෙනස් වීම් 2018 වසර තුළ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 2,816 හා සැසඳීමේ දී 2019 වසර තුළ දී එ.ජ. ඩොලර් මිලියන 2,947ක් විය. 2018 වසරේ දී වාර්තා වූ වත්කම්වල ශුද්ධ අඩු වීම හා සැසඳීමේ දී, 2019 වසර තුළ දී ප්‍රධාන වශයෙන් දළ නිල සංචිත ඉහළ යෑම හේතුවෙන් ශුද්ධ මූල්‍ය වත්කම් අත්කරගැනීම් ද එ.ජ. ඩොලර් මිලියන 514කින් ඉහළ ගියේය. 2019 වසරේ මාර්තු සහ ජූනි මාසවල දී රජය විසින් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර දෙකක් නිකුත් කිරීමෙන් ලැබුණු එ.ජ. ඩොලර් බිලියන 4.4ක සහ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි හයවන සහ හත්වන වාරික මුදා හැරීම මගින් වූ ලැබීම් 2019 වසර තුළ දී මූල්‍ය ගිණුම වෙත වූ ප්‍රධාන ලැබීම් විය. පාස්කු ඉරු දින ප්‍රහාරවලින් පසු ආයෝජකයින්ගේ විශ්වාසය අඩු වීම සහ 2019 වසරේ අග භාගයේ දී ජනාධිපතිවරණය හේතුවෙන් ඇති වූ අවිනිශ්චිතතාව මූලික කොට ගෙන විදේශීය සෘජු ආයෝජන ලෙසින් වූ හිමිකම් කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් සැලකිය යුතු ලෙස අඩු වීම සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් වූ විදේශීය ආයෝජන ගෙවීම් මෙම වසර තුළ දී දැකිය හැකි විය. 2019 අප්‍රේල් සිට අගෝස්තු දක්වා සහ දෙසැම්බර් මාසයේ දී විශාල ශුද්ධ ගෙවීම් සමඟ රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ තුළින් වරින්වර විදේශීය ආයෝජන ගෙවීම් වාර්තා විය. මෙම විචලනයන් හමුවේ වුවද, දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ ඇතැම් කාලවලදී සාමාන්‍ය ප්‍රමාණයක ශුද්ධ ලැබීම්

**5.11 රූප සටහන**

**මූල්‍ය ගිණුම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### 5.9.අ. සංඛ්‍යා සටහන
### මූල්‍ය ගිණුම

එ.ජ. ඩොලර් මිලියන

| ශීර්ෂය | 2018 (අ) | | 2019 (ආ) | |
|---|---|---|---|---|
| | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් |
| **මූල්‍ය ගිණුම** | **-562** | **2,816** | **514** | **2,947** |
| **සෘජු ආයෝජන** | **68** | **1,614** | **77** | **758** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | 58 | 463 | 65 | 384 |
| ප්‍රති ආයෝජිත ඉපැයුම් නොවන හිමිකම් | 48 | 238 | 52 | 120 |
| සෘජු ආයෝජකයින් විසින් සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි | 48 | 238 | 52 | 120 |
| ප්‍රති ආයෝජිත ඉපැයුම් | 10 | 225 | 13 | 264 |
| ණය උපකරණ | 10 | 1,151 | 13 | 374 |
| සෘජු ආයෝජකයින් විසින් සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි | 10 | 1,151 | 13 | 374 |
| **විවිධ ආයෝජන** | **-** | **129** | **-** | **2,303** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | - | -4 | - | -15 |
| ණය සුරැකුම්පත් | - | 134 | - | 2,317 |
| තැන්පතු භාරගන්නා ආයතන | - | -1,350 | - | -250 |
| දිගු කාලීන | - | -1,350 | - | -250 |
| රජය | - | 1,484 | - | 2,567 |
| කෙටි කාලීන (භාණ්ඩාගාර බිල්පත්) | - | -96 | - | 55 |
| දිගු කාලීන | - | 1,580 | - | 2,513 |
| භාණ්ඩාගාර බැඳුම්කර | - | -894 | - | -388 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | - | -26 | - | 1 |
| ස්වෛරීත්ව බැඳුම්කර | - | 2,500 | - | 2,900 |
| **මූල්‍ය ව්‍යුත්පන්න** | - | - | - | - |
| **අනෙකුත් ආයෝජන** | **372** | **1,073** | **100** | **-114** |
| මුදල් සහ තැන්පතු | 80 | -632 | -93 | 167 |
| මහ බැංකුව | - | -1 | - | ... |
| කෙටි කාලීන | - | -1 | - | ... |
| තැන්පතු භාරගන්නා ආයතන | 80 | -631 | -93 | 168 |
| කෙටි කාලීන | -189 | -631 | 6 | 168 |
| දිගු කාලීන | 268 | - | -99 | - |
| **පිටු අංක 204 හා සම්බන්ධයි** | | | | |
| **විශේෂිත අයිතමයන්** | | | | |
| **විදේශීය සෘජු ආයෝජන** | | | | |
| හිමිකම් | | 238 | | 120 |
| ප්‍රති ආයෝජිත ඉපැයුම් | | 225 | | 264 |
| අන්තර් සමාගම් ණය | | 1581 | | 391 |
| අන්තර් සමාගම් ණය ආපසු ගෙවීම් | | -430 | | -17 |
| **මුළු විදේශීය සෘජු ආයෝජන (1)** | | **1,614** | | **758** |
| ආයෝජන මණ්ඩලයේ සමාගම්වලට ලබා දුන් ණය (2) | | 525 | | 445 |
| **ආයෝජන මණ්ඩලයේ සමාගම්වලට ලබා දුන් ණයද ඇතුළුව මුළු විදේශීය සෘජු ආයෝජන (1+2) (ඇ)** | | **2,139** | | **1,204** |
| **කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ මුළු ශුද්ධ ලැබීම්** | | **-55** | | **-35** |
| සෘජු ආයෝජන | | -51 | | -20 |
| විවිධ ආයෝජන | | -4 | | -15 |
| **රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත්හි ශුද්ධ විදේශීය ආයෝජන (භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර)** | | **-990** | | **-334** |
| විදේශීය මිල දී ගැනීම් | | 706 | | 596 |
| විදේශීය විකුණුම් | | 1,696 | | 930 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ආයෝජන මණ්ඩලයේ ඇස්තමේන්තුවලින් වෙනස් වනුයේ ආවරණ සහ ගණනය කිරීමේ ක්‍රමවේදයන්හි වෙනස්කම් හේතුවෙනි.

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

නිරීක්ෂණය වූ අතර, එමගින් ශ්‍රී ලංකා මහ බැංකුවට ශුද්ධ පදනම මත විදේශ විනිමය මිලදී ගැනීමට හැකි විය. එ.ජ. ඩොලර් බිලියන 1.5ක මුළු වටිනාකමකින් යුත් කල්පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර දෙකක් ආපසු ගෙවීම මෙන්ම විදේශ ව්‍යවහාර මුදල් කාලීන මූල්‍ය පහසුකම් සහ කල්පිරුණු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආපසු ගෙවීම් ආකාරයෙන් 2019 වසරේ දී රජයට සැලකිය යුතු ප්‍රමාණයක ණය වගකීම් ආපසු ගෙවීමට සිදු විය. ඉහළ ණය සේවාකරණය හේතුවෙන් ශුද්ධ ගෙවීම් සිදු කිරීමත් සමග බැංකු අංශය, පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් වෙත වූ මූල්‍ය ප්‍රවාහ අඩු විය. 2019 වසරේ දී තැන්පතු භාරගන්නා ආයතන විසින් ද පෙර නිකුත් කරන ලද ජාත්‍යන්තර බැඳුම්කරයක් සම්පූර්ණයෙන් ගෙවා නිම කරන ලදී. මෙම ප්‍රවණතා සමග 2018 වසර අවසානය වන විට පැවති දළ නිල සංචිත එ.ජ. ඩොලර් බිලියන 6.9 සිට 2019 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 7.6ක් දක්වා වැඩි වූ අතර, ගෙවුම් තුලනයේ සමස්ත ශේෂය 2019 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 377ක අතිරික්තයක් වාර්තා කළේය.

## 5.7.1 සෘජු ආයෝජන

**ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් විසින් ලබා ගත් විදේශීය ණය ද ඇතුළත් විදේශීය සෘජු ආයෝජන ලැබීම් 2019 වසරේ දී සැලකිය යුතු ලෙස අඩු විය.** 2019 වසරේ දී ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් ලබා ගත් විදේශීය ණය ද ඇතුළත් මුළු විදේශීය සෘජු ආයෝජන ලැබීම් ප්‍රමාණය, එ.ජ. ඩොලර් මිලියන 1,204ක් විය. විදේශීය සෘජු ආයෝජන ලැබීම් 2018 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 2,139 (රජය වෙත ලැබුණු හම්බන්තොට වරාය හා සම්බන්ධ ආයෝජන හැර එ.ජ. ඩොලර් මිලියන 1,457) සහ 2017 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,910 සමග සැසඳීමේ දී 2019 වසරේ දී අඩු වීමක් වාර්තා කළේය. පාස්කු ඉරු දින ප්‍රහාරවලින් පසුව සහ දේශපාලනික ප්‍රවණතා නිසා ඉහළ ගිය අවිනිශ්චිතතා හමුවේ ආයෝජක විශ්වාසය අඩු වීම, විදේශීය සෘජු ආයෝජන අඩු වීමට මූලික වශයෙන් හේතු විය හැකිය. 2019 වසර තුළ දී, ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් ලබා ගත් ණය ඉවත් කළ පසු විදේශීය සෘජු ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 758ක් වූ අතර, එය ශුද්ධ අන්තර් සමාගම් ණය එ.ජ. ඩොලර් මිලියන 374කින්, ප්‍රතිආයෝජිත ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 264කින් සහ හිමිකම් කොටස් වෙත වූ ශුද්ධ ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 120කින් සමන්විත විය. මීට සාපේක්ෂව, 2018 වසරේ දී ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් ලබාගත් ණය ඉවත් කළ පසු

විදේශීය සෘජු ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 1,614ක් විය. 2019 වසරේ දී හිමිකම් කොටස් වෙත වූ ආයෝජන සහ අන්තර් සමාගම් ණය පෙර වසරට සාපේක්ෂව සැලකිය යුතු අඩුවීමක් වාර්තා කළේය. කෙසේ වෙතත්, කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත විශාල විදේශීය සෘජු ආයෝජන සමාගම් කිහිපයක් විසින් සිදු කළ ප්‍රතිආයෝජිත ඉපැයීම් හිතකර මට්ටමක පැවතුණි. ආංශික පදනම මත සැලකූ විට, ප්‍රධාන වශයෙන් විදේශීය සෘජු ආයෝජන යොමු වූයේ වරාය යටිතල පහසුකම්, දේපළ සංවර්ධනය හා හෝටල් සහ විදුලි සංදේශ අංශයට අදාළ ව්‍යාපෘති වෙතය. රට වෙත ආයෝජන ලැබුණු ආසන්නතම රට අනුව ගත් කල, ඉන්දියාව, සිංගප්පූරුව, කැනඩාව, හොංකොං සහ චීනය 2019 වසරේ විදේශීය සෘජු ආයෝජන ලැබුණු ප්‍රධාන මූලාශ්‍ර පහ විය. කෙටි කාලීනව විදේශීය සෘජු ආයෝජන අඩු වීමක් වාර්තා කළ ද, හම්බන්තොට කාර්මික කලාපය, කොළඹ වරාය නගරය, හෝටල් අංශය සහ මිශ්‍ර සංවර්ධන අංශය වෙත ඉදිරි වසරවල දී සැලකිය යුතු ලැබීම් ආකර්ෂණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ සංවර්ධනය ඉලක්ක කර ගනිමින් විදුලි සන්දේශ අංශය වෙතට ද සැලකිය යුතු විදේශීය සෘජු ආයෝජන ප්‍රමාණයක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. උපායමාර්ගික ව්‍යාපෘති සංවර්ධන පනත ක්‍රියාත්මක කිරීම මෙන්ම බදු ව්‍යුහය වෙත මෑතකාලීනව සිදු කළ සංශෝධන විදේශීය සෘජු ආයෝජන වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීමට හේතු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, ව්‍යාපාර කිරීමේ පහසුව පිළිබිඹු කරන දර්ශකයේ ශ්‍රේණිගත කිරීමට අනුව ශ්‍රී ලංකාව සාපේක්ෂව පහළ මට්ටමක සිටීම, කලාපයේ අනෙකුත් රටවල් සමඟ සැසඳීමේ දී වැටුප් අනුපාත හා උපයෝගීතා පිරිවැය ඉහළ මට්ටමක පැවතීම, ඉඩම් අත්පත් කර ගැනීමේ දී දැරීමට සිදුවන අධික පිරිවැය, කම්කරු නීති දැඩි වීම සහ රාජ්‍ය අංශයේ ක්‍රියා පටිපාටි වැනි අඛණ්ඩව පවතින ගැටලු, රට වෙතට විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම සම්බන්ධයෙන් දිගින් දිගටම පවතින ප්‍රධාන බාධාවන් වේ.

### 5.7.2 විවිධ ආයෝජන

#### හිමිකම්

**සෘජු ආයෝජන හැර කොළඹ කොටස් වෙළඳපොළෙහි හිමිකම් කොටස් වෙත ලැබුණු විදේශීය ආයෝජන මගින් පිළිබිඹු වන හිමිකම් කොටස් වෙත වූ විදේශීය ආයෝජන, 2019 වසරේ දී ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.** හිමිකම් කොටස් මත සිදු කෙරෙන විවිධ ආයෝජන සමන්විත වනුයේ සෘජු ආයෝජන ගනුදෙනු හැර ශ්‍රී ලාංකික ව්‍යාපාරයක අනේවාසිකයන් සතුව ඇති මුළු කොටස් ප්‍රමාණයෙන් සියයට 10කට වඩා අඩු ආයෝජන වශයෙන් කොළඹ කොටස් වෙළඳපොළෙහි අනේවාසිකයින් විසින් සිදු කරනු ලබන ආයෝජනවලිනි. 2019 වසරේ දී හිමිකම් කොටස් වෙත වූ විවිධ ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 15ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. එය සමන්විත වූයේ ද්විතීයික වෙළඳපොළ වෙතින් වූ එ.ජ. ඩොලර් මිලියන 45ක ශුද්ධ ගෙවීමකින් සහ ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ එ.ජ. ඩොලර් මිලියන 30ක ලැබීම් තුළිනි.

#### ණය සුරැකුම්පත්

**රජය විසින් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර දෙකක් නිකුත් කිරීමත් සමඟ 2019 වසරේ දී ණය සුරැකුම්පත් ස්වරූපයෙන් වූ මූල්‍ය ප්‍රවාහ සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.** ජාත්‍යන්තර බැඳුම්කර වෙළඳපොළෙහි ශ්‍රී ලංකාවේ දහතුන්වන සහ දාහතරවන එ.ජ. ඩොලර් බැඳුම්කර නිකුතු පිළිවෙළින් 2019 මාර්තු සහ ජූනි මාසවල දී සාර්ථකව සිදු කරන ලදී. 2019 මාර්තු මාසයේ දී එ.ජ. ඩොලර් බිලියන 2.4ක වටිනාකමකින් යුතු වසර 5ක සහ වසර 10ක කල්පිරීම් සහිත ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර දෙකක් නිකුත් කරන ලද අතර, 2019 ජූනි මාසයේ දී වසර 5ක සහ වසර 10ක කල්පිරීම් සහිත එ.ජ. ඩොලර් බිලියන 2ක් වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර දෙකක් නිකුත් කරන ලදී. ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ඉදිරි දැක්ම කෙරෙහි ගෝලීය ආයෝජකයින්ගේ අඛණ්ඩ විශ්වාසය පිළිබිඹු කරමින් මෙම වෙන්දේසිවලදී පුළුල් පරාසයක විහිදුණු ආයෝජකයින් රැසකගේ දැඩි උනන්දුවක් දක්නට ලැබුණි. රජය විසින් 2019 ජනවාරි මස කල්පිරුණු එ.ජ. ඩොලර් බිලියන 1ක වටිනාකමකින් යුත් සහ 2019 අප්‍රේල් මස කල්පිරුණු එ.ජ. ඩොලර් මිලියන 500ක වටිනාකමකින් යුත් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර දෙකක් ද පියවන ලදී. 2019 වසරේ දී භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළෙන් එ.ජ. ඩොලර් මිලියන 388ක සැලකිය යුතු ශුද්ධ විදේශීය ගෙවීම් ප්‍රමාණයක් වාර්තා විය. මේ අතර, 2019 වසරේ දී භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 55ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. වසර තුළ දී, තැන්පතු භාරගන්නා ආයතන විසින් ද එ.ජ. ඩොලර් මිලියන 250ක් වූ ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුවක අවසාන වාරිකය ආපසු ගෙවන ලදී.

5

### 5.7.3 වෙනත් ආයෝජන

#### මුදල් සහ තැන්පතු

**තැන්පතු භාරගන්නා ආයතන සැලකීමේ දී 2019 වසර තුළ දී, එම ආයතනවල මුදල් සහ තැන්පතු වත්කම් අඩු වූ අතර, මුදල් සහ තැන්පතු වගකීම් ඉහළ ගියේය.** ඒ අනුව, 2019 වසරේ දී තැන්පතු භාරගන්නා ආයතනවල වත්කම් ස්වරූපයෙන් වූ මුදල් සහ තැන්පතු එ.ජ. ඩොලර් මිලියන 93කින් අඩු වූ අතර, මුදල් සහ තැන්පතු වගකීම් එ.ජ. ඩොලර් මිලියන 167කින් වැඩි විය. වසර තුළ දී, සාපේක්ෂ ලෙස අඩු වූ ශුද්ධ ගනුදෙනු මගින් ද දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ස්ථායීතාව තරමක් දුරට නිරූපණය කෙරිණි.

#### විදේශීය ණය

**2019 වසරේ දී මූල්‍ය ගිණුම වෙත වූ ශුද්ධ විදේශීය ණය ලැබීම් අඩු විය.** 2019 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වූ ශුද්ධ ණය ලැබීම් වැඩි වුවද, ශුද්ධ විදේශීය ණය ලැබීම් අඩු වීමට තැන්පතු භාරගන්නා ආයතන, රජය, රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ පෞද්ගලික ආයතන මගින් සිදු කළ ශුද්ධ විදේශීය ණය ආපසු ගෙවීම් ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, 2019 වසරේ දී මූල්‍ය ගිණුම වෙත වූ විදේශීය ණය 2018 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 1,620ක ශුද්ධ ලැබීමට සාපේක්ෂව සැලකිය යුතු ලෙස වෙනස් වෙමින් එ.ජ. ඩොලර් මිලියන 277ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.

**2019 වසරේ දී විදේශීය ණය ස්වරූපයෙන් රජය වෙත වූ ශුද්ධ ලැබීම්වල අඩු වීමක් වාර්තා විය.** ඒ අනුව, රජය වෙත වූ විදේශීය ණය ප්‍රවාහ, 2018 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 557ක ශුද්ධ ලැබීම් හා සැසඳීමේ දී 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 97ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. වසර තුළ දී එ.ජ. ඩොලර් මිලියන 1,662ක විදේශීය ණය ආපසු ගෙවීම් සහ එ.ජ. ඩොලර් මිලියන 1,565ක් වූ විදේශීය ණය ලැබීම් හේතුවෙන් මෙම ශුද්ධ ගෙවීම වාර්තා විය. රජයේ ව්‍යාපෘති සඳහා වූ ප්‍රධාන ණය ලැබීම් තුළ පිටත වටරවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය යටතේ කෙරවලපිටිය සිට කඩවත දක්වා වූ 3 වන අදියර, දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය යටතේ මාතර සිට බෙලිඅත්ත දක්වා වූ 1 වන කොටස සහ දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය යටතේ බෙලිඅත්ත සිට වැටිය දක්වා වූ ව්‍යාපෘතියේ 2 වන කොටස යනාදිය සඳහා ලබාගත් ණය

**5.9.ආ සංඛ්‍යා සටහන**

**මූල්‍ය ගිණුම**

එ.ජ. ඩොලර් මිලියන

| ශීර්ෂය | 2018 (අ) | | 2019 (ආ) | |
|---|---|---|---|---|
| | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් |
| අනෙකුත් ආයෝජන (පිටු අංක 202 හා සම්බන්ධයි) | | | | |
| ණය | - | 1,620 | - | -277 |
| මහ බැංකුව | - | 252 | - | 327 |
| ජා.මූ. අරමුදලෙන් ලද ණය | - | 252 | - | 327 |
| විස්තීර්ණ ණය පහසුකම | - | 252 | - | 327 |
| තැන්පතු භාරගන්නා ආයතන | - | 697 | - | -281 |
| කෙටි කාලීන | - | 844 | - | -1 |
| දිගු කාලීන | - | -146 | - | -280 |
| රජය | - | 557 | - | -97 |
| දිගු කාලීන | - | 557 | - | -97 |
| අනෙකුත් අංශ (ඇ) | - | 114 | - | -226 |
| දිගු කාලීන | - | 114 | - | -226 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | 177 | 247 | -4 | -28 |
| තැන්පතු භාරගන්නා ආයතන | -10 | - | -8 | - |
| කෙටි කාලීන | -10 | - | -8 | - |
| අනෙකුත් අංශ (ඈ) | 186 | 247 | 4 | -28 |
| කෙටි කාලීන | 186 | 247 | 4 | -28 |
| අනෙකුත් ලැබිය යුතු / ගෙවිය යුතු ගිණුම් | 116 | -162 | 196 | 24 |
| මහ බැංකුව | - | -162 | - | 24 |
| කෙටි කාලීන (ඉ) | - | -162 | - | 24 |
| තැන්පතු භාරගන්නා ආයතන | 116 | - | 196 | - |
| කෙටි කාලීන | 116 | - | 196 | - |
| විශේෂ ගැනුම් හිමිකම් | - | - | - | - |
| **සංචිත වත්කම්** | **-1,002** | | **337** | |
| මූල්‍ය රත්‍රන් | -103 | | -14 | |
| විශේෂ ගැනුම් හිමිකම් | -3 | | 6 | |
| ජා. මූ. අරමුදලේ සංචිත මට්ටම | - | | - | |
| අනෙකුත් සංචිත වත්කම් | -895 | | 346 | |
| මුදල් සහ තැන්පතු | -1,011 | | 361 | |
| මූල්‍ය අධිකාරියේ හිමිකම් | 466 | | -174 | |
| අනෙකුත් ආයතනයන්හි හිමිකම් | -1,477 | | 535 | |
| සුරැකුම්පත් | 122 | | -19 | |
| ණය සුරැකුම්පත් | 122 | | -19 | |
| දිගු කාලීන | 122 | | -19 | |
| අනෙකුත් හිමිකම් | -6 | | 3 | |
| **මූල්‍ය ගිණුම (ශුද්ධ)** | **-3,378** | | **-2,432** | |
| **විශේෂිත අයිතමයන්** | | | | |
| **රජයේ දිගු කාලීන ණය (ශුද්ධ)** | | **557** | | **-97** |
| ලැබීම් (ණය මුදා හැරීම්) | | 2,328 | | 1,565 |
| ව්‍යාපෘති ණය | | 1,203 | | 1,565 |
| විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම | | 1,000 | | - |
| වැඩසටහන් ණය | | 125 | | - |
| ගෙවීම් | | 1,771 | | 1,662 |

මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ පෞද්ගලික අංශයේ සමාගම් ඇතුළත් වේ.
(ඈ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ පෞද්ගලික අංශයේ සමාගම්වල වෙළඳ ණය ඇතුළත් වේ.
(ඉ) ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම්වල ශුද්ධ ගනුදෙනු ඇතුළත් වේ.

5

**5.10 සංඛ්‍යා සටහන**

**2019 වසර තුළ විදේශ ණය මගින් මූල්‍යනය කරන ලද ප්‍රධාන ව්‍යාපෘතීන්**

| දායකයා සහ ව්‍යාපෘතිය | ලැබුණු ණය මුදල එ.ජ. ඩොලර් මිලියන |
|---|---|
| **රජයේ ව්‍යාපෘතීන් මුළු එකතුව** | **1,565** |
| එයින්; | |
| **චීන අපනයන - ආනයන බැංකුව** | **637** |
| එයින්; | |
| පිටත වටරවුම් අධිවේගි මාර්ග ව්‍යාපෘතිය - 3 වන අදියර කෙරවලපිටිය සිට කඩවත දක්වා | 169 |
| දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය - 1 කොටස මාතර සිට බෙලිඅත්ත දක්වා | 164 |
| දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය - 2 කොටස බෙලිඅත්ත සිට වැටිය දක්වා | 71 |
| දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය - 4 කොටස | |
| අන්දරවැව හරහා මත්තල සිට හම්බන්තොට දක්වා | 58 |
| හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය - 2 වන අදියර | 46 |
| **ආසියානු සංවර්ධන බැංකුව** | **280** |
| එයින්; | |
| දෙවන ඒකාබද්ධ මහාමාර්ග ආයෝජන වැඩසටහන - 1 වන වාරිකය | 53 |
| කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ණය යෝජනා ක්‍රමය - අතිරේක මූල්‍යනය | 38 |
| ඒකාබද්ධ මහාමාර්ග ආයෝජන වැඩසටහන - 4 වන වාරිකය | 27 |
| පියසි මත සූර්ය බලශක්තිය උත්පාදනය කිරීමේ ව්‍යාපෘතිය | 19 |
| **ජපානය** | **178** |
| එයින්; | |
| කැලණි ගඟ හරහා නව පාලමක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 68 |
| හබරන - වේයන්ගොඩ සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය | 28 |
| ජාතික මාර්ග ජාලයේ නායයෑම් ආපදා වැළැක්වීමේ ව්‍යාපෘතිය | 20 |
| මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ අලාභ අඩු කිරීමේ ව්‍යාපෘතිය | 14 |
| මහනුවර නගරයේ අපවහන කළමණාකරණ ව්‍යාපෘතිය | 13 |
| කොළඹ සැහැල්ලු දුම්රිය ගමනාගමන ව්‍යාපෘතිය | 11 |
| **ජාත්‍යන්තර සංවර්ධන සංගමය** | **116** |
| එයින්; | |
| ජල සම්පාදනය සහ සනීපාරක්ෂාව වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 24 |
| දේශගුණික ප්‍රතිරෝධිතාව වැඩි දියුණු කිරීම කළමණාකරණය කිරීමේ ව්‍යාපෘතිය | 15 |
| කෘෂිකාර්මික අංශය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය | 11 |
| දේශගුණික ප්‍රතිරෝධීතාව වැඩිදියුණු කිරීම කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා අතිරේක මූල්‍යනය | 10 |
| **ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව** | **62** |
| එයින්; | |
| ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය | 25 |
| කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | 25 |
| **නෙදර්ලන්ත රබෝ බැංකුව (Robo Bank)** | **57** |
| එයින්; | |
| ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 36 |
| **කැල්යෝන් ක්‍රෙඩිට් ඇග්රිකෝල් (Calyon Credit Agricole)** | **48** |
| මහ මාතලේ ජල සැපයුම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | 34 |
| කැලණි දකුණ ඉවුර ජල සම්පාදන යෝජනා ක්‍රමය - 2 වන අදියර ක්‍රියාත්මක කිරීම | 14 |
| **ඩොයිෂ් බැංකුව** | **42** |
| එයින්; | |
| ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 38 |
| **චීන සංවර්ධන බැංකුව** | **40** |
| එයින්; | |
| ප්‍රමුඛතා මාර්ග වැඩිදියුණු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම 3 වන ව්‍යාපෘතිය - 2 වන අදියර | 20 |
| ප්‍රමුඛතා මාර්ග වැඩිදියුණු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම 3 වන ව්‍යාපෘතිය - 1 වන අදියර | 14 |

මූලයඃ මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

ඇතුළත් විය. 2019 වසරේ දී විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකමක ස්වරූපයෙන් වූ ලැබීමක් නොපැවතුණ අතර, 2018 වසරේ දී ගෙවූ එ.ජ. ඩොලර් මිලියන 613 හා සැසඳීමේ දී 2019 වසරේ දී රජය විසින් එ.ජ. ඩොලර් මිලියන 473ක විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් වගකීම් ආපසු ගෙවන ලදී.

**2019 වසරේ දී තැන්පතු භාරගන්නා ආයතන, පෞද්ගලික ආයතන සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් වෙත වූ විදේශීය ණය ශුද්ධ ගෙවීමක් වාර්තා කළ අතර, මහ බැංකුව වෙත වූ ණය ලැබීම් ඉහළ ගියේය.** බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වලින් සමන්විත තැන්පතු භාරගන්නා ආයතන වෙත වූ ශුද්ධ විදේශීය ණය, 2018 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 697ක ශුද්ධ ලැබීම් සමඟ සැසඳීමේ දී, 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 281ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. තවද, ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුමේ අනෙකුත් අංශ යටතේ වර්ගීකරණය කරන ලද, පෞද්ගලික ආයතන සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් විසින් 2019 වසර තුළ දී එ.ජ. ඩොලර් මිලියන 226ක ශුද්ධ විදේශීය ණය ගෙවීමක් වාර්තා කර ඇත. පෞද්ගලික ආයතන සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් වෙත වූ මුළු විදේශීය ණය ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 450ක් වූ අතර, වසර තුළ සියලුම ණය ලබා ගැනීම් සිදු වූයේ පෞද්ගලික අංශයෙනි. 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 676ක විදේශීය ණය ගෙවීම් අතුරින්, පෞද්ගලික ආයතනවල ණය ආපසු ගෙවීම් එ.ජ. ඩොලර් මිලියන 465ක් විය. මේ අතර, වසර තුළ ජා. මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ හයවන සහ හත්වන ණය වාරික ලැබීමත් සමඟ, මහ බැංකුව වෙත වූ විදේශීය ණය එ.ජ. ඩොලර් මිලියන 327ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.

## වෙළඳ ණය හා අත්තිකාරම් සහ අනෙකුත් ලැබිය යුතු/ ගෙවිය යුතු ගිණුම්

**2019 වසරේ දී නේවාසිකයන්ට ලැබුණු වෙළඳ ණය සහ අත්තිකාරම් මෙන්ම අනේවාසිකයන්ට ලබා දුන් වෙළඳ ණය සහ අත්තිකාරම් අඩු විය.** 2018 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 247කින් ඉහළ ගිය වෙළඳ ණය සහ අත්තිකාරම් ස්වරූපයෙන් වූ ශුද්ධ විදේශීය වගකීම් වෙනස්වීම්, 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 28කින් අඩු විය. මේ අතර, ශ්‍රී ලාංකික අපනයනකරුවන් විසින් ඔවුන්ගේ විදේශීය වෙළඳ හවුල්කරුවන් වෙත සහ

5

තැන්පතු භාරගන්නා ආයතන වෙත ලබා දුන් වෙළඳ ණය සහ අත්තිකාරම් නිරූපණය වන වෙළඳ ණය සහ අත්තිකාරම් තුළින් වූ ශුද්ධ මූල්‍ය වත්කම් අත් කර ගැනීම් 2018 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 177ක වැඩි වීම හා සැසඳීමේ දී 2019 වසරේ දී එ.ජ ඩොලර් මිලියන 4කින් පහළ ගියේය. තවද, ප්‍රධාන වශයෙන් මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම් ඇතුළත් අනෙකුත් ගෙවිය යුතු ගිණුම් 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 24ක සුළු වැඩි වීමක් වාර්තා කළ අතර, බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත වූ අනෙකුත් ලැබිය යුතු ගිණුම් එ.ජ ඩොලර් මිලියන 196ක ශුද්ධ වැඩි වීමක් වාර්තා කළේය.

### 5.7.4 විදේශීය සංචිත වත්කම්

**2019 වසර තුළ දී විදේශීය සංචිත වත්කම් හා සම්බන්ධ ගනුදෙනුවල ඉහළ යෑමක් වාර්තා විය.** සංචිත වත්කම් ගනුදෙනු 2018 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,002ක ශුද්ධ අඩු වීම හා සැසඳීමේ දී 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 337ක ශුද්ධ වැඩි වීමක් වාර්තා කළේය. වසර තුළ දී, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් සහ තැන්පතු එ.ජ. ඩොලර් මිලියන 361කින් වැඩි වූ අතර, විදේශීය ණය සුරැකුම්පත්වල ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරන ලද ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 19කින් අඩු විය. තවද, 2019 වසරේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය රත්‍රන් සංචිත එ.ජ. ඩොලර් මිලියන 14ක ශුද්ධ විකිණීමක් සිදු කිරීම හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සතු මූල්‍ය රත්‍රන් සංචිත ප්‍රමාණය අඩු විය.

## 5.8 සමස්ත ශේෂය

**ශුද්ධ ජාත්‍යන්තර සංචිතවල වෙනසට සමාන වන සමස්ත ශේෂය, 2018 වසරේ දී වාර්තා වූ හිඟයට සාපේක්ෂව 2019 වසරේ දී අතිරික්තයක් වාර්තා කළේය.** වසර තුළ දී, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවලින් වූ ලැබීම් ලෙස මූල්‍ය ගිණුම වෙත වූ සැලකිය යුතු ප්‍රමාණයක විදේශ විනිමය ලැබීම හේතුවෙන් ශුද්ධ ජාත්‍යන්තර සංචිත 2018 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 5,495ට සාපේක්ෂව 2019 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 5,871ක් දක්වා ඉහළ ගියේය. ඒ අනුව, 2018 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,103ක හිඟයක් වාර්තා කළ ගෙවුම් තුලනයේ සමස්ත ශේෂය 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 377ක අතිරික්තයක් වාර්තා කළේය.

## 5.9 අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

**අන්තර්ජාතික ආයෝජන තත්ත්වය සැලකීමේ දී, 2018 වසර අවසානයේ සිට 2019 වසර අවසානය වන විට ශ්‍රී ලංකාවේ විදේශීය වගකීම් තත්ත්වය මෙන්ම වත්කම් තත්ත්වය ද ඉහළ ගියේය.** අන්තර්ජාතික ආයෝජන තත්ත්වය මගින් ලෝකයේ සෙසු රටවල් සමග සිදු කෙරුණු ගනුදෙනුවලට අදාළව රටේ විදේශීය වත්කම් සහ වගකීම් තත්ත්වයේ වටිනාකම හා සංයුතිය වාර්තා කරනු ලැබේ. විදේශීය වත්කම්වල තත්ත්වය 2018 වසර අවසානය වන විට පැවති එ.ජ. ඩොලර් මිලියන 12,098 සිට 2019 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 12,985ක් දක්වා ඉහළ ගිය අතර, දළ නිල සංචිතවල ඉහළ යෑම ඒ සඳහා මූලික වශයෙන් හේතු විය. දළ නිල සංචිත 2018 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 6.9ට සාපේක්ෂව 2019 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 7.6ක් විය. විදේශවල ශ්‍රී ලංකා සමාගම් විසින් සිදු කරන ලද සමුච්චිත විදේශීය ආයෝජන පිළිබිඹු කෙරෙන ඍජු ආයෝජනවල වත්කම් තත්ත්වය ද වසර තුළ දී ඉහළ ගියේය. තැන්පතු භාරගන්නා ආයතනවල අනෙකුත් ලැබිය යුතු ගිණුම්වල වර්ධනයක් දක්නට ලැබුණු අතර, තැන්පතු භාරගන්නා ආයතනවල වෙළඳ ණය සහ අත්තිකාරම් සහ මුදල් හා තැන්පතු වත්කම්වල සුළු අඩු වීමක් වාර්තා විය. ශ්‍රී ලංකාවේ මුළු විදේශ වගකීම් තත්ත්වය ද 2018 වසර අවසානය වන විට පැවති එ.ජ. ඩොලර් මිලියන 61,390 හා සසඳන විට 2019 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 65,252ක් දක්වා එ.ජ. ඩොලර් මිලියන 3,862කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මෙම වැඩි වීම සඳහා ප්‍රධාන වශයෙන්, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවල නොපියවා ඉතිරිව ඇති වගකීම්වල ශුද්ධ වැඩිවීම හේතුවෙන් රජයේ නොපියවා ඉතිරිව ඇති විදේශීය වගකීම්වල ඉහළ යෑම, මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති විදේශීය වගකීම් තත්ත්වයේ ඉහළ යෑම සහ තැන්පතු භාරගන්නා ආයතනවල නොපියවා ඉතිරිව ඇති මුදල් හා තැන්පතු වගකීම් තත්ත්වය ඉහළ යෑම යනාදිය හේතු විය. කෙසේ වෙතත්, රජය, තැන්පතු භාරගන්නා ආයතන, පෞද්ගලික ආයතන සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් විසින් ලබාගත් විදේශීය ණයවල නොපියවා ඉතිරිව ඇති වගකීම් තත්ත්වය අඩු වී ඇත. ඒ අනුව, අනේවාසිකයන් සමග ශ්‍රී ලංකාවේ මුළු විදේශීය වත්කම් සහ විදේශීය වගකීම් තත්ත්වය අතර වෙනස වන ශ්‍රී ලංකාවේ ශුද්ධ ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය, 2018 වසර අවසානයේ පැවති එ.ජ. ඩොලර්

5

**5.11 සංඛ්‍යා සටහන**

**අන්තර්ජාතික ආයෝජන තත්ත්වය**

එ.ජ. ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)

| ශීර්ෂය | 2018 (අ) | | 2019 (ආ) | |
|---|---|---|---|---|
| | වත්කම් | වගකීම් | වත්කම් | වගකීම් |
| **සෘජු ආයෝජන (ඇ)** | **1,433** | **12,575** | **1,497** | **13,058** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | 1,414 | 8,166 | 1,466 | 8,280 |
| ණය උපකරණ | 19 | 4,410 | 31 | 4,778 |
| **විවිධ ආයෝජන** | **...** | **13,617** | **...** | **16,998** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | | 812 | | 1,056 |
| අනෙකුත් අංශ | | 812 | | 1,056 |
| ණය සුරැකුම්පත් (ඈ) | ... | 12,805 | ... | 15,942 |
| තැන්පතු භාරගන්නා ආයතන | ... | 249 | ... | - |
| දිගු කාලීන | ... | 249 | ... | - |
| රජය | | 12,385 | | 15,768 |
| කෙටි කාලීන | | 60 | | 119 |
| දිගු කාලීන | | 12,326 | | 15,649 |
| අනෙකුත් අංශ | | 171 | | 174 |
| දිගු කාලීන | | 171 | | 174 |
| **මූල්‍ය ව්‍යුත්පන්න** | - | - | - | - |
| **අනෙකුත් ආයෝජන** | **3,746** | **35,198** | **3,846** | **35,196** |
| **මුදල් සහ තැන්පතු** | **864** | **1,581** | **771** | **1,748** |
| මහ බැංකුව | | ... | | ... |
| කෙටි කාලීන | | ... | | ... |
| තැන්පතු භාරගන්නා ආයතන | 864 | 1,580 | 771 | 1,748 |
| කෙටි කාලීන | 357 | 1,580 | 363 | 1,748 |
| දිගු කාලීන | 507 | | 408 | |
| **ණය** | | **30,450** | | **30,288** |
| මහ බැංකුව | | 992 | | 1,315 |
| ජා.මූ. අරමුදලෙන් ලද ණය | | 992 | | 1,315 |
| තැන්පතු භාරගන්නා ආයතන | | 5,530 | | 5,249 |
| කෙටි කාලීන | | 3,772 | | 3,771 |
| දිගු කාලීන | | 1,758 | | 1,478 |
| රජය | | 19,626 | | 19,609 |
| දිගු කාලීන | | 19,626 | | 19,609 |
| අනෙකුත් අංශ (ඉ) | | 4,302 | | 4,116 |
| දිගු කාලීන | | 4,302 | | 4,116 |
| **වෙළඳ ණය සහ අත්තිකාරම්** | **1,182** | **2,184** | **1,178** | **2,156** |
| තැන්පතු භාරගන්නා ආයතන | 100 | | 92 | |
| කෙටි කාලීන | 100 | | 92 | |
| අනෙකුත් අංශ (ඊ) | 1,082 | 2,184 | 1,086 | 2,156 |
| කෙටි කාලීන | 1,082 | 2,184 | 1,086 | 2,156 |
| **අනෙකුත් ලැබිය යුතු/ගෙවිය යුතු ගිණුම්** | **1,700** | **432** | **1,896** | **456** |
| මහ බැංකුව (උ) | | 432 | | 456 |
| කෙටි කාලීන | | 432 | | 456 |
| තැන්පතු භාරගන්නා ආයතන | 1,700 | | 1,896 | |
| කෙටි කාලීන | 1,700 | | 1,896 | |
| **විශේෂ ගැනුම් හිමිකම්** | | **550** | | **547** |
| **සංචිත වත්කම්** | **6,919** | | **7,642** | |
| මූල්‍ය රත්‍රන් | 819 | | 955 | |
| විශේෂ ගැනුම් හිමිකම් | 1 | | 7 | |
| ජා.මූ. අරමුදලේ සංචිත මට්ටම | 67 | | 66 | |
| අනෙකුත් සංචිත වත්කම් | 6,032 | | 6,614 | |
| මුදල් සහ තැන්පතු | 2,026 | | 2,387 | |
| මූල්‍ය අධිකාරියේ හිමිකම් | 2,126 | | 1,952 | |
| අනෙකුත් ආයතනයන්හි හිමිකම් | -100 | | 435 | |
| සුරැකුම්පත් | 4,006 | | 4,227 | |
| ණය සුරැකුම්පත් | 4,006 | | 4,227 | |
| **මුළු වත්කම්/වගකීම්** | **12,098** | **61,390** | **12,985** | **65,252** |
| **ශුද්ධ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය** | | **-49,292** | | **-52,266** |
| **විශේෂිත අයිතමයන්** | | | | |
| පරිණත කාලය අනුව අන්තර්ජාතික ආයෝජන තත්ත්වය | 12,098 | 61,390 | 12,985 | 65,252 |
| කෙටි කාලීන | 6,151 | 8,841 | 6,846 | 9,306 |
| දිගු කාලීන | 5,947 | 52,548 | 6,139 | 55,946 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ආයෝජන මණ්ඩලයේ, කොළඹ කොටස් හුවමාරුවේ සහ අනෙකුත් පෞද්ගලික සමාගම්වල පැවති සෘජු ආයෝජනද ඇතුළත් වේ.
(ඈ) විදේශ විනිමය ණය නිකුතුව වෙළඳපොළ වටිනාකම මත පදනම් වන අතර දේශීය විනිමය ණය නිකුතුව පොත් අගය මත පදනම් වේ.
(ඉ) රජය සතු වාණිජ ව්‍යවසායයන් ලබාගත් ව්‍යාපෘති ණය සම්බන්ධයෙන් වූ නොපියවා ඉතිරිව ඇති ණය ඇතුළත් වේ.
(ඊ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ පෞද්ගලික සමාගම්වල නොපියවූ වෙළඳ ණය ඇතුළත් වේ.
(උ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම්වල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය.

මිලියන 49,292ක ශුද්ධ වගකීම් තත්ත්වයට සාපේක්ෂව 2019 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 52,266ක ඉහළ ශුද්ධ වගකීම් තත්ත්වයක් වාර්තා කළේය.

### 5.9.1 සෘජු ආයෝජන තත්ත්වය

**2019 වසරේ දී සෘජු ආයෝජන වත්කම් තත්ත්වය සහ සෘජු ආයෝජන වගකීම් තත්ත්වය ඉහළ ගියේය.** වසර තුළ දී වාර්තා වූ විදේශීය සෘජු ආයෝජන ලැබීම් සමඟ සෘජු ආයෝජන වගකීම් තත්ත්වය 2018 වසර අවසානය වන විට පැවති එ.ජ. ඩොලර් මිලියන 12,575ට සාපේක්ෂව 2019 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 13,058ක් දක්වා ඉහළ ගියේය. විදේශීය සෘජු ආයෝජන ප්‍රවාහ ශුද්ධ ධන අගයක් වාර්තා කළ ද, වසර තුළ දී වෙළඳපොළ මිල ගණන් කැපී පෙනෙන ලෙස අඩු වීමේ ප්‍රතිඵලයක් ලෙස කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත බොහෝ විදේශීය සෘජු ආයෝජන සමාගම් විසින් සැලකිය යුතු තක්සේරු අලාභ වාර්තා කරන ලදී. කෙසේ වෙතත්, කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත සමහර සමාගම්වල සහ ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි පෞද්ගලික සමාගම්වල ප්‍රතිආයෝජිත ඉපැයුම් සැලකිය යුතු වැඩි වීමක් වාර්තා කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වෙළඳපොළ මිලෙහි තක්සේරු අලාභවල බලපෑම මධ්‍යස්ථ විය. ආයෝජනවල ආසන්නතම රට අනුව සලකා බලන විට, 2019 වසර අවසන් වන විට ඉහළම විදේශීය සෘජු ආයෝජන වගකීම් තත්ත්වයන් සහිත ප්‍රධාන රටවල් පහ වූයේ චීනය, ඉන්දියාව, නෙදර්ලන්තය, සිංගප්පූරුව සහ මැලේසියාවයි. මේ අතර, ශ්‍රී ලාංකික පුරවැසියන් විසින් විදේශයන්හි සිදු කරන ලද විදේශීය සෘජු ආයෝජන ප්‍රමාණයෙහි සමස්ත වත්කම් තත්ත්වය 2019 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 1,497ක් වූ අතර, එය පෙර වසරට වඩා සියයට 4.5ක වර්ධනයකි.

### 5.9.2 විවිධ ආයෝජන තත්ත්වය

**2019 වසර අවසානයේ දී අන්තර්ජාතික ආයෝජන තත්ත්වයෙහි විවිධ ආයෝජන වගකීම් තත්ත්වය සැලකිය යුතු ලෙස වැඩි විය.** විවිධ ආයෝජන වගකීම් තත්ත්වය 2018 වසර අවසානයේ පැවති එ.ජ. ඩොලර් මිලියන 13,617ට සාපේක්ෂව 2019 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 16,998ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර දෙකක් කල්පිරීම, තැන්පතු භාරගන්නා ආයතන විසින්

නිකුත් කරන ලද ජාත්‍යන්තර බැඳුම්කරයක කල්පිරීම සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන ඉවත් කරගැනීම් හමුවේ වුවද, මුළු වටිනාකම එ.ජ. ඩොලර් බිලියන 4.4ක් වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර දෙකක් නිකුත් කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස වසර තුළ දී නොපියවා ඉතිරිව ඇති ණය සුරැකුම්පත් වගකීම් තත්ත්වය ඉහළ ගියේය. අනේවාසිකයන් සතුව ඇති භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල නොපියවා ඉතිරිව ඇති ප්‍රමාණය, 2019 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 525ක් විය. විදේශීය ආයෝජකයින් විසින් කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත සමාගම්වල සිදු කරන ලද සෘජු ආයෝජන නොවන හිමිකම් කොටස්වල ආයෝජන වගකීම්හි නොපියවා ඉතිරිව ඇති ප්‍රමාණය නිරූපණය කෙරෙන විවිධ ආයෝජන හිමිකම් කොටස් වගකීම් තත්ත්වය, 2018 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 812 සිට 2019 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 1,056ක් දක්වා ඉහළ ගිය අතර, ඒ සඳහා ජනාධිපතිවරණයෙන් පසු 2019 වසර අග වන විට කොළඹ කොටස් වෙළඳපොළෙහි සමහර සමාගම්වල කොටස්වල වෙළඳපොළ මිල ගණන්හි වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් නිකුත් කර නොපියවා තිබූ එ.ජ. ඩොලර් මිලියන 250ක ජාත්‍යන්තර බැඳුම්කරයේ කල්පිරීමත් සමඟ තැන්පතු භාරගන්නා ආයතනවල නොපියවා ඉතිරිව තිබූ ණය සුරැකුම්පත් වගකීම් තත්ත්වය වසර තුළ දී සම්පූර්ණයෙන් පියවන ලදී.

5

### 5.9.3 අනෙකුත් ආයෝජන තත්ත්වය

#### මුදල් සහ තැන්පතු

**2019 වසර අවසානය වන විට මුදල් සහ තැන්පතු වත්කම් තත්ත්වය අඩු වූ අතර, වගකීම් තත්ත්වය ඉහළ ගියේය.** ප්‍රධාන වශයෙන් බැංකු අංශයේ අනේවාසිකයන්ගේ තැන්පතු වගකීම් ඉහළ යෑම හේතුවෙන් මුදල් සහ තැන්පතු වගකීම් තත්ත්වය 2018 වසර අවසානය වන විට පැවති එ.ජ. ඩොලර් මිලියන 1,581 සිට 2019 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 1,748ක් දක්වා වැඩි විය. තැන්පතු භාරගන්නා ආයතනවල මුදල් සහ තැන්පතු වත්කම්වලින් මුළුමනින්ම සමන්විත වන මුදල් සහ තැන්පතු වත්කම් තත්ත්වය 2018 වසර අවසානය වන විට පැවති එ.ජ. ඩොලර් මිලියන 864 සිට 2019 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 771ක් දක්වා පහළ ගියේය.

#### විදේශීය ණය

**2019 වසර අවසානය වන විට විදේශීය ණය වගකීම් තත්ත්වය සුළු වශයෙන් අඩු විය.** ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශීය ණය වගකීම් තත්ත්වය වැඩි වුවද, රජයේ, තැන්පතු භාරගන්නා ආයතනවල, පෞද්ගලික අංශයේ ආයතනවල සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ විදේශීය ණය වගකීම් තත්ත්වය අඩු වීම හේතුවෙන් නොපියවා ඉතිරිව ඇති මුළු ණය වගකීම් ප්‍රමාණය අඩු විය. ඒ අනුව, විදේශීය ණය වගකීම් තත්ත්වය 2018 වසර අවසානයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 30,450 සමඟ සැසඳීමේ දී 2019 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 30,288ක් විය. 2019 වසරේ මැයි සහ නොවැම්බර් මාසවල දී ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි වාරික දෙකක් ලැබීමත් සමඟ ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශීය ණය වගකීම් තත්ත්වය ඉහළ ගියේය. සමහර ප්‍රධාන සමාගම් සහ ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම්වල විදේශීය ණය පහළ යෑම හේතුවෙන් පෞද්ගලික අංශයෙහි නොපියවා ඉතිරි වූ ණය වගකීම් තත්ත්වය සුළු වශයෙන් අඩු විය. වසර තුළ දී විදේශීය ව්‍යාපෘති ණය හා විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් අඛණ්ඩව ආපසු ගෙවීම හා රජය වෙත වූ ණය ලැබීම් අඩු වීම හේතුවෙන් රජයේ විදේශීය ණය වගකීම් තත්ත්වය සුළු වශයෙන් අඩු විය. දිගුකාලීන විදේශීය ණය අඩු වීමෙහි ප්‍රතිඵලයක් ලෙස තැන්පතු භාරගන්නා ආයතනවල විදේශීය ණය වගකීම් තත්ත්වය අඩු විය. තවද, 2019 වසර තුළ දී සිය ණය ආපසු ගෙවීම සහ නව විදේශීය ණය ලැබීම් නොමැති වීමේ ප්‍රතිඵලයක් ලෙස රජය සතු වාණිජ ව්‍යවසායයන්හි විදේශීය ණය වගකීම් තත්ත්වය ද පහළ ගියේය.

#### වෙළඳ ණය සහ අත්තිකාරම්

**2019 වසර අවසානය වන විට වෙළඳ ණය හා අත්තිකාරම් වගකීම් තත්ත්වය සහ වත්කම් තත්ත්වය පහළ ගියේය.** පෞද්ගලික අංශයේ සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ වෙළඳ ණය සහ අත්තිකාරම්වලින් සමන්විත වන නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණය සහ අත්තිකාරම් වගකීම් තත්ත්වය 2018 වසර අවසානයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 2,184 සිට 2019 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 2,156ක් දක්වා පහළ ගිය අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණය පහළ යෑම හේතු විය. මේ අතර, තැන්පතු භාරගන්නා ආයතන සහ පෞද්ගලික අංශය විසින් ලබා දුන් වෙළඳ ණය සහ අත්තිකාරම් පිළිබිඹු වන නොපියවා ඉතිරිව

ඇති වෙළඳ ණය සහ අත්තිකාරම් වත්කම් තත්ත්වය ද 2018 වසර අවසානය වන විට පැවති එ.ජ. ඩොලර් මිලියන 1,182 සිට 2019 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 1,178ක් දක්වා සුළු වශයෙන් අඩු විය.


### අනෙකුත් ලැබිය යුතු/ගෙවිය යුතු ගිණුම් සහ විශේෂ ගැනුම් හිමිකම්

**2019 වසරේ දී නොපියවා ඉතිරිව ඇති අනෙකුත් ලැබිය යුතු ගිණුම් තත්ත්වය සහ අනෙකුත් ගෙවිය යුතු ගිණුම් තත්ත්වය ඉහළ ගියේය.** තැන්පතු භාරගන්නා ආයතනවල නොපියවා ඉතිරිව ඇති අනෙකුත් ලැබිය යුතු ගිණුම් තත්ත්වය 2018 වසර අවසානය වන විට පැවති එ.ජ. ඩොලර් මිලියන 1,700ක සිට 2019 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 1,896ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ ආසියානු නිෂ්කාශන සංගමය හා සම්බන්ධ වගකීම් වැඩිවීමත් සමඟ නොපියවා ඉතිරිව ඇති අනෙකුත් ගෙවිය යුතු ගිණුම් තත්ත්වය 2019 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 456ක් දක්වා සුළු වශයෙන් වැඩි විය. තවද, 2019 වසර අවසානය වන විට විනිමය අනුපාතිකයේ සිදු වූ වෙනස්කම් හමුවේ විශේෂ ගැනුම් හිමිකම් වගකීම් තත්ත්වය එ.ජ. ඩොලර් මිලියන 547ක් දක්වා සුළු වශයෙන් අඩු විය.

### 5.9.4 විදේශීය සංචිත වත්කම් තත්ත්වය

**මූල්‍ය ගිණුම වෙත වූ ඉහළ ලැබීම් හේතුවෙන් ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත වත්කම් තත්ත්වය 2019 වසර අවසානය වන විට ඉහළ ගියේය.** දළ නිල සංචිත 2018 වසර අවසානය වන විට පැවති එ.ජ. ඩොලර් බිලියන 6.9 සිට 2019 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 7.6ක් දක්වා ඉහළ ගියේය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර දෙකක් ආපසු ගෙවීම සහ අනෙකුත් ණය සේවාකරණ වගකීම් හමුවේ වුවද, නව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතු දෙකක් තුළින් වූ ලැබීම්, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි වාරික දෙකක් ලැබීම සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් විදේශ විනිමය මිලදී ගැනීම, 2019 වසර අවසානය වන විට දළ නිල සංචිත තත්ත්වය ඉහළ නැංවීමට මූලික වශයෙන් දායක විය. මීට අමතරව, දළ නිල සංචිතවල ගුණාත්මකභාවය ඉහළ නංවමින් දේශීය බැංකු සමඟ පවත්වාගෙන ගිය එ.ජ. ඩොලර් මිලියන 366ක විදේශ විනිමය හුවමාරු ගිවිසුම් වසර තුළ දී පියවන ලදී. 2019 වසර අවසානය වන විට විදේශ විනිමය හුවමාරු ගිවිසුම් තත්ත්වය එ.ජ. ඩොලර් මිලියන 357ක් විය. 2019 වසර අවසානය වන විට රටෙහි පැවති දළ නිල සංචිත ප්‍රමාණය මාස 4.6ක ආනයන මූල්‍යනය කිරීමටත්, රටෙහි කෙටිකාලීන ණය සහ වගකීම්වලින් සියයට 56.1ක් ආවරණය කිරීමටත් තරම් වූ අතර, 2018 වසර අවසානයේ දී එය,

**5.12 රූප සටහන**
**කාර්තුමය දළ නිල සංචිත සහ මුළු විදේශීය වත්කම්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**5.12 සංඛ්‍යා සටහන**
**දළ නිල සංචිත, මුළු විදේශීය වත්කම් සහ සමස්ත ශේෂය**

(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)

| | එ.ජ. ඩොලර් මිලියන | | | | |
|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 | 2019 (අ) |
| 1. රජයේ විදේශීය වත්කම් | 470 | 289 | 488 | 817 | 386 |
| 2. මහ බැංකුවේ විදේශීය වත්කම් | 6,834 | 5,730 | 7,470 | 6,102 | 7,256 |
| 3. දළ නිල සංචිත වත්කම් (1+2) | 7,304 | 6,019 | 7,959 | 6,919 | 7,642 |
| 4. තැන්පතු භාරගන්නා ආයතනවල විදේශීය වත්කම් | 2,033 | 2,414 | 2,478 | 2,664 | 2,760 |
| 5. මුළු විදේශීය වත්කම් (3+4) (ආ) | 9,337 | 8,433 | 10,436 | 9,583 | 10,402 |
| 6. සංචිතවලට අදාළ වගකීම් (ඇ) | 2,275 | 1,490 | 1,361 | 1,425 | 1,771 |
| 7. ශුද්ධ ජාත්‍යන්තර සංචිත (3-6) | 5,029 | 4,529 | 6,597 | 5,495 | 5,871 |
| 8. සමස්ත ශේෂය (ඈ) | -1,489 | -500 | 2,068 | -1,103 | 377 |
| 9. දළ නිල සංචිත මගින් ආවරණය කළ හැකි ආනයනික මාස ගණන | | | | | |
| 9.1 වෙළඳ භාණ්ඩ | 4.6 | 3.8 | 4.6 | 3.7 | 4.6 |
| 9.2 වෙළඳ භාණ්ඩ හා සේවා | 3.8 | 3.1 | 3.8 | 3.1 | 3.7 |
| 10. මුළු විදේශීය වත්කම් මගින් ආවරණය කළ හැකි ආනයනික මාස ගණන | | | | | |
| 10.1 වෙළඳ භාණ්ඩ | 5.9 | 5.3 | 6.0 | 5.2 | 6.3 |
| 10.2 වෙළඳ භාණ්ඩ හා සේවා | 4.9 | 4.3 | 4.9 | 4.3 | 5.1 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) 'විදේශයන්හි සිදුකරන ලද සෘජු ආයෝජන' සහ 'ලබා දුන් වෙළඳ ණය සහ අත්තිකාරම්' යන විදේශීය වත්කම් ඇතුළත් නොවේ.
(ඇ) මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති ණය (විශේෂ ගැනුම් හිමිකම් හැර)
(ඈ) කාලපරිච්ඡේදය තුළ දී ශුද්ධ ජාත්‍යන්තර සංචිත තත්ත්වයේ වෙනස් වීම්

5

පිළිවෙළින්, මාස 3.7ක ආනයන මූල්‍යනය කිරීමටත්, සියයට 50ක කෙටිකාලීන ණය සහ වගකීම් ප්‍රමාණයක් ආවරණයටත් ප්‍රමාණවත් විය. මේ අතර, දළ නිල සංචිත සහ වාණිජ බැංකුවල විදේශීය වත්කම්වලින් සමන්විත වන මුළු විදේශීය වත්කම් ද 2018 වසර අවසානයේ දී පැවති එ.ජ. ඩොලර් බිලියන 9.6 සිට 2019 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 10.4ක් දක්වා ඉහළ ගියේය. එම මුළු විදේශීය වත්කම් ප්‍රමාණය මාස 6.3ක ආනයන මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් විය.

## 5.10 විදේශීය ණය සහ ණය සේවාකරණය

### 5.10.1 විදේශීය ණය

**ප්‍රධාන වශයෙන් රජයේ විදේශීය ණය ඉහළ යෑමත් සමඟ 2019 වසරේ දී ශ්‍රී ලංකාවේ මුළු විදේශීය ණය ඉහළ ගියේය.** 2019 වසර අවසානය වන විට රටෙහි මුළු විදේශීය ණය එ.ජ. ඩොලර් බිලියන 55.9ක් දක්වා එ.ජ. ඩොලර් බිලියන 3.5කින් ඉහළ ගියේය. වෙළඳපොළ වටිනාකම මත පදනම් වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වගකීම් තත්ත්වය 2018 වසර අවසානය වන විට පැවති එ.ජ. ඩොලර් බිලියන 11.6ට සාපේක්ෂව 2019 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 15.2ක් විය. මෙය, රජය විසින් වසර තුළ දී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතු දෙකක් තුළින් එ.ජ. ඩොලර් බිලියන 4.4ක් ලබා ගැනීමේ සහ එ.ජ. ඩොලර් බිලියන 1.5ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර දෙකක් පියවීමෙහි ශුද්ධ ප්‍රතිඵලයකි. කෙසේ වුවත්, වසර තුළ දී භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන සුළු වශයෙන් ඉහළ යෑමක් වාර්තා කළද, භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන ශුද්ධ ගෙවීමක් වාර්තා කිරීම හේතුවෙන් රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි නොපියවා ඉතිරිව ඇති අනේවාසික ආයෝජන ප්‍රමාණය පහළ ගියේය. 2019 වසරේ දී මුදා හරින ලද ණය ප්‍රමාණයට සාපේක්ෂව පෙර වසරවල දී ලබාගත් නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය වගකීම් ආපසු ගෙවීම් ඉහළ යෑම හේතුවෙන් රජයේ නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ණය සුළු වශයෙන් පහළ ගියේය. විදේශීය අංශයෙහි විශාලතම අවදානම පිළිබිඹු කරමින් රජයේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ඉහළ යෑමත් සමඟ ශ්‍රී ලංකාවේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය තත්ත්වය තවදුරටත් ඉහළ ගියේය.

**2019 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුවෙහි නොපියවා ඉතිරිව ඇති වගකීම් තත්ත්වය ඉහළ ගිය අතර, තැන්පතු භාරගන්නා ආයතනවල, පෞද්ගලික ආයතනවල සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ**

5.13 සංඛ්‍යා සටහන

නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය

එ.ජ. ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)


| ශීර්ෂය | 2018 (අ) | 2019 (ආ) |
|---|---|---|
| **රජය** | **32,011** | **35,377** |
| **කෙටි කාලීන** | **60** | **119** |
| ණය සුරැකුම්පත් | 60 | 119 |
| භාණ්ඩාගාර බිල්පත් (ඇ) | 60 | 119 |
| **දිගු කාලීන** | **31,952** | **35,258** |
| ණය සුරැකුම්පත් | 12,326 | 15,649 |
| භාණ්ඩාගාර බැඳුම්කර (ඇ) | 728 | 406 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (ඇ) | 4 | 5 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ඉ) | 11,594 | 15,238 |
| ණය | 19,626 | 19,609 |
| **මහ බැංකුව** | **1,975** | **2,318** |
| **කෙටි කාලීන** | **432** | **456** |
| අනෙකුත් ගෙවිය යුතු ගිණුම් | 432 | 456 |
| ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම් | 432 | 456 |
| **දිගු කාලීන** | **1,542** | **1,862** |
| විශේෂ ගැනුම් හිමිකම් වෙන් කිරීම් | 550 | 547 |
| ණය | 992 | 1,315 |
| ජා.මූ. අරමුදලේ ණය | 992 | 1,315 |
| විස්තීර්ණ ණය පහසුකම | 992 | 1,315 |
| **තැන්පතු භාරගන්නා ආයතන** | **7,359** | **6,997** |
| **කෙටි කාලීන** | **5,353** | **5,519** |
| මුදල් සහ තැන්පතු (ඊ) | 1,580 | 1,748 |
| වාණිජ බැංකු | 1,580 | 1,748 |
| ණය | 3,772 | 3,771 |
| වාණිජ බැංකු | 3,772 | 3,771 |
| **දිගු කාලීන** | **2,007** | **1,478** |
| ණය සුරැකුම්පත් (ඉ) | 249 | - |
| තැන්පතු භාරගන්නා අනෙකුත් ආයතන | 249 | - |
| ණය | 1,758 | 1,478 |
| වාණිජ බැංකු | 1,643 | 1,412 |
| තැන්පතු භාරගන්නා අනෙකුත් ආයතන | 115 | 66 |
| **අනෙකුත් අංශ (උ)** | **6,657** | **6,446** |
| **කෙටි කාලීන** | **2,184** | **2,156** |
| වෙළඳ ණය සහ අත්තිකාරම් (ඌ) | 2,184 | 2,156 |
| **දිගු කාලීන** | **4,472** | **4,290** |
| ණය සුරැකුම්පත් (ඉ) | 171 | 174 |
| ණය | 4,302 | 4,116 |
| පෞද්ගලික අංශය | 2,232 | 2,212 |
| රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ රාජ්‍ය සංස්ථා | 2,070 | 1,904 |
| **සෘජු ආයෝජන : අන්තර් සමාගම් ණය (එ)** | **4,410** | **4,778** |
| **දළ විදේශීය ණය තත්ත්වය** | **52,412** | **55,916** |
| **ද.දේ.නි. යේ ප්‍රතිශතයක් වශයෙන්** | | |
| දළ විදේශීය ණය | 59.2 | 66.6 |
| කෙටි කාලීන ණය | 9.1 | 9.8 |
| දිගු කාලීන ණය | 50.1 | 56.8 |
| **දළ විදේශීය ණයෙහි ප්‍රතිශතයක් වශයෙන්** | | |
| කෙටි කාලීන ණය | 15.3 | 14.8 |
| දිගු කාලීන ණය | 84.7 | 85.2 |
| **විශේෂිත අයිතමයන්** | | |
| **ණය සුරැකුම්පත්හි මුහුණත වටිනාකම - ආංශික වර්ගීකරණය** | **13,448** | **15,803** |
| රජය | 13,023 | 15,628 |
| භාණ්ඩාගාර බිල්පත් | 65 | 131 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 804 | 442 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 4 | 5 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 12,150 | 15,050 |
| මහ බැංකුව හැර තැන්පතු භාරගන්නා ආයතන | 250 | - |
| ලියාපදිංචි විශේෂිත බැංකු | 250 | - |
| අනෙකුත් අංශ | 175 | 175 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) පොත් අගය මත පදනම්ව
(ඈ) මුහුණත වටිනාකම මත පදනම්ව
(ඉ) වෙළඳපොළ මිල මත පදනම්ව
(ඊ) අනේවාසික විදේශ මුදල් හිමියන්ගේ තැන්පතු ඇතුළත් වේ.
(උ) පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් ඇතුළත් වේ.
(ඌ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ පෞද්ගලික අංශයේ සමාගම්හි නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණය ඇතුළත් වේ.
(එ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම්වල අන්තර් සමාගම් ණය සහ කොටස් හිමියන්ගේ අත්තිකාරම් ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**5.13 රූප සටහන**

**විදේශීය ණය**




මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

**නොපියවා ඉතිරිව ඇති ණය අඩු විය.** ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි වාරික දෙකක් ලැබීම සහ ආසියානු නිෂ්කාශන සංගමය සමග පවතින වගකීම්වල සුළු වැඩි වීමක් හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශීය වගකීම් තත්ත්වය ඉහළ ගියේය. මුදල් හා තැන්පතු වගකීම් ඉහළ ගිය ද, ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් කල් පිරුණු ජාත්‍යන්තර බැඳුම්කරයක් ආපසු ගෙවීම සහ වාණිජ බැංකුවල නොපියවූ විදේශීය ණය අඩු වීම හේතුවෙන් තැන්පතු භාරගන්නා ආයතනවල විදේශීය වගකීම් තත්ත්වය පහළ ගියේය. ලබා ගෙන ඇති විදේශීය ණය ආපසු ගෙවීම හේතුවෙන් පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය අඩු විය. තවද, වසර තුළ දී ප්‍රධාන සෘජු ආයෝජන ව්‍යාපාර කිහිපයක් වෙත ලැබුණු අන්තර් සමාගම් ණය සහ කොටස් හිමියන්ගේ අත්තිකාරම් හේතුවෙන් සෘජු ආයෝජන ව්‍යාපාර සතු වූ අන්තර් සමාගම් ණය ප්‍රමාණය ඉහළ ගියේය.

**ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස රටෙහි නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ණය ප්‍රමාණය වසර තුළ දී තවදුරටත් ඉහළ ගියේය.** 2019 වසර අවසානයේ දී නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ණය ප්‍රමාණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2018 වසර අවසානයේ පැවති සියයට 59.2ට සාපේක්ෂව සියයට 66.6ක් වූ අතර, 2019 වසරේ දී නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය කැපී පෙනෙන ලෙස ඉහළ යෑම සහ නාමික ද.දේ.නි.යෙහි වර්ධනය මන්දගාමී වීම මේ සඳහා හේතු විය. 2019 වසර අවසානයේ දී රජයේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය තත්ත්වය, මුළු විදේශීය ණය තත්ත්වයෙහි ප්‍රතිශතයක් ලෙස 2018 වසර අවසානයේ දී පැවති සියයට 61.1ට සාපේක්ෂව සියයට 63.3ක් විය. නාමික වශයෙන් මෙන්ම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ද සැලකූ විට ශ්‍රී ලංකාවේ විදේශීය ණය තත්ත්වය ඉහළ යෑම හමුවේ වුවද, ණය කල් පිරීමේ කාලය සම්බන්ධයෙන් හිතකර තත්ත්වයක් පිළිබිඹු කෙරෙන අතර දිගුකාලීන කල් පිරීම්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2018 වසර අවසානයේ දී පැවති සියයට 50.1 සිට 2019 වසර අවසානයේ දී සියයට 56.8ක් දක්වා ඉහළ ගියේය.

### 5.10.2 විදේශීය ණය සේවාකරණ ගෙවීම්

**ශ්‍රී ලංකාවේ විදේශීය ණය සඳහා වූ ණය වාරික සහ පොලී ගෙවීම් ඇතුළත් විදේශීය ණය සේවාකරණ ගෙවීම් 2019 වසරේ දී සුළු වශයෙන් අඩු විය.** 2019 වසරේ දී ණය වාරික ගෙවීම් 2018 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 4,188 සිට එ.ජ. ඩොලර් මිලියන 4,119ක් දක්වා සුළු වශයෙන් අඩු වූ අතර, එයින් එ.ජ. ඩොලර් මිලියන 3,176ක් රජයේ ණය වාරික ගෙවීම් විය. වසර තුළ දී, කල් පිරුණ එ.ජ. ඩොලර් බිලියන 1.5ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර දෙකක් නැවත ගෙවීම, රජයේ ණය ආපසු ගෙවීම් ඉහළ නැංවීම සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. රජය විසින් එ.ජ. ඩොලර් මිලියන 1,189ක විදේශ ණය සහ එ.ජ. ඩොලර් මිලියන 473ක විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම යටතේ වන වගකීම් ද පියවන ලදී. තවද, තැන්පතු භාරගන්නා ආයතන විසින් වසර තුළ දී, කල් පිරුණ එ.ජ. ඩොලර් මිලියන 250ක ජාත්‍යන්තර බැඳුම්කරයක් ආපසු ගෙවන ලදී. මේ අතර, 2019 වසරේ දී පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් විසින් සිදු කරන ලද විදේශීය ණය ආපසු ගෙවීම් 2018 වසරට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අඩු විය. වසර තුළ දී, පොලී ගෙවීම් 2018 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 1,678 සිට එ.ජ. ඩොලර් මිලියන 1,653ක් දක්වා සුළු වශයෙන් අඩු විය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල කූපන ගෙවීම් ස්වරූපයෙන් වූ පොලී ගෙවීම් ඉහළ ගිය අතර, රජය විසින් ලබා ගත් විදේශීය ණය සඳහා වූ පොලී ගෙවීම් සුළු වශයෙන් ඉහළ ගියේය. කෙසේ වුවත්, භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළ වෙතින් වූ ශුද්ධ ගෙවීම් හේතුවෙන් නොපියවා ඉතිරිව ඇති භාණ්ඩාගාර බැඳුම්කර තත්ත්වය අඩු වීමත් සමඟ වසර තුළ දී රජයේ භාණ්ඩාගාර බැඳුම්කර වෙත වූ විදේශීය ආයෝජන සඳහා පොලී ගෙවීම් අඩු විය. තවද, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල නොපියවා ඉතිරිව ඇති ප්‍රමාණය වැඩි වීමත් සමඟ රජය විසින් නිකුත් කළ ජාත්‍යන්තර බැඳුම්කර සඳහා ගෙවිය යුතු කූපන ගෙවීම් ඉහළ ගියේය. 2019 වසරේ දී වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ආදායම් පෙර වසරට සාපේක්ෂව සැලකිය

5

**5.14 සංඛ්‍යා සටහන**

**විදේශීය ණය සේවාකරණ ගෙවීම්**

| ශීර්ෂය | එ.ජ. ඩොලර් මිලියන | | | | | රුපියල් මිලියන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 (අ) | 2019 (ආ) | 2015 | 2016 | 2017 | 2018 (අ) | 2019 (ආ) |
| **1. ණය සේවාකරණ ගෙවීම්** | **4,772** | **4,461** | **4,566** | **5,866** | **5,773** | **648,541** | **648,315** | **695,690** | **954,937** | **1,038,911** |
| **1.1 ණය ආපසු ගෙවීම්** | **3,580** | **3,243** | **3,167** | **4,188** | **4,119** | **487,275** | **472,270** | **482,750** | **682,359** | **743,171** |
| රජය | 1,976 | 1,040 | 1,354 | 1,815 | 3,176 | 265,662 | 151,236 | 206,531 | 294,845 | 573,830 |
| ව්‍යාපෘති ණය | 798 | 876 | 1,320 | 1,771 | 1,662 | 107,536 | 127,396 | 201,430 | 287,381 | 295,992 |
| ණය සුරැකුම්පත් | 1,178 | 164 | 34 | 45 | 1,514 | 158,126 | 23,840 | 5,101 | 7,464 | 277,838 |
| මහ බැංකුව | 907 | 1,555 | 635 | - | - | 125,686 | 226,118 | 96,584 | - | - |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 507 | 455 | 235 | - | - | 68,775 | 65,956 | 35,601 | - | - |
| විනිමය හුවමාරු ගිවිසුම් සහ වෙනත් ණය වගකීම් | 400 | 1,100 | 400 | - | - | 56,911 | 160,162 | 60,983 | - | - |
| පෞද්ගලික අංශය සහ තැන්පතු භාර ගන්නා ආයතන | 698 | 648 | 1,178 | 1,943 | 926 | 95,928 | 94,916 | 179,635 | 314,024 | 166,281 |
| විදේශීය ණය | 553 | 559 | 559 | 593 | 676 | 76,199 | 81,944 | 85,242 | 96,640 | 121,737 |
| ණය සුරැකුම්පත් | - | - | 500 | 1,350 | 250 | - | - | 76,169 | 217,384 | 44,543 |
| සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි අන්තර් සමාගම් ණය | 145 | 88 | 119 | 430 | 17 | 19,729 | 12,972 | 18,225 | 73,490 | 3,061 |
| **1.2 පොලී ගෙවීම්** | **1,192** | **1,219** | **1,399** | **1,678** | **1,653** | **161,266** | **176,045** | **212,419** | **270,189** | **295,743** |
| රජය | 870 | 862 | 1,063 | 1,280 | 1,389 | 117,496 | 124,042 | 161,458 | 207,905 | 248,376 |
| ව්‍යාපෘති ණය | 266 | 264 | 332 | 425 | 430 | 36,024 | 38,440 | 50,652 | 68,847 | 76,754 |
| ණය සුරැකුම්පත් | 604 | 597 | 731 | 855 | 959 | 81,472 | 85,602 | 110,806 | 139,057 | 171,622 |
| මහ බැංකුව | 13 | 10 | 16 | 30 | 37 | 1,693 | 1,436 | 2,119 | 4,834 | 6,618 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 10 | 8 | 12 | 24 | 28 | 1,395 | 1,179 | 1,897 | 3,833 | 4,940 |
| විනිමය හුවමාරු ගිවිසුම් සහ වෙනත් ණය වගකීම් | 2 | 2 | 3 | 6 | 9 | 298 | 257 | 222 | 1,001 | 1,677 |
| පෞද්ගලික අංශය සහ තැන්පතු භාර ගන්නා ආයතන | 309 | 347 | 311 | 354 | 216 | 42,077 | 50,567 | 47,433 | 57,421 | 38,745 |
| විදේශීය ණය | 148 | 179 | 169 | 242 | 199 | 20,128 | 26,121 | 25,775 | 39,479 | 35,613 |
| ණය සුරැකුම්පත් | 159 | 159 | 142 | 112 | 18 | 21,779 | 23,186 | 21,658 | 17,943 | 3,131 |
| සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි අන්තර් සමාගම් ණය | 1 | 9 | 9 | 15 | 11 | 170 | 1,260 | 1,409 | 2,388 | 2,005 |
| **2. වෙළඳ භාණ්ඩ හා සේවාවන්ගේ අපනයන ඉපැයුම්** | **16,943** | **17,448** | **19,084** | **20,264** | **19,414** | | | | | |
| **3. වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ඉපැයුම්, ආදායම් හා ජංගම සංක්‍රාම** | **24,078** | **24,835** | **26,432** | **27,535** | **26,392** | | | | | |
| **4. ණය සේවාකරණ අනුපාතිකය** | | | | | | | | | | |
| 4.1 ඉහත 2 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| සමස්ත අනුපාතිකය | 28.2 | 25.6 | 23.9 | 28.9 | 29.7 | | | | | |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනුදෙනු හැර | 25.1 | 22.9 | 22.6 | 28.8 | 29.6 | | | | | |
| 4.2 ඉහත 3 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| සමස්ත අනුපාතිකය | 19.8 | 18.0 | 17.3 | 21.3 | 21.9 | | | | | |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනුදෙනු හැර | 17.7 | 16.1 | 16.3 | 21.2 | 21.8 | | | | | |
| **5. රජයේ ණය සේවාකරණ ගෙවීම්** | | | | | | | | | | |
| 5.1 රජයේ ණය සේවාකරණ ගෙවීම් (ඇ) | 2,846 | 1,901 | 2,417 | 3,095 | 4,565 | | | | | |
| 5.2 ඉහත 1 හි ප්‍රතිශතයක් වශයෙන් | 59.6 | 42.6 | 52.9 | 52.8 | 79.1 | | | | | |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ගනුදෙනු හැර

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

යුතු ලෙස අඩු වීම හේතුවෙන් 2019 වසරේ දී වෙළඳ භාණ්ඩ හා සේවා අපනයනයෙහි ප්‍රතිශතයක් ලෙස වූ මුළු විදේශීය ණය සේවාකරණ ගෙවීම් ප්‍රමාණය 2018 වසරේ දී වාර්තා වූ සියයට 28.9 සිට සියයට 29.7ක් දක්වා ඉහළ ගියේය. තවද, රටෙහි විදේශීය ණය ප්‍රමාණයෙන් විශාල කොටසක් රජයේ විදේශීය ණය වන බැවින් 2019 වසරේ දී රජයේ ණය සේවාකරණ ගෙවීම්, මුළු විදේශීය ණය සේවාකරණ ගෙවීම් ප්‍රමාණයෙන් සියයට 79ක් විය.

**ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර කල් පිරීම් සහ විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම්වල ණය වාරික ගෙවීම ඇතුළුව මැදිකාලීනව ඉහළ විදේශීය ණය සේවාකරණ වගකීම් ප්‍රමාණයක් පැවතීම රටෙහි විදේශීය ණය තිරසාරභාවයට විශාල අභියෝගයක් වී ඇත.** දිගින් දිගටම පවත්නා ඉහළ අයවැය හිඟයන් සහ විදේශීය ජංගම ගිණුමේ විශාල හිඟයන් මූල්‍යනය කිරීම සඳහා වැඩි වශයෙන් විදේශීය ණය මත රඳා පැවතීම හේතුවෙන් වාර්ෂික ණය සේවාකරණ ප්‍රමාණය ඉහළ යන අතර, එමගින් විදේශීය මූලාශ්‍ර වෙත යොමු වීමේ අවශ්‍යතාව අඛණ්ඩව ඉහළ යමින් පවතී. රජයේ විදේශීය ණය ගැනීම්වලින් වැඩි ප්‍රමාණයක් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම හරහා සිදුවීම සමඟ විදේශීය ණය ගැනීම්වල පිරිවැය ද ඉහළ ගොස් ඇත. එමෙන්ම, බාහිර කම්පනයන් සඳහා ඔරොත්තු දීමේ

ආරක්ෂණයක් වශයෙන් ක්‍රියා කරන සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ වන විශාල විචලනයන් කළමනාකරණය කර ගැනීමට රටට ඇති හැකියාව පිළිබිඹු කරන රටෙහි විදේශීය සංචිතවල ශුද්ධ අඩු වීමට විදේශීය ණය සේවාකරණ ගෙවීම්වල මෙම ඉහළ යෑම හේතු වේ. එබැවින්, විදේශීය ණය තිරසාර මට්ටමක පවත්වා ගැනීම සඳහා වන ප්‍රතිපත්ති හඳුන්වාදීම් මගින් දිගුකාලීනව ජංගම ගිණුමේ හිඟයෙහි සහ අයවැය හිඟයෙහි තිරසාරභාවය තහවුරු කිරීම පිළිබඳව අවධානය යොමු කළ යුතු වේ. එවැනි කල් පවත්නා ව්‍යුහාත්මක ගැටලු විසඳීම කෙටි කාලයක් තුළ සිදු කළ නොහැකි වුව ද, සියලු පාර්ශ්වකරුවන්ගේ සහය ඇතිව මෙම ගැටලු විසඳීමට කාලෝචිත හා ස්ථාවර මැදි කාලීන ප්‍රතිපත්තිමය රාමුවක් ක්‍රියාත්මක කිරීම ඉහළම ප්‍රමුඛතාවක් බවට පත් වී ඇත.

## 5.11 විනිමය අනුපාතිකයේ හැසිරීම

**2019 වසරේ දී ශ්‍රී ලංකා රුපියල, එ.ජ. ඩොලරයට සාපේක්ෂව සුළු වශයෙන් අතිප්‍රමාණය වෙමින් සමස්තයක් ලෙස ස්ථාවරව පැවතුණි.** ගෝලීය හා දේශීය ප්‍රවණතා හේතුවෙන් වරින් වර විචලනයන්ට ලක් වුව ද, 2018 වසරේ දී තියුණු ලෙස අවප්‍රමාණය වූ විනිමය අනුපාතිකය නැවත 2019 වසරේ දී නිවැරදි වීමක් පෙන්නුම් කළේය. වෙළඳ හිඟයෙහි සැලකිය යුතු අඩු වීම සහ මූල්‍ය ලැබීම් ඉහළ යෑම හේතුවෙන් 2019 වසරේ පළමු මාස හතර තුළ දී විනිමය අනුපාතිකය ශක්තිමත් වූ අතර, පාස්කු ඉරු දින ප්‍රහාර සිදු වීමට පෙර සියයට 4.6කින් අතිප්‍රමාණය විය. මෙම කාලපරිච්ඡේදය තුළ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ පැවති හිතකර ද්‍රවශීලතා තත්ත්වයන් ද හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට වෙළඳපොළ වෙතින් ශුද්ධ පදනම මත විදේශ විනිමය අවශෝෂණය කර ගැනීමට හැකි විය. කෙසේ වුවත්, පාස්කු ඉරු දින ප්‍රහාර සමඟ ගෝලීය වෙළඳපොළෙහි පැවති ඉහළ අවිනිශ්චිතතාවන්හි බලපෑම පිළිබිඹු කරමින් එහි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් යම් විදේශීය ආයෝජන ප්‍රමාණයක් ඉවත් කර ගැනීම හේතුවෙන් 2019 වසරේ අගෝස්තු මස අග භාගයේ දී විනිමය අනුපාතිකය මත යම් පීඩනයක් ඇති විය. කෙසේ වුවත්, එම සිදුවීම්වලින් අනතුරුව දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්වයන් වර්ධනය වූ අතර, එය විනිමය අනුපාතිකය ස්ථාවර වීම සඳහා දායක විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2019 වසර අවසානය වන විට රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 0.6ක අතිප්‍රමාණය වීමක් වාර්තා කළේය. මේ අතර, මහ බැංකුව විසින් 2018 වසරේ දී සිදු කරන ලද එ.ජ. ඩොලර් මිලියන 1,119.7ක ශුද්ධ

5

### 5.15 සංඛ්‍යා සටහන
### විනිමය අනුපාතික වෙනස්වීම්

| මුදල් වර්ගය | විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකට රුපියල් අගය | | | | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම (අ) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වර්ෂය අග අනුපාතිකය | | | වාර්ෂික සාමාන්‍යය අනුපාතිකය | | | වර්ෂය අග | | වාර්ෂික සාමාන්‍යය | |
| | 2017 | 2018 | 2019 | 2017 | 2018 | 2019 | 2018 | 2019 | 2018 | 2019 |
| යුරෝ | 182.49 | 208.99 | 203.67 | 171.73 | 191.71 | 200.14 | -12.68 | 2.62 | -10.42 | -4.21 |
| ඉන්දියානු රුපියල් | 2.39 | 2.61 | 2.55 | 2.34 | 2.38 | 2.54 | -8.72 | 2.61 | -1.47 | -6.40 |
| ජපන් යෙන් | 1.36 | 1.65 | 1.67 | 1.36 | 1.47 | 1.64 | -18.05 | -1.02 | -7.58 | -10.36 |
| බ්‍රිතාන්‍ය පවුම් | 205.54 | 231.86 | 238.46 | 196.47 | 216.67 | 228.20 | -11.35 | -2.77 | -9.32 | -5.05 |
| එක්සත් ජනපද ඩොලර් | 152.85 | 182.75 | 181.63 | 152.46 | 162.54 | 178.78 | -16.36 | 0.61 | -6.20 | -9.08 |
| විශේෂ ගැනුම් හිමිකම් | 217.69 | 253.51 | 251.17 | 211.49 | 229.90 | 246.97 | -14.13 | 0.93 | -8.00 | -6.91 |
| සඵල විනිමය අනුපාතික දර්ශක (ආ) (ඇ) | වර්ෂය අග දර්ශකය | | | වාර්ෂික සාමාන්‍යය දර්ශකය | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම | | | |
| | | | | | | | වර්ෂය අග දර්ශකය | | වාර්ෂික සාමාන්‍යය දර්ශකය | |
| (2017 = 100) | 2017 | 2018 | 2019 | 2017 | 2018 | 2019 | 2018 | 2019 | 2018 | 2019 |
| නා.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව | 97.17 | 85.81 | 86.74 | 100.00 | 94.05 | 88.18 | -11.69 | 1.09 | -5.95 | -6.24 |
| මූ.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව | 99.34 | 87.81 | 89.86 | 100.00 | 95.45 | 90.30 | -11.60 | 2.34 | -4.55 | -5.40 |

(අ) වෙනස්වීම ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාළ විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කර ගෙනය. සෘණ ලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය විදේශ ව්‍යවහාර මුදල් ඒකකයට සාපේක්ෂව අඩු වීම පෙන්නුම් කරයි.

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

(ආ) නාමික සඵල විනිමය අනුපාතිකය (නා.ස.වි.අ.) යනු වෙළඳ හවුල්කරුවන් සහ තරඟකාරී රටවල් 24 ක නාමික විනිමය අනුපාතිකයන්ගේ බර තැබූ සාමාන්‍යයයි. බර ප්‍රමාණය, මුදල් පැසට ඇතුළත් එක් එක් රට සමඟ සිදු කරන වෙළඳාමෙහි වැදගත්කම මත පදනම් වේ. මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) ගණනය කරනුයේ පැසට ඇතුළත් මුදල් වර්ග අයත් රටවල උද්ධමන වෙනස නා.ස.වි.අ.ට ගැලපීම මගිනි. සෘණ ලකුණින් දර්ශකය අවප්‍රමාණය වීම පෙන්වයි. මූ.ස.වි.අ. කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් කරගෙන ගණනය කර ඇත.

(ඇ) විනිමය අනුපාතික දර්ශකයන් අනුව අර්ථ දක්වා ඇති අතර, ඒ අනුව අනෙකුත් ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව රුපියලෙහි අගය වැඩිවීම හෝ අඩුවීම සඵල විනිමය අනුපාතිකයන්හි අගය ඉහළයාම හෝ පහළයාම මගින් පිළිවෙළින් පිළිබිඹු කෙරෙයි.

සැපයීමට සාපේක්ෂව 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 387.0ක ශුද්ධ විදේශ විනිමය අවශෝෂණය කිරීමක් සිදු කරන ලදී. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් රුපියල, ඉන්දියානු රුපියලට (සියයට 2.6කින්) සහ යූරෝ මුදල් ඒකකයට (සියයට 2.6කින්) සාපේක්ෂව අතිප්‍රමාණය වූ අතර, ස්ටර්ලිං පවුමට (සියයට 2.8කින්) සහ ජපන් යෙන්වලට (සියයට 1.0කින්) සාපේක්ෂව අවප්‍රමාණය විය.


**අනෙකුත් ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකක, එ.ජ ඩොලරයට සාපේක්ෂව මිශ්‍ර හැසිරීමක් පෙන්නුම් කළේය.** ඒ අනුව, 2019 වසර අවසානය වන විට එ.ජ. ඩොලරයට සාපේක්ෂව ඉන්දියානු රුපියල (සියයට 1.9කින්) සහ යූරෝ මුදල් ඒකකය (සියයට 1.9කින්) අවප්‍රමාණය වූ අතර, ස්ටර්ලිං පවුම (සියයට 3.5කින්) සහ ජපන් යෙන් (සියයට 1.6කින්) අතිප්‍රමාණය විය. ශ්‍රී ලංකා රුපියල අනෙකුත් ප්‍රධාන ව්‍යවහාර මුදල් රැසකට සාපේක්ෂව අතිප්‍රමාණය වීමේ සමස්ත ප්‍රතිඵලයක් ලෙස වසර තුළ දී විශේෂ ගැණුම් හිමිකම්වලට සාපේක්ෂව සියයට 0.9කින් අතිප්‍රමාණය විය.

**කොවිඩ්-19 වසංගතයක් ලෙස පැතිරීමත් සමඟ 2020 මාර්තු මස අග භාගයේ දී විනිමය අනුපාතිකය සැලකිය යුතු විචලනයකට ලක් විය.** 2020 මාර්තු මස දෙවන සතිය දක්වා විනිමය අනුපාතිකය සාපේක්ෂව ස්ථාවරව පැවති අතර, ඉන්පසුව අනෙකුත් නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් අත්විඳි පරිදි සැලකිය යුතු ලෙස අවප්‍රමාණය විය. ගෝලීය ආර්ථික හා මූල්‍ය වෙළඳපොළ තුළ ඇති වූ අවිනිශ්චිතතා හේතුවෙන් රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙන් සැලකිය යුතු ලෙස ගෙවීම් සිදු වූ අතර, සංචාරක ඉපැයීම්, අපනයන ආදායම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ කෙරෙහි ද බලපෑම් ඇති විය. වෙළඳපොළ සමපේක්ෂණ හැසිරීමත් සමඟ විනිමය අනුපාතිකය කෙරෙහි ඇති වූ පීඩනය තවත් උග්‍ර විය. මෙම ප්‍රවණතා හමුවේ, 2020 මාර්තු මාසයේ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ ඇති වූ පීඩනය වැළැක්වීම සඳහා රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තෝරාගත් මෝටර් රථ සහ ඇතැම් අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය කිරීම මාස තුනක කාලයක් සඳහා අත්හිටුවීම ඇතුළු කඩිනම් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කිහිපයක් හඳුන්වා දෙන ලදී. මූලික වෙළඳපොළ ප්‍රතිචාරයෙන් පසුව විනිමය අනුපාතිකයේ විචලනය අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරෙන නමුත්, 2020 වසරේ දී විනිමය අනුපාතිකයේ හැසිරීම් ඉදිරි කාලපරිච්ඡේදය තුළ තවදුරටත් වසංගතය පැතිරීම හා සම්බන්ධ ගෝලීය ප්‍රවණතා මත වෙනස් වනු ඇත.

### 5.11.1 නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතික

**2019 වසර තුළ දී මුදල් වර්ග 5කින් සැදුම්ලත් පැස මත සහ මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතික සහ මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක ඉහළ ගියේය.** විදේශ ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාතිකයන්ගේ හැසිරීම සමඟින් අනෙකුත් ප්‍රධාන ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි සිදු වූ නාමික අතිප්‍රමාණය වීම පිළිබිඹු කරමින් නාමික සඵල විනිමය අනුපාතික දර්ශක ඉහළ ගියේය. ඒ අනුව, 2019 වසර තුළ දී, මුදල් වර්ග 5කින් සහ මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතික දර්ශක,

5.14 රූප සටහන
විනිමය අනුපාතිකයේ වෙනස්වීම්





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

පිළිවෙළින්, සියයට 1.48කින් සහ සියයට 1.09කින් ඉහළ ගියේය. මේ අතර, ශ්‍රී ලංකාවේ විදේශීය තරගකාරිත්වය පිළිබිඹු කෙරෙන පරිදි නාමික විනිමය අනුපාතිකවල වෙනස් වීමට අමතරව මුදල් පැසෙහි ඇතුළත් රටවල උද්ධමන වෙනස ද සැලකිල්ලට ගනිමින් ගණනය කෙරෙන මුදල් වර්ග 5කින් සහ මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක, පිළිවෙළින්, සියයට 2.22කින් සහ සියයට 2.34කින් ඉහළ ගියේය. කෙසේ වුවද, රටෙහි වෙළඳ තරගකාරිත්වයට සහය වෙමින් මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක පදනම් වර්ෂයේ සීමාවට වඩා අඩු අගයක පැවැතුණි.

### 5.11.2 දේශීය විදේශ විනිමය වෙළඳපොළ වර්ධනයන්

**2019 වසරේ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ සිදු වූ ගනුදෙනු ප්‍රමාණය තවදුරටත් ඉහළ ගියේය.** ඒ අනුව, වසර තුළ දී, දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ සිදු වූ මුළු ගනුදෙනු ප්‍රමාණය, 2018 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 17,402 සිට එ.ජ. ඩොලර් මිලියන 19,377ක් දක්වා සැලකිය යුතු ලෙස වැඩි විය. 2019 වසරේ දී එතැන් වෙළඳපොළ මුළු ගනුදෙනු ප්‍රමාණය 2018 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 10,770 සිට එ.ජ. ඩොලර් මිලියන 11,643ක් (මුළු ගනුදෙනු ප්‍රමාණයෙන් සියයට 60.1ක්) දක්වා ඉහළ ගියේය. තවද, 2019 වසරේ දී ඉදිරි වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය 2018 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 6,632 සිට එ.ජ. ඩොලර් මිලියන 7,734ක් දක්වා ඉහළ ගියේය. 2019 වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් වීම මගින් ශුද්ධ පදනම මත එ.ජ. ඩොලර් මිලියන 387ක් අවශෝෂණය කර ගන්නා ලදී. මෙය, එ.ජ. ඩොලර් මිලියන 207ක විදේශ විනිමය සැපයීමකින් සහ එ.ජ. ඩොලර් මිලියන 594ක අවශෝෂණය කර ගැනීමකින් සමන්විත විය. මෙය 2018 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එ.ජ. ඩොලර් මිලියන 1,677ක විදේශ විනිමය ද්‍රවශීලතාවක් සැපයීම හා එ.ජ. ඩොලර් මිලියන 557ක් අවශෝෂණය කර ගැනීමට වඩා ප්‍රතිවිරුද්ධ තත්ත්වයක් විය. ආනයනවල සිදු වූ කැපී පෙනෙන අඩු වීම සමඟ වෙළඳපොළ වෙතින් වූ ගෙවීම් අඩු මට්ටමක පැවතීම, 2019 වසරේ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළින් වූ මෙම ශුද්ධ අවශෝෂණය සඳහා මූලිකවම හේතු විය. පාස්කු ඉරු දින ප්‍රහාර හේතුවෙන් ඇති වූ විචලනයන් සහ රජයේ සුරැකුම්පත් වෙළඳපොළ තුළින් විදේශීය ආයෝජන ඉවත් කර ගැනීම මධ්‍යයේ වුවද, 2019 වසරේ දී ශුද්ධ පදනම මත විදේශ විනිමය අවශෝෂණය කර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකි වූයේ මෙම තත්ත්වයන් මගිනි. මේ අතර, විනිමය අනුපාතිකය තුළින් අඛණ්ඩවම වෙළඳපොළ බලවේගයන්හි හැසිරීම පිළිබිඹු කිරීමට මහ බැංකුව විසින් ඉඩ ලබා දුන් අතර, ශ්‍රී ලංකා රුපියලෙහි තියුණු විචලනයන් වැළැක්වීම සඳහා පමණක් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් වීම් සිදු කරන ලදී. කෙසේ වෙතත්, කොවිඩ්-19 වසංගතය පැතිරී යෑම හමුවේ වෙළඳපොළ තුළ ඇති වූ විචලනය හේතුවෙන් 2020 මාර්තු මස අග භාගයේ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදිහත්වීම අවශ්‍ය විය.

**5.15 රූප සටහන**
**කාර්තුමය අන්තර් බැංකු ඉදිරි විනිමය ගනුදෙනු පරිමාවන්**




මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

## 5.12 විදේශීය අංශයේ ඉදිරි දැක්ම

**2020 වසරේ විදේශීය අංශයේ ඉදිරි දැක්ම, කොවිඩ්-19 වසංගතයෙහි ගෝලීය බලපෑම සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ගෝලීය ආර්ථික සහ වෙළඳපොළ ප්‍රවණතා මත විශාල වශයෙන් රඳා පවතිනු ඇත.** කොවිඩ්-19 වසංගතයෙහි ප්‍රතිඵලයක් ලෙස, 2020 වසරේ දී ජංගම ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස පුළුල් වීමට ඉඩ ඇත. ගෝලීය බොරතෙල් මිල අනපේක්ෂිත පරිදි පහත වැටීම, අපනයනාභිමුඛ කර්මාන්ත සඳහා වන ආනයන ඉල්ලුම පහත වැටීම, ආයෝජන භාණ්ඩ ආනයන යම් පමණකට අඩු විය හැකි වීම සහ හඳුන්වා දුන් ප්‍රතිපත්ති තුළින් තෝරාගත් වාහන හා අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා වීම හේතුවෙන් ආනයන වියදම අඩු වනු ඇතැයි අපේක්ෂා කළ ද, ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන සඳහා වන ගෝලීය ඉල්ලුමට සැලකිය යුතු බලපෑමක් ඇති වීමෙන් වෙළඳ හිඟය පුළුල් වීමට ඉඩ ඇත. ගෝලීය වශයෙන් විදේශ ගමන් හා සංචාරක කර්මාන්තය පෙර නොවූ විරූ ලෙස

මන්දගාමී වීම හේතුවෙන් සංචාරක කර්මාන්තයට දැඩි බලපෑමක් ඇති කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. සංචාරක කර්මාන්තයට සිදු වන සමස්ත බලපෑම රඳා පවතිනුයේ 2020 වසරේ අග භාගයේ දී ශ්‍රී ලංකාවට උපරිම වශයෙන් සංචාරකයන් පැමිණෙන කාලසීමාවට පෙර ගෝලීය විදේශ ගමන් යථා තත්ත්වයට පත්වීම මතය. ගෝලීය වශයෙන් විදේශ ගමන් අඩු වීමත් සමග ගුවන් මගී ප්‍රවාහන සේවාවන්ට ද බලපෑමක් ඇති වනු ඇති අතර, සැපයුම් දාම බිඳ වැටීම් හා භාණ්ඩ වෙළඳාම අඩු වීම සමග භාණ්ඩ ප්‍රවාහන සේවාවන් ද අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, සංචාරක හා ප්‍රවාහන සේවා සම්බන්ධ ගෙවීම් ද මධ්‍යස්ථ විය හැකි අතර, මෙමගින් සේවා ගිණුමේ අපේක්ෂිත අඩු වීම යම්කිසි ප්‍රමාණයකින් සීමා විය හැකිය. කොවිඩ්-19 වසංගතය ශ්‍රී ලංකාවේ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා ප්‍රධාන මූලාශ්‍ර වන ඉතාලිය, දකුණු කොරියාව සහ මැද පෙරදිග වැනි රටවල් කිහිපයකට ද බලපෑම් ඇති කළේය. මෙය 2020 වසරේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ යම් ප්‍රමාණයකින් අඩු වීම කෙරෙහි හේතු වීමට ඉඩ ඇත. සමස්තයක් වශයෙන්, ජංගම ගිණුමේ හිඟය 2020 වසරේ දී සැලකිය යුතු ලෙස පුළුල් වීමට ඉඩ ඇති නමුත්, එය කොතෙක් දුරට සිදුවේද යන්න වසංගතය පැතිර යන කාලසීමාව සහ ශ්‍රී ලංකාව තුළ මෙන්ම ගෝලීය වශයෙන් ද ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් අනුගමනය කරන ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මත රඳා පවතිනු ඇත.

**2020 වසරේ දී මූල්‍ය ගිණුම කෙරෙහි ද කොවිඩ්-19 වසංගතයෙන් බලපෑම් ඇතිවීමට ඉඩ ඇත.** ගෝලීය මූල්‍ය වෙළඳපොළ හැසිරීම සහ ආයෝජක විශ්වාසයෙහි වෙනස්වීම් හේතුවෙන් විදේශීය සෘජු ආයෝජන සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙත වන විදේශීය ආයෝජන ස්වරූපයෙන් ගලා එන හිමිකම් ප්‍රවාහ අඩු වීමට ඉඩකඩ ඇත. කෙසේ වෙතත්, විශේෂයෙන්ම චීනයේ ආර්ථික කටයුතු යහපත් වීම හේතුවෙන් කොළඹ වරාය නගරය සහ හම්බන්තොට කාර්මික කලාපය යන ව්‍යාපෘතිවලට ආයෝජන නැවත ගලා ඒම යථා තත්ත්වයට පත් වීමට ඉඩ ඇත. විශේෂයෙන්ම, මහ මැතිවරණයෙන් පසුව අපේක්ෂිත දේශපාලන ස්ථාවරභාවය සමග 2020 වසරේ දෙවන භාගයේ දී විදේශීය සෘජු ආයෝජන ක්‍රමයෙන් ඉහළ යෑමට ඉඩ ඇත. අයවැය හිඟය පුළුල් වීම සහ විදේශීය ණය සේවාකරණ ගෙවීම් මූල්‍යනය කිරීම සඳහා 2020 වසරේ දෙවන භාගයේ දී රජය විසින් විදේශ මූලාශ්‍ර වෙතින් ණය ලබා ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**2020 වසරේ දී හා මැදි කාලීනව පියවිය යුතු විදේශීය ණය වාරික සහ පොලී ඉහළ මට්ටමක පැවතීම අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණක් ලෙස ඉදිරියටත් පවතී.** කල් පිරෙන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් හා සම්බන්ධ වාරික ආපසු ගෙවීම් ඇතුළු විදේශීය ණය සේවාකරණ ගෙවීම් 2020 වසරේ දී සහ ඉන් ඔබ්බට සාමාන්‍යයෙන් වසරකට එ.ජ. ඩොලර් බිලියන 5ක් පමණ වේ. ගෝලීය මූල්‍ය වෙළඳපොළ අවිනිශ්චිතතා සහ ආයෝජකයන් සුරක්ෂිත වත්කම් සඳහා ඇති කැමැත්ත මත කෙටි කාලීනව ශ්‍රී ලංකාවට ඉහළ ප්‍රතිමූල්‍යකරණ අවදානමකට මුහුණ දීමට සිදු වනු ඇත. මෙම වාතාවරණය යටතේ, නිල සංචිත අඩු වීමකට ලක් නොවන පරිදි අඩුම ප්‍රතිමූල්‍යකරණ පිරිවැයක් යටතේ 2020 වසරේ ණය සේවාකරණ අවශ්‍යතා සපුරා ගැනීම ප්‍රධාන අභියෝගයක් ව පවතී. තවද, විදේශීය ණය ගෙවීම් කළමනාකරණය කළ හැකි මට්ටමක පවත්වා ගැනීම සහ රටෙහි විදේශීය ණය තිරසාර මට්ටමක පවත්වා ගැනීම සඳහා ජංගම ගිණුමේ හිඟය තිරසාර මට්ටමක පවත්වා ගන්නා අතරතුර මැදි කාලීනව සෘජු ආයෝජන වැනි ණය නොවන මූල්‍ය ප්‍රවාහ වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීම ඉතා වැදගත් වේ.